| 67. ඩී. ඩබ්. කරුණානායක මහතා | මාර. විහාරහේන වි. |
| 68. ජී. එම්. ගුණසේකර මහතා | කු. කට්ටිමහන ම. වි. |
| 69. එම්. ඒ. ප්‍රේමරත්න මහතා | පී. දිවුල්වැව වි. |
| 70. එස්. ලියනගමගේ මහතා | බ. යහලබැද්ද වි. |
| 71. එන්. එච්. එන්. පී. නරසිංහ මහතා | කු. හිඳගහවැව වි. |
| 72. එම්. චන්ද්‍රානන්ද හිමි | කොළ. ඉහලබියන්විල ම. වි. |
| 73. ටී. ආර්. පී. ඒ. තෙන්නකෝන් මහතා | කෑ. බොස්සැල්ල ම. වි. |
| 74. එම්. එල්. එම්. මාකීන් මහතා | අ. කඩවත්රත්මල් මුස්ලිම් වි. |
| 75. ඊ. දන්ගම්පොල මහතා | මා. දොඩම්දෙනිය වි. |
| 76. කේ. පඤ්ඤානන්ද හිමි | යා. යාපනය සිංහල ම. වි. |
| 77. එම්. එස්. ජේ. ආර්. පොන්සේකා මහතා | නු. අගාරපතන වි. |
| 78. එල්. ආරියවංශ මහතා | කො. කලුබෝවිල ම. වි. |
| 79. ඩී. හේනාධීර මහතා | බ. අඹගස්දෝව වි. |

අංක 71 සහ 78 යටතේ නම් සඳහන් ගුරුවරුන් "දේශපාලන කටයුතුවලට සහභාගිවීය" යන චෝදනාව උඩ වැඩ තහනම් කරන ලදී. එහෙත් ඔවුනට විරුද්ධව ඉදිරිපත්වුණු වෙනත් චෝදනා උඩ ඔවුන් සේවයෙන් පහකර ඇත.

**(ஊ) ஆம் விடையில் குறிப்பிட்டுள்ள ஆசிரியர்களின் அட்டவணை**

| | | |
|---|---|---|
| 1. திரு. ரி. குணத்திலக்க | .. | .. அம். உகன ம. வி. |
| 2. திரு. எல். டபிள்யு. ஜயரட்ண | .. | .. அம். உகன ம. வி. |
| 3. திரு. ரி. விமலசிறி | .. | .. அம். உகன ம. வி. |
| 4. திரு. என். ஏ. குணதாச | .. | .. அம். உகன ம. வி. |
| 5. திரு. வி. எச். எச். ஐ. ஸ்ரீப்பென் | | .. கு. அதமுன வி. |
| 6. திரு. டி. எஸ். ஏ. இந்திரபால | .. | .. கொ.வ. களனி வி. |
| 7. திரு. ஜி. விஜெயதுங்க | .. | .. கே. கபல சிறி சங்கபெ. வி. |
| 8. வண. கே. சந்தஜோதி | .. | .. கொ. ஸ்ரேயல் கல்லூரி |
| 9. திரு. எம். டி. மித்திரசேன | .. | .. தி. திருகோணமலை சிங்கள ம. வி. |
| 10. திரு. பியதாச நிசங்க | .. | .. அ. நொச்சியாகம ம. வி. |
| 11. திரு. ஜி. எஸ். பி. ஜயதிலக்க | .. | .. க. அம்பலபிற்றிய வி. |
| 12. திரு. ஏ. எச். எஸ். வதிகமங்கவ | | .. பது. பண்டாரவளை தர்மபால ம. வி. |
| 13. திரு. ஜே. குலரட்ண | .. | .. களு. மில்லெனிய வி. |
| 14. திரு. கே. கே. இரட்ணதாச | .. | .. மா. றகுல கல்லூரி |
| 15. திரு. எம். கே. பீறிஸ் | .. | .. பது. பசர ஆரம்ப வி. |
| 16. திரு. ஆர். சிவலிங்கம் | .. | .. க. கைல்ன்ஸ் கல்லூரி |
| 17. திரு. டி. பீற்றர் சில்வா | .. | .. களு. மகல்கந்த வி. |
| 18. திருமதி டபிள்யு. ஐ. பர்ஞந்து | .. | .. களு. மகல்கந்த வி. |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| | | |
|---|---|---|
| 19. | திரு. எம். ஏ. பியபிரேமா | சி. திம்பிறிகஸ்வல வி. |
| 20. | திரு. டி. எஸ். கன்னங்கரா | களு. தொடம்பபிற்றிய வி. |
| 21. | திரு. பி. டபிள்யு. சிறிவாடன | கே. பட்டுவித்த ம. வி. |
| 22. | ஜனுப் எம். எச். அகமத் சஒட் | கொ. பல்மாட் அர்ச். மெ. த. க. வி. |
| 23. | திரு. டி. எம். விக்கிரமஆராச்சி | கொ. தம்பொர வி. |
| 24. | திரு. ஆர். எம். டி. சிறிசேன | கே. தொலங்கமுவ ம. ம. வி. |
| 25. | திரு. ஆர். எம். சுமணசேன | பது. மில்லபெத்த வி. |
| 26. | திரு. பி. எஸ். பெரேரா | கு. அவுலகம ம. வி. |
| 27. | திரு. ஏ. எச். கருணரட்ண | க. கொணகலகல |
| 28. | திரு. டி. வி. டி. வீரசேகர | பது. யாப்பவ்வ வி. |
| 29. | திரு. ஏ. கொறலகம | கே. தெலிவல ம. வி. |
| 30. | திரு. எச். டி. எம். கருணரட்ண | களு. கிராண வி. |
| 31. | திரு. டி. கே. எம். சில்வா | மா. ககசல வி. |
| 32. | திரு. ஆர். வி. குணதாச | மொ. கல்லொப வி. |
| 33. | திரு. கே. எல். வி. பெரேரா | கொ. வ/கட்டான மெ. வி. |
| 34. | வண. ஏ. நந்தசிறி | களு. ப்ள்ளியகொட வடக்கு ம. வி. |
| 35. | திரு. ரி. எல். சி. பீரிஸ் | கொ. எகொடஉயன ம. வி. |
| 36. | திரு. ஜி. ஏ. திசனுயக்க | மொ. மொறட்டுவ, வி. |
| 37. | திரு. எட்வின் குணபொல | கு. அக்கரபனக வி. |
| 38. | திரு. எட்வின் ஜயசூரிய | அம். தங்கல தீபங்கார ஆரம்ப வி. |
| 39. | திரு. டி. எஸ். ஏ. குமாரசிறி | கு. வன்னிகுடவேவ வி. |
| 40. | திரு. ஜி. பி. ஆரியரட்ண | ளுக. களுத்தர ம. வி. |
| 41. | திரு. பி. எச். பியசேன | களு. அகலவத்த ம. வி. |
| 42. | திரு. எஸ். எம். ஜயசீல | பது. மகுலல்ல வி. |
| 43. | திரு. எல். பி. வெனுதாச | கு. இங்கரதவுல வி. |
| 44. | வண. வை. சிறினிவாச | கு. உகுமிறிய ம. வி. |
| 45. | திரு. டபிள்யு. ரி. ஒபயசேகர | பது. கொறதியகும்புர வி. |
| 46. | திரு. எஸ். அசோக்க சுரவீர | மொ. கலவெலறகம வி. |
| 47. | திரு. எம். அமரதாச | கொ. வெனிவெல்கொல வி. |
| 48. | திரு. ரி. ஏ. முதியாசே | கே. அர்ச். மேரிஸ் கல்லூரி |
| 49. | திரு. ஈ. மனிஸ் சிங்கோ | அ. புவியங்குலம வி. |
| 50. | திரு. ஜே. எம். ஜி. ஜயமான்ன | அ. மெதவேவ வி. |
| 51. | திரு. எச். வீரசிங்க | கு. விலகெதர வி. |
| 52. | திரு. எல். பி. கொடிநிலமே | கு. அனுக்கான வி. |
| 53. | திரு. எஸ். எம். குணத்திலக்க | மொ. கல்லொப-பதல்கும்புர வி. |
| 54. | வண. டி. இரட்ணசார | கொ. கலகிறியாவ ம. ம. வி. |
| 55. | திரு. யு. ஏ. றணசிங்க | மொ. ககரவிற்ற வி. |
| 56. | திரு. கே. எச். கொடித்துவக்கு | மா. வத்தகெதர வி. |
| 57. | திரு. எல். அமரதாச | கே. புவக்தெனிய வி. |
| 58. | திரு. ஜி. எல். எஸ். பி. பெரேரா | கொ. மொறத்துமுல்ல மெ. உயர்தர பாட. |
| 59. | திரு. பி. ஆர். சமரசிங்க | அ. எத்தம்பகஸ்கட வி. |
| 60. | திரு. டபிள்யு. பி. தாமெல் | கொ. வெள்ளவத்த அர்துசா கல்லூரி |
| 61. | திரு. ஆர். டபிள்யு. டி. ருஜபக்ஸ | மா. டெமற்றபிற்றிய மா. வி. |
| 62. | திரு. டபிள்யு. எம். விக்கிரமசிங்க | கு. உடபத்தலவ ம. வி. |
| 63. | திரு. ஆர். டபிள்யு. லியனகே | களு. டியகடுவ வி. |
| 64. | திரு. டி. எச். கருணனுயக்க | கு. நமுனுவ வி. |
| 65. | திரு. சோமபால ருஜபக்ச | க. கல்கின்ன முஸ்லிம் |
| 66. | கீத்சிறி சென்ரட்ண | கா. ஹல வி. |
| 67. | திரு. டி. டபிள்யு. கருணுயகக | மா. விகாரகேன வி. |
| 68. | திரு. ஜி. எம். குணசேகர | கு. கத்திமகான ம. வி. |
| 69. | திரு. எம். ஏ. பிரேமரட்ண | பு. திவுல்வேவ வி. |
| 70. | திரு. எஸ். லியனகமகே | பது. யகலபெத்த வி. |
| 71. | திரு. என். எச். எம். பி. நாரசிங்க | கு. இந்தககவேவவி. |
| 72. | வண. எம். சந்தானந்த | கெ. வ. இகலபியன்வில ம. வி. |
| 73. | திரு. ரி. ஆர். பி. ஏ. தென்னக்கோன் | கே. பொசெல்ல ம. வி. |
| 74. | ஜனுப் எம். எல். எம். மக்கீன் | அ. கடவத்ரத்மலே முஸ்லிம் வி. |
| 75. | திரு. ஈ. தங்கம்பொல | மா. தொடம்தெனிய வி. |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| | | |
|---|---|---|
| 76. வண. கே. பன்ஞனந்த | .. | .. யா. யாழ்ப்பாணம் சிங்கள ம. வி. |
| 77. திரு. எம். எஸ். ஜே. ஆர். பொன்சேக்கா | .. | நு. அகரபத்தான வி. |
| 78. திரு. எல். ஆரியவன்ச | .. | .. கொ. களுபோவில ம. வி. |
| 79. திரு. டி. ஹேணதீர | .. | .. பது. அம்பகஸ்துவ வி |

71 ஆம், 78 ஆம் இலக்கங்களுக்கெதிரே காணப்படும் ஆசிரியர்கள் அரசியல் முயற்சிகளில் பங்குபற்றியதற்காக கடமையிலிருந்து இடைநிறுத்தம் செய்யப்பட்டனர். எனினும், அவர்கள் மீது சுமத்தப்பட்ட ஏனைய குற்றச் சாட்டுகளின் பெயரில் சேவையிலிருந்து விலக்கப்பட்டனர்.

LIST OF TEACHERS REFERRED TO IN REPLY (*f*)

| | |
|---|---|
| 1. Mr. T. Gunatilleke | Am. Uhana M. V. |
| 2. Mr. L. W. Jayaratne | do. |
| 3. Mr. T. Wimalasiri | do. |
| 4. Mr. N. A. Gunadasa | do. |
| 5. Mr. V. H. H. I. Stephen | Ku. Atamune V. |
| 6. Mr. D. S. A. Indrapala | Cn. Kelani V. |
| 7. Mr. G. Wijetunga | Kg. Gabbala Sirisangabo V. |
| 8. Rev. K. Chandajothi | C. Royal College |
| 9. Mr. M. D. Mithrasena | T. Trincomalee Sinhala M. V. |
| 10. Mr. Piyadasa Nissanka | A. Nochchiyagama M. V. |
| 11. Mr. G. S. P. Jayatilleke | K. Ambalapitiya V. |
| 12. Mr. A. H. S. Wadigamangawa | Bd. Bandarawela Dharmapala M. V. |
| 13. Mr. J. Kularatne | Kl. Milleniya V. |
| 14. Mr. K. K. Ratnadasa | Mr. Rahula College |
| 15. Mr. M. K. Peiris | Bd. Passara Pri. V. |
| 16. Mr. R. Sivalingam | K. Highlands College |
| 17. Mr. D. Peter Silva | Kl. Magalkanda V. |
| 18. Mrs. W. I. Fernando | do. |
| 19. Mr. M. A. Piyaprema | Ch. Thimbirigaswala V. |
| 20. Mr. D. S. Kannangara | Kl. Dodampapitiya V. |
| 21. Mr. P. W. Siriwardena | Kg. Batuwita M. V. |
| 22. Mr. M. H. Ahamed Sahid | C. Balmond St. Meth. T. M. V. |
| 23. Mr. D. M. Wickremarachchi | C. Dambora V. |
| 24. Mr. R. M. D. Sirisena | Kg. Tholangamuwa M. M. V. |
| 25. Mr. R. M. Sumanasena | Bd. Millebedde V. |
| 26. Mr. B. S. Perera | Ku. Avulegama M. V. |
| 27. Mr. A. M. Karunaratne | K. Konakalagala V. |
| 28. Mr. D. V. D. Weerasekera | Bd. Yapamma V. |
| 29. Mr. A. Koralegama | Kg. Deliwala M. V. |
| 30. Mr. H. D. M. Karunaratne | Kl. Hirana V. |
| 31. Mr. D. K. M. Silva | Mr. Kahagala V. |
| 32. Mr. R. V. Gunadasa | Mg. Galloba V. |
| 33. Mr. K. L. V. Perera | Cn. Katana Meth. V. |
| 34. Rev. A. Nandasiri | Kl. Palligoda North M. V. |
| 35. Mr. T. L. C. Peiris | C. Egodauyana M. V. |
| 36. Mr. G. A. Dissanayake | Mg. Moratuwa M. V. |
| 37. Mr. Edwin Gunapala | Ku. Akkarapanaha V. |
| 38. Mr. Edwin Jayasuriya | H. Tangalla Deepankara Pri. V. |
| 39. Mr. D. S. A. Kumarasiri | Ku. Wannikudawewa V. |
| 40. Mr. G. B. Ariyaratne | Kl. Kalutara M. V. |
| 41. Mr. P. H. Piyasena | Kl. Agalawatta M. V. |
| 42. Mr. S. M. Jayaseela | Bd. Makulelle V. |
| 43. Mr. L. P. Weludasa | Ku. Ingaradaula V. |
| 44. Rev. Y. Sirinivasa | Ku. Uhumiya M. V. |
| 45. Mr. W. T. Obeysekera | Bd. Goradiyakumbura V. |
| 46. Mr. S. Asoka Suraweera | Mg. Kalawelaragama V. |
| 47. Mr. M. Amaradasa | C. Weniwelkola V. |
| 48. Mr. T. A. Mudiyanse | Kg. St. Mary's College |
| 49. Mr. E. Manis Singho | A. Puliyankulama V. |
| 50. Mr. J. M. G. Jayamanne | A. Medawewa V. |
| 51. Mr. H. Weerasinghe | Ku. Weligedara V. |
| 52. Mr. L. P. Podinilame | Ku. Anukkane V. |
| 53. Mr. S. M. Gunatilleke | Mg. Galloba-Badalkumbura V. |
| 54. Rev. D. Ratnasara | Cn. Galahitiyawa M. M. V. |
| 55. Mr. U. A. Ranasinghe | Mg. Karawita V. |
| 56. Mr. K. H. Kodituwakku | Mr. Watagedara V. |
| 57. Mr. L. Amaradasa | Kg. Puwakdeniya V. |
| 58. Mr. G. L. S. P. Perera | C. Moratumulla Meth. High Sch. |
| 59. Mr. P. R. Saramasinghe | A. Etambagaskada V. |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| | |
|---|---|
| 60. Mr. W. P. Thamel | C. Wellawatte Arthusa College |
| 61. Mr. R. W. D. Rajapakse | Mr. Dematapitiya M. V. |
| 62. Mr. W. M. W. Wickremasinghe | Ku. Udabaddalawa M. V. |
| 63. Mr. R. W. Liyanage | Kl. Diyakaduwa V. |
| 64. Mr. D. H. Karunanayake | Ku. Mamunawa V. |
| 65. Mr. Somapala Rajapakse | K. Galhinna Muslim V. |
| 66. Mr. Kithsiri Senaratne | G. Urala V. |
| 67. Mr. D. W. Karunanayake | Mr. Viharahena V. |
| 68. Mr. G. M. Gunasekara | Ku. Kattimahana M. V. |
| 69. Mr. M. A. Premaratne | P. Divulwewa V. |
| 70. Mr. S. Liyanagamage | Bd. Yahalabedde V. |
| 71. Mr. N. H. M. P. Narasinghe | Ku. Hindagahawewa V. |
| 72. Rev. M. Chandananda | Cn. Ihalabiyanwila M. V. |
| 73. Mr. T. R. P. A. Tennakoon | Kg. Bossella M. V. |
| 74. Mr. M. L. M. Mackeen | A. Kadawatratmale Muslim V. |
| 75. Mr. E. Dangampola | Mt. Dodamdeniya V. |
| 76. Rev. K. Pannananda | J. Jaffna Sinhala M. V. |
| 77. Mr. M. S. J. R. Fonseka | N. Agrapatana V. |
| 78. Mr. L. Ariyawansa | C. Kalubowila M. V. |
| 79. Mr. D. Henadheera | Bd. Ambagasdowa Vid. |

These teachers referred to in Nos. (71) and (78) were interdicted for taking part in political activities. But they were dismissed on other charges framed against them.

## දේශපාලන කටයුතු කිරීමේ චෝදනාව උඩ මාරු කරන ලද ගුරුවරු

### அரசியலிற் பங்குபற்றியதற்காக மாற்றம் செய்யப்பட்ட ஆசிரியர்

### TEACHERS TRANSFERRED FOR PARTICIPATION IN POLITICS

7. ලෙස්ලි ගුණවර්ධන මයා. (චම්ලි ගුණවර්ධන මයා වෙනුවට)

*(திரு. லெஸ்லி குணவர்தன—திரு. சம்லி குணவர்தன—சார்பாக)*

(Mr. Leslie Goonewardene—on behalf of Mr. Cholmondeley Goonewardene)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1965 මාර්තු මහා මැතිවරණයේ දී දේශපාලන කටයුතුවලට සහභාගිවූහයි චෝදනා ලැබූ ගුරුවරුන් කී දෙනෙකුන් පිළිබඳව ස්ථාන මාරුවීම් කර තිබේද ? (ආ) මෙම ගුරුවරුන්ගේ නම්, ඔවුන්ගේ කලින් සේවය කළ හා දැනට සේවය කරන සේවා ස්ථාන මොනවාද ?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) 1965 மார்ச் மாதத்தில் நடைபெற்ற பொதுத் தேர்தலின்போது அரசியலிற் பங்குபற்றினர்கள் என்ற குற்றச் சாட்டின்பேரில் மாற்றஞ் செய்யப்பட்ட ஆசிரியர்கள் எத்தனை பேர் ? (ஆ) அத்தகைய ஆசிரியர்களது பெயர்கள், அவர்கள் முன்னர் கடமையாற்றிய பாடசாலை, தற்பொழுது கடமையாற்றும் பாடசாலை ஆதியவை யாவை ?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) How many teachers have been transferred on the alleged participation in political activities during the General Election of March, 1965 ? (*b*) What are the names, previous stations and the present stations of these teachers ?

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

(අ) 1965 මාර්තු මහා මැතිවරණයේදී දේශපාලන කටයුතුවලට සහභාගි විය යන චෝදනාව උඩ කිසිම ගුරුවරයකු මාරු කොට නැත. (ආ) පැන නොනගී.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**

*(திரு. லெஸ்லி குணவர்தன)*

(Mr. Leslie Goonewardene)

දේශපාලන කටයුතුවලට සහභාගි විය යන චෝදනාව උඩ කිසිම ගුරුවරයකු මාරු කර නැත්නම්, 1965 අවුරුද්දෙදී මේ රටේ කරන ලද දහස් ගණනක් ගුරු මාරු මොන හේතුවක් නිසා කළ ඒවද ?

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙ අවශ්‍යතා අනුව කළ ඒව.

**අනිල් මූණසිංහ මයා.**

*(திரு. அனில் முனசிங்க)*

(Mr. Anil Moonesinghe)

දේශපාලන කටයුතු කිරීම නිසා ගුරුවරුන් මාරු කළ බව අපට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් දන්වා තිබෙනව.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජයසූරිය මයා.
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

ඒ බව මමත් දන්නව. ගරු මන්ත්‍රීතුමාට මගෙ පිළිතුර හරිහැටි තේරුණේ නෑ.

අනිල් මුණසිංහ මයා.
*(திரு. அனில் முனசிங்க)*
(Mr. Anil Moonesinghe)

මට සිංහල භාෂාව තේරෙනව. දේශපාලන කටයුතු කළ නිසා කිසිම ගුරුවරයකු මාරු කර නැති බවයි කියන්නෙ.

ජයසූරිය මයා.
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

උත්තරය දීල තිබෙන්නෙ එහෙම නොවෙයි.

අනිල් මුණසිංහ මයා.
*(திரு. அனில் முனசிங்க)*
(Mr. Anil Moonesinghe)

ගරු කථානායකතුමනි, ඔය කියන දේ මට තේරෙන්නෙ නෑ. මේ ප්‍රශ්නයට පිළිතුර පැහැදිලිව දෙන ලෙස මම ඉල්ලා සිටිනව.

ජයසූරිය මයා.
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

උත්තරය ආයෙත් වරක් කියවන්නම්. හොඳට අහගන්න.

(අ) 1965 මාර්තු මහා මැතිවරණයේදී දේශපාලන කටයුතු වලට සහභාගි විය යන චෝදනාව උඩ කිසිම ගුරුවරයකු මාරු කොට නැත. ඉංග්‍රීසියෙනුත් කියන්නද ?

(*a*) No teachers have been transferred on the ground of alleged participation in political activities during the General Election of March 1965.

අනිල් මුණසිංහ මයා.
*(திரு. அனில் முனசிங்க)*
(Mr. Anil Moonesinghe)

ගරු කථානායකතුමනි, මා ඇසූ ප්‍රශ්නයට පිළිතුරු ලැබුණෙ නෑ. දේශපාලන කටයුතුවල යෙදී සිටින නිසා ගුරුවරුන් මාරු කර නැති බවයි කියන්නෙ. නමුත් එසේ ගුරුවරුන් මාරු කර තිබෙන බව අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන්ම අපට දන්වා තිබෙනව. ඒ පෙත්සනුත් මා දැක තිබෙනව.

ජයසූරිය මයා.
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

දේශපාලන කටයුතු කළ නිසා ගුරුවරුන් මාරු කර තිබෙනව. නමුත් දේශපාලන කටයුතු කළාය යන චෝදනාව උඩ ගුරුවරුන් මාරු කර නැති බවයි මගෙ පිළිතුරෙන් තේරුම් කර දුන්නෙ.

අනිල් මුණසිංහ මයා.
*(திரு. அனில் முனசிங்க)*
(Mr. Anil Moonesinghe)

ඒ කියන්නෙ, චෝදනා විභාග නොකර මාරු කර තිබෙන බවයි.

ලෙස්ලි ගුණවර්ධන මයා.
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

පළිගන්න මාරු කළා.

අනිල් මුණසිංහ මයා.
*(திரு. அனில் முனசிங்க)*
(Mr. Anil Moonesinghe)

ඔය උත්තර දීල බේරෙන්න හම්බ වෙන්නෙ නෑ.

## කළුතර මැතිවරණ කොට්ඨාශයේ අයට යාන්ත්‍රික ධීවර යාත්‍රා දීම

களுத்துறைத் தேர்தற் றொகுதியில் உள்ளவர் களுக்கு இயந்திர மீன்பிடிப்படகுகள்

**ALLOCATION OF MECHANIZED FISHING BOATS : KALUTARA ELECTORATE**

8. **ලෙස්ලි ගුණවර්ධන මයා.)** චම්ලි ගුණවර්ධන මයා. වෙනුවට)
*(திரு. லெஸ்லி குணவர்தன—திரு. சம்ளி குணவர்தன—சார்பாக)*
(Mr. Leslie Goonewardene—on behalf of Mr. Cholmondeley Goonewardene)

කර්මාන්ත හා ධීවර කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1963-64 වර්ෂය සඳහා ධීවර කම්කරුවනට ධීවර දෙපාර්තමේන්තුවෙන් යාන්ත්‍රික ධීවර යාත්‍රා ලබා දීම පිණිස පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේදී ඒ සඳහා කළුතර මැතිවරණ කොට්ඨාශයෙන් සිව් දෙනෙකු තෝරා ගනු ලැබූ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බව එතුමා දන්නේද ? (ආ) ඒ අයගෙන් මෙතෙක් යාන්ත්‍රික ධීවර යාත්‍රා තිබෙන්නේ එක් අයකුට පමණක් බව එතුමා දන්නේද ? (ඉ) අනික් තිදෙනාටද යාන්ත්‍රික යාත්‍රා දීමේ ප්‍රමාදයට හේතුව කුමක්ද? අනික් තිදෙනාටද යාන්ත්‍රික ධීවර යාත්‍රා ලබාදීම සඳහා එතුමා අප්‍රමාදව නිසි කටයුතු කරනවාද ?

கைத்தொழில், கடற்றொழில் அமைச்சரைக் கேட்ட வினா: (அ) 1963/64 ஆம் ஆண்டில் மீனவர்களுக்கு இயந்திர மீன்பிடிப் படகுகள் வழங்குவதற்கென மீன்பிடித் திணைக்களத்தால் நடாத்தப்பட்ட நேர்கமுப் பரீட்சையில் களுத்துறைத் தேர்தற் றொகுதியிலிருந்து நால்வர் தெரிவு செய்யப்பட்டனர் என்பதை அவர் அறிவாரா? (ஆ) அவர்களுள் ஒருவருக்கு மாத்திரமே இதுவரை இயந்திர மீன்பிடிப் படகு வழங்கப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா? (இ) மற்றைய மூவருக்கும் இயந்திர மீன்பிடிப் படகுகள் வழங்குவதில் ஏற்படும் காலதாமதத்திற்கான காரணமென்ன? (ஈ) மற்றைய மூவருக்கும் மேற்கொண்டும் காலதாமதமின்றி இயந்திர மீன்பிடிப்படகுகள் வழங்குவதற்குத் தேவையான நடவடிக்கைகளை அவர் எடுப்பாரா?

asked the Minister of Industries and Fisheries: (*a*) Is he aware that four persons from the Kalutara electorate were selected at an interview held by the Fisheries Department for the purpose of giving mechanized fishing boats to fishermen for 1963-64? (*b*) Is he aware that out of them only one person has been given a mechanized fishing boat so far? (*c*) What is the reason for the delay to give mechanized fishing boats to the other three persons? (*d*) Will he take necessary steps to give mechanized fishing boats to the other three persons without delay?

**ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

(திரு. டீ. செல்ற்றன் ஜயசிங்க—கைத்தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)

(*a*) Yes. (*b*) Yes. (*c*) The majority of boats and engines ordered for the 1963-64 applicants had, instead, to be given as replacements for boats lost or damaged beyond repair in the cyclone of December 1964. Further, boats are issued according to priority numbers given to the 1963-64 applicants. The turn of the three applicants referred to has not arrived as yet. (*d*) They will be given boats as soon as their turn arrives.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**

(திரு. லெஸ்லி குணவர்தன)

(Mr. Leslie Goonewardene)

Is it likely to happen in this financial year?

**ෂෙල්ටන් ජයසිංහ මයා.**

(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)

(Mr. Shelton Jayasinghe)

Yes.

## එච්. ඊ. ඩබ්ලිව්. ද සිල්වා මයා., ජාතික ක්‍රම සම්පාදක දෙපාර්තමේන්තුවේ පාලන සහකාර

## திரு. எச். ஈ. டபிள்யு. டி. சில்வா, நிர்வாக உதவியாளர், தேசிய திட்ட அமைப்புத் திணைக்களம்

## MR. H. E. W. DE ZILWA, ADMINISTRATIVE ASSISTANT, NATIONAL PLANNING DEPARTMENT

10. **ඇස්. බී. යාලේගම මයා.** (රත්තොට—රාජා කුලතිලක මයා.—තෙල්දෙණිය—වෙනුවට)

(திரு. எஸ். பி. யாலேகம—றத்தோட்டை—திரு. ராஜ குலத்திலக்க—தெல்தெனிய—சார்பாக)

(Mr. S. B. Yalegama—Rattota—on behalf of Mr. Raja Kulatillake—Teldeniya)

අග්‍රාමාත්‍ය සහ රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ජාතික ක්‍රම සම්පාදක දෙපාර්තමේන්තුවේ පාලන සහකාර වශයෙන් එච්. ඊ. ඩබ්ලිව්. ද සිල්වා මහතා පත් කරන ලද්දේ කවදාද ? (ආ) ඔහු විශ්‍රාම ගන්නා වයස ඉක්මවා සිටීද ? (ඉ) එසේ නම්, ඔහු විශ්‍රාම ගතයුතු වයස ඉක්මවා කොපමණ කාලයක් සේවය කර ඇත්ද ? (ඊ) තව සේවය අවුරුද්දක් දීර්ඝ කිරීම සඳහා ඔහු ඉල්ලුම් කර තිබේද ? (උ) සිංහල කියවීමට හෝ ලිවීමට නොදන්නා නිලධාරීන්ගේ සේවය දීර්ඝ කිරීමට හේතුව කුමක්ද ? (ඌ) මෙම දෙපාර්තමේන්තුවේ සිංහල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[යාලේගම මයා.]

යතුරු ලියන්නන් දෙදෙනාට වැඩ නැති බව එතුමා දන්නවාද? (එ) සිල්වා මහතා තවදුරටත් සේවයේ රඳවා ගැනීමට අදහස් කර තිබේද ?

பிரதம அமைச்சரையும், பாதுகாப்பு வெளி விவகார அமைச்சரையும் திட்டமிடல், பொருளாதார விவகார அமச்சரையும் கேட்ட வினா: (அ) திரு. எச். ஈ. டபிள்யூ. டி சில்வா என்பவர் தேசிய திட்ட அமைப்புத் திணைக்களத்தில் நிருவாக உதவியாளராக எப்பொழுது நியமிக்கப்பட்டார்? (ஆ) அவர் இளைப்பாறும் வயதைக் கடந்துள்ளாரா? (இ) ஆமெனில், இளைப்பாறும் வயதைக்கடந்த பின்னர் எவ்வளவு காலம் அவர் சேவையாற்றியுள்ளார்? (ஈ) ஒரு வருடத்திற்கு சேவை நீடிப்புக் கேட்டுள்ளாரா? (உ) சிங்களம் எழுதவோ, வாசிக்கவோ தெரியாத ஊழியர்கள் சேவையில் தொடர்ந்திருப்பதற்கான காரணம் யாது? (ஊ) இத்திணைக்களத்திலுள்ள இரு சிங்கள தட்டெழுத்தாளர்களுக்கு வேலை எதுவுமில்லை என்பதை அவர் அறிவாரா? (எ) திரு. டி சில்வாவை இனிமேலும் தொடர்ந்து சேவையில் வைத்திருப்பதற்கு உத்தேசிக்கப் படுகிறதா?

asked the Prime Minister and Minister of Defence and External Affairs and Minister of Planning and Economic Affairs: (*a*) When was Mr. H. E. W. de Zilwa appointed Administrative Assistant of the National Planning Department? (*b*) Has he passed the retiring age? (*c*) If so, how long has he served after completing the retiring age? (*d*) Has he applied for an extension of service for one year? (*e*) What is the reason for continuing in service, officers who do not know to read and write Sinhala? (*f*) Is he aware that the two Sinhala typists in this Department have no work? (*g*) Is it proposed to continue Mr. de Zilwa in service any longer?



**ගරු ජේ.ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)*

(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence and External Affairs)

(*a*) On 1st December 1965. (*b*) He has not passed the age of compulsory retirement. He is 59 years of age. (*c*) Does not arise. (*d*) He has applied for and been granted an extension of service beyond 31st December 1965. (*e*) Officers who have reached the age of optional retirement and who have not obtained the requisite standard of Sinhala proficiency have for the present been allowed to continue in service beyond 55 years (age of optional retirement) provided their work and conduct are otherwise satisfactory and pending further instructions regarding their extension of service. (*f*) No. (*g*) He will continue in service until reaching the age of compulsory retirement.

## නොපැමිණීමේ අවසරය : ජී. ජී. පොන්නම්බලම් මයා.

### வராதிருக்க அனுமதி : திரு. ஜீ. ஜீ. பொன்னம்பலம்

### LEAVE OF ABSENCE: MR. G. G. PONNAMBALAM

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**

*(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

I move,

"That Mr. G. G. Ponnambalam, Q. C., Member for Jaffna, be granted leave under Section 24 (1) (*e*) of the Ceylon

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(Constitution) Order in Council, 1946, to be absent from the Sittings of the House for a period of three months from 8th November, 1966."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## නොපැමිණීමේ අවසරය: ඒ. සී. එස්. හමීඩ් මයා.

## வராதிருக்க அனுமதி: ஜனாப் ஏ. சீ. எஸ். ஹமீது

## LEAVE OF ABSENCE: MR. A. C. S. HAMEED

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I move,

"That Mr. A. C. S. Hameed, Second Member for Akurana, be granted leave under Section 24 (i) (e) of the Ceylon (Constitution) Order in Council, 1946, to be absent from the sittings of the House for a period of three months from 8th November, 1966."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## වරප්‍රසාද: "ඇත්ත" පත්‍රයට විරුද්ධ පැමිණිල්ල

## சிறப்புரிமை: "அத்த" புதினப் பத்திரிகைக் கெதிராக முறைப்பாடு

## PRIVILEGE: COMPLAINT AGAINST "ATHTHA" NEWSPAPER

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

Mr. Speaker, I saw you in Chambers yesterday about this matter. I wish to draw your attention to page 1 of the "Aththa" newspaper of 26th September 1966, especially the headline. It appears to be a contempt of this House.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I shall look into the matter, and report to the House later.

## ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජාඥා පිළිබඳ විශෙෂ කාරක සභාව

## *இலங்கை (பாராளுமன்றத் தேர்தல்கள்) அரசவைக் கட்டளைமீதான தெரிகுழு*

## SELECT COMMITTEE ON CEYLON (PARLIAMENTARY ELECTIONS) ORDER-IN-COUNCIL

කල් තබන ලද විවාදය නැවත දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [නොවැම්බර් 6]

நவம்பர் 6 ஆம் தேதிய வினா மீதான ஒத்தி வைக்கப்பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

*Order read for resuming Adjourned Debate on Question—[6th November.]*

"ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජාඥාවේ විධි විධාන ක්‍රියාත්මක වන අයුරු ගැන සලකා බැලීම පිණිසත් මැතිවරණ පිළිබඳව දැනට බලපවත්වන නීති සහ සම්ප්‍රදායන් සම්බන්ධයෙන් අවශ්‍යයයිද යෝග්‍යයයිද සලකනු ලැබූ වෙනස්කම් ගැන, පසුගිය මහා මැතිවරණය තුළදී ලබාගත් අත්දැකීම් අනුව නිර්දේශ කිරීම පිණිසත් විශේෂ කාරක සභාවක් පත් කළ යුතුය; කාරක සභාවට මන්ත්‍රීන් නම් කිරීම හා එහි ගණපූරණය නියම කිරීම කථානායක තුමා විසින් කළ යුතුය; අවශ්‍ය ලිපිලේඛනාදිය ගෙන්වා ගැනීමේ සහ අවශ්‍ය පුද්ගලයින් කැඳවීමේ බලය කාරක සභාවට තිබිය යුතුය; වරින් වර වාර්තා කිරීමටත් මන්ත්‍රී මණ්ඩලය කල් තබනු ලැබුවත් රැස්වීම් පවත්වාගෙන යෑමටත් කාරක සභාවට බලය තිබිය යුතුය."—[ගරු සී. පී. ද සිල්වා]

"இலங்கை (பாராளுமன்றத் தேர்தல்கள் பற்றிய) அரசவைக் கட்டளையின் ஏற்பாடுகள் தொழிற்படும் முறைபற்றி ஆராய்வதற்கும் கடந்த பொதுத் தேர்தலி லேற்பட்ட அனுபவத்தைக் கொண்டு, தேர்தல்கள் பற்றி இப்பொழுதுள்ள சட்டத்திலும், நடைமுறைகளி லும் ஏற்படுத்தப்பட வேண்டிய, விரும்பத்தக்க மாற் றங்கள் பற்றிச் சிபார்சு செய்வதற்காகவும் தெரிகுழு வொன்று நியமிக்கப் பெறுமாக; அக்குழுவின் உறுப் பினர்கள் சபாநாயகரினால் நியமிக்கப்படுவதோடு குழு வின் கூட்ட நடப்பெண்ணும் அவரால் நிர்ணயிக்கப் படுமாக; ஆட்களை அழைத்து விசாரணை செய்வதற் கும், பத்திரங்கள், சாதனங்கள், பதிவேடுகள் ஆகிய வற்றைப் பெறுவதற்கும் அக்குழுவிற்கு அதிகாரம் வழங்கப்படுமாக; காலத்திற்குக் காலம் அறிக்கை சமர்ப்பிப்பதற்கும் சபையின் ஒத்திவைப்பினால் பாதிக் கப்படாது கூடுவதற்கும் அக்குழுவிற்கு அதிகாரம் வழங்கப்படுமாக." —[கௌரவ சீ. பீ. டி சில்வா]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"That a Select Committee be appointed to consider the working of the provisions of the Ceylon (Parliamentary Elections) Order-in-Council and in the light of the experience gained in the last General Election to make recommendations in respect of changes considered necessary and desirable in the existing law and practice relating to elections; that the Committee be nominated and the quorum of the Committee be fixed by Mr. Speaker; that the Committee have power to send for papers, persons, documents and records; that the Committee have power to report from time to time and to sit notwithstanding any adjournment of the House."—[The Hon. C. P. de Silva.]

**ඉදිරිපත් කරන ලද සංශෝධනය [නොවැම්බර් 6]:**

திருத்தம் பிரேரிக்கப்பட்டது [நவம்பர் 6] :

*Amendment moved [November 6] :*

"අත්දැකීම්" අත්හැර "අත්දැකීම්ද, මැතිවරණ නඩුවලින් ලැබුනු අත්දැකීම්ද, ලගදී පැවැත්වුණු අතුරු මැතිවරණවලදී ලබාගත් අත්දැකීම්ද" ඇතුලත් කිරීමට.

"கடந்த பொதுத் தேர்தலிலேற்பட்ட" என்னுஞ் சொற்களை நீக்கிவிட்டு, "கடந்த பொதுத் தேர்தலிலும், தேர்தல் மனு வழக்குகளிலும், அண்மையில் நடைபெற்ற உப தேர்தல்களிலு மேற்பட்ட" என்னுஞ் சொற்களை அங்கு சேர்க்க வேண்டும்".

"To leave out 'last General Election' and insert 'last General Election, in Election Petition cases and in the recently concluded By-elections'".

**ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදි.**

வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Question again proposed.*

අ. භා. 2.17

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන (සෞඛ්‍ය ඇමති)**

*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன—சுகாதார அமைச்சர்)*

(The Hon. M. D. H. Jayawardena—Minister of Health)

ගරු කථානායකතුමනි, පෙරේදා මා කථා කළ අවස්ථාවේදී පසුගිය මහා මැතිවරණ කාලය තුළදී ලබාගත් අත්දැකීම් අනුව මැතිවරණ නීති පිළිබඳව සංශෝධනයක් කිරීම අවශ්‍ය බව අවබෝධ කරවීමට මා උත්සාහ කළා. පසුගිය මහා මැතිවරණයේ දී ලබාගත් අත්දැකීම් අමතක කළ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙකු නොබෝදා පැවැත්වූ අතුරු මැතිවරණ කටයුතු සම්බන්ධයෙන් චෝදනා රාශියක් ඉදිරිපත් කළ බව තමුන්නාන්සේට මතක ඇති. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ එම චෝදනාවලට පිළිතුරු දීම සඳහා මා කථා කරන බව ඒ අවස්ථාවේදී මා මතක් කළා. මක්නිසාද ? රජයේ ඇමතිවරයකු වශයෙනුත් බෙන්තර-ඇල්පිටිය ප්‍රදේශයේ ඡන්ද කටයුතු භාරව මා ක්‍රියා කළ නිසාත් විරුද්ධ පක්ෂය විසින් නගන ලද චෝදනා සහ සිදු වුණා යයි කියන දූෂණවල සත්‍යයක් නැති බව මට ඔප්පු කළ හැකි නිසයි.

ගරු කථානායකතුමනි, පෙරේදා මා ප්‍රකාශ කළ අන්දමට මේ කාරණා පිළිබඳව ආණ්ඩු පක්ෂයෙන් චෝදනා ඉදිරිපත් කරන්නට පුලුවනි. ඒවාගේම විරුද්ධ පක්ෂයෙනුත් චෝදනා ඉදිරිපත් කරන්නට පුලුවනි. නමුත් මෙවැනි චෝදනා කීපයක් පිළිබඳව නඩු විභාග කර දැන් ශ්‍රෙෂ්ඨාධිකරණය මගින් තීන්දු දී තිබෙනවා. පසුගිය මහා මැතිවරණයෙන් පසු පවරන ලද නඩු වලින් දහයකින් පමණ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ආසන අහිමි වී තිබෙන බව——

**අනිල් මූණසිංහ මයා.**

*(திரு. அனில் முனசிங்க)*

(Mr. Anil Moonesinghe)

ඇපැල් අරන් තිබෙනව.

**පී. ජී. බී. කෙනමන් මයා.** (මැද කොළඹ තුන්වන මන්ත්‍රී)

*(திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர்)*

(Mr. P. G. B. Keuneman—Third Colombo Central)

Some are in appeal. So, how can you say that?

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**

*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*

(The Hon. M. D. H. Jayawardena)

මම ඒ නඩු ගැන කථා කරන්නෙ නැහැ. දැනට ආසන අහිමි වී තිබෙන බව පමණයි කියන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**අනිල් මූණසිංහ මයා.**
*(திரு. அனில் முனசிங்க)*
(Mr. Anil Moonesinghe)
අහිමි වී නැහැ.

**ගරු එම්. ඩී. එච් ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
තීන්දු කර තිබෙනව අවලංගු කළාය කියා. ඊටපසු ඇපැල් ගෙන තිබෙනව. ඇපැලේදි නිදහස්වීම වෙනම වැඩක්.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
නිදහස් වෙලත් තියෙනව.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
නමුත් දැනට නඩුකාරවරුන් පිළිගෙන තිබෙන චෝදනා මොනවාද ? මේ ගරු සභාවේ දෙපාර්ශ්වයෙන්ම චෝදනා ඉදිරිපත් කරන්ට පුලුවන්. නමුත් ඒ චෝදනා අනුව නඩුකාරවරුන් පිළිගත් කාරණා උඩ ආසන කීපයක් අහිමි කර තිබෙන බව තමුන්නාන්සේලා දන්නව.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)
They are not unseated yet.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
ඒ නඩු ගැන මම එකින් එකට විස්තර කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මක්නිසාද, ඒ නඩු තීන්දු දැනට ඇපැල් උසාවියෙ ඉදිරිපිට තිබෙන නිසයි. නමුත් ඔප්පු වී තිබෙන නැත්නම් භාරගත් කාරණා මොනවාද කියා තමුන්නාන්සේලා දන්නවා. වරින් වර ඒ කාරණා ගැන කියන්ට වුවමනා නැහැ. කාරණා රාශියක් නිසා මන්ත්‍රීවරුන් කීප දෙනෙකුට ආසන අහිමි වී තිබෙනව. මේ යෝජනාව පිළිගන්න ඒ කාරණා පමණක් ඇති.

ගරු කථානායකතුමනි, මේ මැතිවරණ නීති සංශෝධනය කිරීම ඉතාමත් අවශ්‍යයි. බෙන්තර-ඇල්පිටිය ගරු මන්ත්‍රීතුමාත් (එච්. ජී. ඒ. කාරියවසම් මයා.) මහර ගරු මන්ත්‍රීතුමාත් (එස්. කේ. කේ. සූරියාරච්චි මයා.) පෙරේදා චෝදනා කීපයක් නැගුවා. ඒවායින් එකක් තමයි බෙන්තර-ඇල්පිටිය ආරෝග්‍යශාලාවට මුල් ගල තැබුවාය යන්න. ඒ චෝදනාව පිළිබඳව මා බෙන්තර-ඇල්පිටිය ගරු මන්ත්‍රීතුමාට කරුණු පැහැදිළි කර දෙන්න සතුටුයි. මුල් ගල තැබුවෙ මැතිවරණ කාලයෙ නොවෙයි. මැතිවරණයට ප්‍රථමයෙනුයි මුල් ගල තැබුවෙ. ආරෝග්‍යශාලා පරීක්ෂා කිරීම සඳහා අට මාසයකට පෙර මා බෙන්තර-ඇල්පිටිය ප්‍රදේශයට ගියා. ඊටපසු ඔක්තෝබර් මාසයේදී එම ආරෝග්‍යශාලාව සඳහා මුදල් වෙන් කළා. මුදල් ලැබුණු අවස්ථාවේදීම ඒ මුල් ගල තැබූ බව ඇත්තයි. ඒ ගරු මන්ත්‍රීතුමා කියන්ට යෙදුණා විරුද්ධ පක්ෂයේ නායක මැතිනිය එම ආරෝග්‍යශාලාවට 1962 දීත් මුල් ගල තැබුවාය කියා. ඒ වර්‍ෂයේදී මුදල් වෙන් කර තියෙන්නත් ඇති. නමුත් ඊටපසු අවුරුදු තුනක්ම ගතවී තිබෙනව. 1966-67 මුදල් වර්‍ෂයේදී ලැබුණු මුදල්වලින් තමයි ඒ ආරෝග්‍යශාලාවට මුල් ගල තැබුවෙ. ඒවාගේම මොනම අවස්ථාවකදීවත් සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් මා මගේ නිල බලයෙන් ප්‍රයෝජනයක් ගන්නට බලාපොරොත්තු නොවූ බව මා ඒ ගරු මන්ත්‍රීතුමාට මතක් කළා. මම සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් ඒ කාලය තුළ ඒ ප්‍රදේශයේ එක ආරෝග්‍යශාලාවකටවත් ගියේ නැහැ. මගේ පෞද්ගලික වුවමනාවක් සඳහා දොස්තර මහත්මයකු මුණගැසෙන්නට නම් ගියා. එසේ ගියේත් ආරෝග්‍යශාලාවේ සෙනඟ අඩු වූ විටයි. තවත් විස්තර කරනවා නම් මා ගියේ බෙහෙත් ටිකක් ලබා ගන්නයි. මා නම් මා දරණ නිලයෙන් අපේ දේශපාලන පක්ෂයට විශේෂ වාසියක් ලබගාන්නට උත්සාහ කෙළේ නැහැ. කවදාකවත් ඒ වැනි බලාපොරොත්තුවක් ඇත්තේත් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තවත් චෝදනාවක් එල්ල වුණා. ඒ චෝදනාව එල්ල කෙළේ මහර ගරු මන්ත්‍රීතුමාද එසේ නැත්නම් බෙන්තර-ඇල්පිටියේ ගරු මන්ත්‍රීතුමාදැයි මට මතක නැහැ. පසුගිය ඔක්තෝබර් මාසය ඇතුළත බෙන්තර-ඇල්පිටිය ප්‍රදේශයේ 263 දෙනකුට ලංගමයේ රක්ෂා දුන් බව ඒ චෝදනාවයි. ඔය මාසය තුළ ඒ ප්‍රදේශයේ තබා මුළු ලංකාවේවත් ඔය තරම් පිරිසකට ලංගමයේ රක්ෂා දුන්නේ යයි මා හිතන්නේ නැහැ.—[බාධා කිරීමක්]

**අනිල් මූණසිංහ මයා.**
*(திரு. அனில் முனசிங்க)*
(Mr. Anil Moonesinghe)
රක්ෂා දී තිබෙනවා.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டி. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
263 from Bentara-Elpitiya? That was the allegation made. [*Interruption*].

ඔක්තෝබර් මාසය තුළදී ඒ ප්‍රදේශයේ ඒ තරම් ගණනකට ලංගමයේ රක්ෂා දුන්නා යැයි අගලවත්තේ ගරු මන්ත්‍රීතුමාට ඔප්පු කරන්නට පුළුවන්ද?

**අනිල් මූණසිංහ මයා.**
*(திரு. அனில் முனசிங்க)*
(Mr. Anil Moonesinghe)
ඔව්.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டி. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
හොඳයි, මම ඒ අභියෝගය පිළිගන්නවා.

**අනිල් මූණසිංහ මයා.**
*(திரு. அனில் முனசிங்க)*
(Mr. Anil Moonesinghe)
ඔප්පු කළොත් 'සීට්' එකෙන් අස් වෙනවාද?



**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டி. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
ඒ ගරු මන්ත්‍රීතුමාට නම් දැන් පරදින්නට දෙයක් නැහැ.

ගරු කථානායකතුමනි, දූෂණ කටයුතු ගැන එදා සඳහන් කළා. අපේ ගරු අගමැතිතුමාගේ පිංතූරය බෙන්තර-ඇල්පිටිය කොට්ඨාශයේ ගෙවල්වල අලවා තිබීම දූෂණයක් හැටියට සඳහන් කළා. [බාධා කිරීමක්] මා දන්නා හැටියට ඒ පිංතූර අලවා තිබුණේ පෞද්ගලික නිවාසවලයි.

**සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය.**
(අත්තනගල්ල)
*(திருமதி சிறிமாவோ ஆர். டீ. பண்டாரநாயக்க—அத்தனகல்ல)*
(Mrs. Sirimavo R. D. Bandaranaike—Attanagalla)
කඩවල අලවා තිබුණා.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டி. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
කඩවල එකක්වත් අලවා තිබුණේ නැහැ. ප්‍රසිද්ධ තැන්වල අලවා තිබුණේ නැහැ. සාමාන්‍ය ගෙවල්වල නම් අලවා තිබුණා. එසේ අලවා තිබුණු පිංතූර පාරට පෙනුණු බව නම් ඇත්තයි.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
ගෙවල්වල පිට පැත්තේ අලවා තිබුණා.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டி. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
නමුත් ප්‍රසිද්ධ ස්ථානවල අලවා තිබුණේ නැහැ. පෞද්ගලික ගේක පිංතූර අලවා ගන්නට නීතියෙන් ඉඩ තිබෙනවා. ප්‍රසිඩ පාලම්වල, තැපැල් කන්තෝරුවල, ග්‍රාම සේවකයන්ගේ ගෙවල්වල ඒ පිංතූර අලවා තිබුණේ නැහැ. ඒ නිසා ඒ පිංතූර ඇලවීමෙන් නීති විරෝධි ක්‍රියාවක් කළ බවට කරන ලද චෝදනාව සම්පූර්ණයෙන්ම අසත්‍යයි. ගෙවල්වල නම් පාරට පේන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලෙස ඒ පිංතූර අළවා තිබුණා. මිනිසුන් එවැනි දෙයක් කරන්නේ පාරට පේන්න ටයි.—[බාධා කිරීමක්.]

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

මා වචනයක් කියන්න සතුටුයි. මෙතැන පොඩි සාකච්ඡාවක් තිබෙනවා වගෙයි. මාත් මෙතැන සිටින බව කල්පනා කරන්න. මා දෙස බලාගෙන කථා කරන්න: ඒ පැත්තට හැරී ප්‍රශ්න අහන නිසයි, කර දර ඇති වන්නේ.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

ප්‍රශ්නයක් ඇසුවාම ඒ වේලාවේම උත්තරයක් නුදුන්නොත් ඒ ප්‍රශ්නයෙන් සඳහන් වන කාරණය පිළිගත්තා සේ කල්පනා කරනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

කරුණාකර මා දෙස බලා කථා කරන්න.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

මා ළමයකු නොවන බව තමුන්නාන්සේට කියන්නට ඕනෑ. හැම අවස්ථාවක දීම මා කථා කරන්නේ තමුන්නාන්සේට ගරු කරලයි. අහන ප්‍රශ්නයට උත්තරයක් නොදෙනවා නම් විවාදයක තිබෙන අගය මොකක්ද ?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ස්ථාවර නියෝග අනුව කථාව කරගෙන යන්න. ඔවැනි සාකච්ඡා තිබෙන්නේ කාරක සභා අවස්ථාවේදී විතරයි.

If the whole House wants it that way, with all the disturbances, I do not mind.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

These are intelligent interruptions.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

They are unnecessary interruptions.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

ගරු කථානායකතුමනි, ඊ ළඟට ගරු ඉඩම් ඇමතිතුමාට විරුද්ධව චෝදනාවක් ඉදිරිපත් කළා. එතුමා දෙද්දුවේ සොරොව්වක් විවෘත කර, එයින් වතුර දෙන්නේ ඒ පළාතේ එක්සත් ජාතික පක්ෂයේ අයට පමණක්ය කියා ප්‍රකාශ කළායයි කිව්ව. ගරු ඉඩම් ඇමතිතුමා කථාව පවත්වන අවස්ථාවෙ මමත් එහි හිටියා. එතුමා කී දේ ඇත්ත වශයෙන්ම මම නැවත වරක් කියන්න කැමතියි. මේ යෝජනා ක්‍රමයෙන් අක්කර 18,000 කට සේවය සැලසෙන නිසා මේ පළාතේ ජනතාවට මෙයින් විශාල ප්‍රයෝජනයක් ලැබෙනවාය කියා එතුමා කිව්වා. ඒ සමගම, එම යෝජනා ක්‍රමය පටන් අරගෙන අවුරුදු 4ක් වෙනවාය හැතැප්ම හතරහමාරක් දිග බැම්මක් බැඳ තිබෙනවය, නව හැතැප්ම එකහමාරක් සම්පූර්ණ කරන්න තිබෙනවය කියාත් එතුමා කීව. මේ කාරණාව එතුමා විශේෂයෙන්ම කිව්ව: සමහර අය තමුන්නාන්සේලට මුදල් දෙන්න ලෑස්ති වෙයි, ඒ මුදල් ගන්නෙ නැතුව මේ වතුර පාවිච්චි කර තමුන්නාන්සේලාගේ කුඹුරු වැඩ කර නම්බුකාර පිළිවෙළට විශාල මුදලක් හම්බ කර ගන්නය කියා එතුමා මතක් කළා. එපමණයි, එතුමා කීවෙ.

ඒ පළාතේ ඉඩම් කච්චේරියක් පැවැත්වුවාය කියාත් චෝදනා කළා. ඒ ගැනත් මම හොඳින් සොයා බැලුවා. මීට අවුරුද්ද කට පමණ ප්‍රථමයි, ඒ ඉඩම් කච්චේරිය පවත්වන්න නියම කර තිබුනෙ. ඉඩම් කච්චේරියක් පැවැත්වීමට ඉල්ලුම් පත්‍ර කැඳවා තිබුනත් ඒ අවස්ථාවේ ඉඩම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. එච්. ජයවර්ධන]

දෙන්න එපාය කියා විශේෂ නියමයක් කළා. ඉඩම් කච්චේරිය කල් දමා මැතිවරණ පසු කරනවාය කිව්ව. ඒ අන්දමට පිරිසිදු විධියට මැතිවරණය ගෙන ගිය බව මම කියන්න කැමතියි. අපි අයුතු අන්දමට වැඩ කළාය කියනව නම් අනුරාධපුර පළාතේ පැවති අතුරු මැතිවරණයකදී—මොන කොට්ඨාශයෙද කියන්න මම කැමති නැහැ—පසුගිය ආණ්ඩුව කටයුතු කළ හැටි මම මතක් කරන්න සතුටුයි. ඒ අතුරු මැතිවරණය පැවැත්වෙන කාලයේදි වතුර නැති නිසා පාලු වී තිබුණු කුඹුරු යායවලට මුදල් ගෙව්වා. මා ඒ ගැන මේ කාටවත් චෝදනා කරනවා නොවෙයි. ඊට ප්‍රථම යෙන් කච්චේරියට නියම කරලා තියෙන්න ඇති, මුදල් ගෙවන්න. නමුත් මැතිවරණ කාලයෙදියි, මුදල් ගෙව්වේ. චෝදනා කර නව නම් අපටත් චෝදනා කරන්න පුළු වන්, අල්ලස් දුන්නය කියා. බොහෝ අවස්ථාවලදී කච්චේරිවලට දෙන නියම යන් ක්‍රියාවෙ යොදවන්නෙ ප්‍රමාද වෙලයි.

ගරු කථානායකතුමනි, ඡන්දදායක ලැයිස්තු ගැන කථා කළා. ඒ ගැන වැඩිදුර පැමිණිලි ආවෙ අපේ පැත්තෙන්ය කියා මම හිතනව. දෙද්දුව ප්‍රදේශයේ ඡන්ද ලැයිස්තුවලින් තුන් හාරසිය ගණනකගේ නම් කපා තිබුණු බව කියන්න යෙදුනා. වෙනත් ආසනවල ඒ සම්බන්ධයෙන් සිදු වී තිබෙන දේ ඊයේ පෙරෙයිදා දවසක "ඩේලි නිව්ස්" පත්‍රයේ ඡායා රූපයත් සමග පළ වී තිබුනා. අවුරුදු දොළහේ ළමයින්ටත්——

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

ඔහෙලගෙ ආණ්ඩු කාලයේදි—1965 ජූනි වල—හැදූ ඡන්ද ලැයිස්තු නේ තියෙන්නෙ? ඡන්ද කොමසාරිස්තුමාගෙන් මම ඒ ගැන ඇහුවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

සහතික කළේ 1966 ජනවාරි මාසයෙයි.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

ඡන්ද ලැයිස්තු හැදුවට පස්සෙ අවුරුද්දක් පමණ ගත වෙනවා, ඒවා සහතික කිරීමට. 1965 දි ඡන්ද ලැයිස්තුව සහතික කළත් ඒවා හැදූවෙ 1964 වෙන්න ඕනැ.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

You can find out from the Commissioner of Elections. I verified it from the Commissoner this morning.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

අපේ බෙන්තර-ඇල්පිටියේ ගරු මන්ත්‍රීතුමා (එච්. ජී. ඇල්බට් කාරියවසම් මයා.) පොලීසියට ප්‍රශංසා කළා. කොස්ගොඩ පොලීසියට ප්‍රශංසා කළ අවස්ථාවේ ගරු අගමැතිතුමත් අත් පොළසන් දුන්නා. නමුත් කොස්ගොඩ පොලීසියේ සිදු වූ යම් යම් කරුණු ගැන ගරු අගමැතිතුමාට වඩා මම දන්නව. කොස්ගොඩ පොලීසිය ගැන සුළු සුළු පැමිණිලි මටත් ලැබුණ. නමුත් මැතිවරණය සන්සුන්ව ගෙන යන්නට වුවමනා නිසා මම ඇමතිවරයෙක් වශයෙන් ඒවා සම්බන්ධයෙන් කටයුතු කරන්න කල්පනා කළේ නැහැ. කොස් ගොඩ පොලීසියේ මහත්මයා ගැන සුළු විස් තරයක් කරන්න කැමතියි. කොස්ගොඩ පොලීසියේ මහත්මයා තමයි, නල්ලූර්හි ගරු මන්ත්‍රීතුමාට (වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාදන්) පහර දුන්නෙ, යාපනයේ පොලීසියේදී. ඒ මහත්මයාට යළිත් වරක් රක්ෂාව ලැබුනා. ඒ අපේ ආණ්ඩුව යට තේ නොවෙයි. සමහර විට ඒ ගැන කෙළෙහිගුණ සැලකීමට ඒ මහත්මයා කට යුතු කරන්න ඇති.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

නැහැ. උසාවියෙ නඩු තීන්දුවක් උඩයි එම තීරණය දුන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
දඬුවම් කළේ උසාවියේදී.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
දඬුවම් කළේ නැහැ, ඇපැලෙදි නිදහස් වුණා.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
මට මතක හැටියට ඇපැලෙන් නිදහස් වුණේ නැහැ.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
They got off in appeal, and we had no alternative but to take them back.—[*Interruption*].

**එම්. සිවසිතම්පරම් මයා.** (උඩුප්පිඩ්ඩි)
*(திரு. எம். சிவசிதம்பரம்—உடுப்பிட்டி)*
(Mr. M. Sivasithamparam—Udupiddi)
They were not interdicted after conviction.

**ආචාර්ය එන්. එම්. පෙරේරා** (යටියන්තොට)
*(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)*
(Dr. N. M. Perera—Yatiyantota)
Are you doing that now?—[*Interruption*]. Even the 1962 *coup* suspects are being brought back.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
අපි සන්තෝෂයි අහන්න, පොලීසිය අපක්ෂපාත අන්දමින් කටයුතු කළාය කියන කාරණය. කොස්ගොඩ ප්‍රදේශයෙන් සුළු සුළු පැමිණිලි ලැබුණත් ඒවා ගැන ක්‍රියා කළානම් කලබල ඇතිවෙන්න තිබුණා. අපට මතකයි පසුගිය මැතිවරණ කාලයේදී බෙන්තර-ඇල්පිටිය කොට්ඨාශය තුළ, මැතිවරණය පැවැත්වුණු දින වලම—මට මතක හැටියට මැතිවරණය පැවැත්වුණු දිනට පෙර දින හෝ පසු දින—මිනීමැරුම් දෙකක් සිදු වුණ බව. මහර ගරු මන්ත්‍රීවරයා සඳහන් කළා 23 වනදා රාත්‍රියෙ ඇතිවුණාය කියන සිද්ධිය හැරෙන්නට ඒ ප්‍රදේශවල මැතිවරණ කටයුතු ඉතාමත් සංසුන් ලීලාවෙන් ගෙන ගොස් ඇති බව. විශේෂයෙන්ම බෙන්තර-ඇල්පිටියෙ මන්ත්‍රීතුමා මැතිවරණය පැවැත් වුණු සංසුන් ලීලාව ගැන මතක් කළා.

ගරු කථානායකතුමනි, ඒ සමගම චෝදනාවක් කළා, ඡන්දය දීම සඳහා බස් රථවලින් ගමන් කළ ඡන්දදායකයින්ගෙන් මුදල් අය කළේ නැත, එක් පුද්ගලයකු විසින් එසේ ගමන් කළ මගීන් සියලු දෙනාටම සවස් කාලයේදී මුදල් ගෙව්වාය කියා. මා සතුටුයි කියන්නට, වැරදි දෙයක් කළොත් කවර පක්ෂයෙන් කළත් එය වැරදි බව. නමුත් ඔය සඳහන් කළාට වඩා වැරදි දේවල් පැරණි කාලයේදී—පසුගිය ආණ්ඩු කාලයේදී—සිද්ධ වුණු බව මතක් කර දෙන්න කැමතියි. කිසිම සතයක්වත් නොගෙවා මගීන් බස් රථවල ගෙන ගිය බවත් පසුව එසේ ගෙන ගිය මගීන් වෙනුවෙන් මුදල් ගෙවන්න පවා සූදානම් වුණු බවත් මේ අවස්ථාවේදී විරුද්ධ පක්ෂයට මතක් කර දෙන්න කැමතියි.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
You are justified in your action?

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
Two wrongs do not make a right.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
මෙවැනි ක්‍රියා නිවැරදි යයි කියනවා නොවෙයි. චෝදනාවක් කරන විට, වීදුරු ගෙවල්වල සිට ගල් ගැසීම හොඳ නැති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. එච්. ජයවර්ධන]

බව පමණක් මතක් කරන්නටයි තියෙන්නෙ. මම කිසිවකුට චෝදනා කළේ නැහැ. නැගූ චෝදනාවලට උත්තර දීම පමණයි මම කරන්නෙ.

ඒ අතරම පොදු සේවා කොමිෂන් සභාව ගැනත් මතක් කළා. පොදු සේවා කොමිෂන් සභාවේ නියෝජිතයන්——

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

What about C. T. B. directors ?

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

අපි අනුගමනය කළෙත් එම ප්‍රතිපත්තිය බවට ගරු අගමැතිතුමා උත්තර දුන්නා. එම නිසා ඒ ගැන යමක් කියන්න මම යන්නෙ නැහැ. කරවල කුමාරයන් වැඩ කළ ආකාරය ගැන තමුන්නාන්සෙලාට මතක ඇති. තොග වෙළඳ ආයතනවල අධ්‍යක්ෂවරුන් වෙනත් තැන්වල අධ්‍යක්ෂවරුන් පත් කළ ආකාරය ගැන, මුලසුන ගෙන වැඩ කළ ආකාරය ගැන, මම මතක් කරන්න වුවමනා කරන්නෙ නැහැ. මේ කටයුතු හරියයි කියනවා නොවෙයි. අපි මේ වැරදි නතර කරන්න තමයි මැතිවරණයෙදි——

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

C. W. E. employees were also given the right to work in the elections.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

නතර කරන්න තමයි තමුන්නාන්සෙලාගේ සහයෝගය අපි ඉල්ලා සිටින්නෙ.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

නතර කළේ නැහැ.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

Now you do not allow C. T. B. employees.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

අපි ගෙනෙන යෝජනා පිළිගත්තා නම් මේ කාරණය ඉක්මනින් අවසන් කර ගන්න තිබුණා.

ඇත්ත වශයෙන්ම පොදු සේවා කොමිෂන් සභාවේ නියෝජිතයින් සම්පූර්ණයෙන්ම දේශපාලනයෙන් තොරව පත් කරන්න පුළුවන් නම් පෞද්ගලික වශයෙන් මම සතුටු වෙනවා. විරුද්ධ පක්ෂයත් අපත් සියලු දෙනාමත් එසේ කරන්න උත්සාහ කරන්න ඕනෑ. නමුත් තමුන්නාන්සේලා දන්නව පත් කර තිබෙන පුද්ගලයන් ගැන; නම් වශයෙන් කියන්න වුවමනා කරන්නෙ නැහැ. එයින් එක් මහත්මයෙක් මා සමග එකට මහනුවර ත්‍රිත්ව විද්‍යාලයේ ඉගෙන ගත් නිසා ඒ අයගේ ක්‍රියා පටිපාටිය ගැන කියන්න කැමති නැහැ; නමුත් සියලු දෙනාම පිළිගන්නවා දේශපාලන භූමියේ සිට පසුව ඒ තනතුරුවලට පත් කළාය කියන කාරණය. පොදු සේවා කොමිෂන් සභාවේ රෙගුලාසි අනුව එවැන්නක් අවලංගු නැති බවත් මහර ගරු මන්ත්‍රීවරයාට විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මතක් කර දෙන්න කැමතියි.

පොදු සේවා කොමිෂන් සභාව ගැන කථා කරන අවස්ථාවේදී එක් නියෝජිත මහත්මයකුගෙ භාර්යාවක් දේශපාලන කටයුතු කළාය කියන චෝදනාවකුත් එල්ල වුණා. මගේ ආසනයේ සිදුවුණු එක්තරා සිද්ධියක් ගැන මා මේ අවස්ථාවේදි මතක් කරන්ට කැමතියි. මාලබේ කියන ගමේ උප තැපැල් කාර්යාලය භාරව සිටි කාන්තාව මුදල් වංචා කළාය කියන චෝදනාවක් උඩ සේවයෙන් අස් කළා. ඒ තීරණයට විරුද්ධව ඇය පොදු සේවා කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කළ නමුත් එයත් නිෂ්ප්‍රභ වුණා. නැවත රක්ෂාව ලබා දෙන්න යයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා ළඟට ඇවිත් මගෙන් ඉල්ලා සිටියම මා ඇයට කිව්ව, කුරුණෑගල පළාතේ සිටින අපේ පක්ෂයේ බලවත් කෙනෙකුගේ භායඝීවකගේත් මේ විධියේ වංචාවක් නිසා වැඩ තහනම් කර තිබෙනවය, මේක නම් කවදාවත් කරන්ට බැරි වැඩක්ය කියා. මා ඇයට කිව්ව, මට නම් කරන්ට දෙයක් නැහැ, වෙනත් මාර්ගයක් හොයාගන්න කියා. පුදුමයකට වගේ යළිත් වරක් ඉදිරිපත් කරන ලද පෙත්සමක් උඩ ඇයට අවුරුදු 2 ක පමණ හිඟ වැටුප් ද සහිතව නැවතත් රක්ෂාව ලැබුණ. මා අහනව, මේ කාරණය හරිද කියා. අප සියලු දෙනාම උත්සාහ කරන්ට ඕනෑ, දැනට තිබෙන නීති සංශෝධනය කර දේශපාලනයෙන් තොරව, ශ්‍රෙෂ්ඨාධිකරණයට විනිශ්චයකරුවන් පත් කරන්නා වගේ, පොදු සේවා කොමිසන් සභාවට සාමාජිකයන් පත් කරන්න.

මේ අවස්ථාවෙදි මා විශේෂයෙන් කථා කරන්නෙ, බෙන්තර-ඇල්පිටියෙ අතුරු මැතිවරණ කටයුතු සම්බන්ධවයි. මේ අතුරු මැතිවරණ කාලයේදී බෙන්තර-ඇල්පිටිය ඡන්දදායක කොට්ඨාශයේ එකම රජයේ සේවකයෙකුගේවත් වැඩ තහනම් කළේවත්, එකම රජයේ සේවකයකු මාරු කළේවත් නැහැ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
What is that ?

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
Nobody was transferred and nobody was interdicted during the period of the election.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)
C.T.B. employees were not Government employees.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
I am talking about Government employees.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
That was only in Bentara-Elpitiya.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)
In Balangoda it was a different matter.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
අනික් කොට්ඨාශ ගැන මා දන්නෙ නැහැ.

ගරු කථානායකතුමනි, 1964 දෙසැම්බර් මාසෙ 3 වැනිදා සිට 1965 මාර්තු මාසෙ 21 වැනිදා අතර කාලය තුළ දොස්තර මහත්වරුන්, ඇටෙන්ඩන්ට්වරුන් හා වින්නඹු සේවකයන් එකසිය ගණනක් මාරු කර තිබුණු බව මා සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් පත් වූ අවස්ථාවේදී දැන ගන්ට ලැබුණ. මේ කාරණා එකක් දෙකක් මා මතක් කළේ අපට චෝදනා නැගූ නිසයි.

මහර ගරු මන්ත්‍රීතුමා (එස්. කේ. කේ. සූරියාරච්චි මයා.) විශේෂයෙන් මතක් කළා, 23 වැනිදා රාත්‍රියේ හැර අනික් දින වල ඒ අතුරු මැතිවරණ කටයුතු සියල්ලක්ම කිසි කරදරයක් නැතුව ගෙන ගියාය කියා. 23 වැනිදා මැතිවරණයට කලින් දිනයයි. ගරු මහර මන්ත්‍රීතුමා කිව්ව, ඡන්ද ඒජන්තවරුන්ට උපදෙස් දෙන්ටයි රාත්‍රියේ ගියෙ කියා. 23 වැනිදා රැස්වීම් තැබීම තහනම් කර තිබුණු බව තමුන්නාන්සේ දන්නව. එම නිසා එදා දාවල් කාලයේ උපදෙස් දෙන්ට යන්ට ඕනෑ තරම් කල් වේලා තිබුණ. අපේ පැත්තට වැඩ කළ උදවිය තුළ ලොකු භයක් තිබුණ—ඒ භය වැරදි වන්ට පුළුවනි—රාත්‍රියේ යම් පිරිසක් ඇවිත් සල්ලි බෙදන්ට ඉඩ තිබෙනවය කියා. [බාධා කිරීමක්] අන්න ඒ කාරණය නිසා තමයි පොල් කොට දමා පාරවල් අවහිර කරල හොරුන් අල්ලන්ට උත්සාහ කළේ. ඒ මන්ත්‍රීතුමාම පිළිගත්ත, රාත්‍රී 11 ටයි ගියෙ කියා. වතුර ටිකක් බොන්ට ගෙදරකට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. එච්. ජයවර්ධන]

ගියා කියලත් කියන්ට පුළුවන්. [බාධා කිරීමක්] තුන් හතර පොළක ඡන්ද ඒජන්තවරුන් එක ගෙදරකට ගෙන්වා ගෙන උපදෙස් දුන්නා නම් ඒක පිළිවන්ට පුළුවන් මෙවැනි ක්‍රියාවක් කරන්ට පුද්ගලිකව උපදෙස් දුන්න නම්—

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

කීප දෙනකු එක තැනකට කැදෙව්ව කියල කිව්ව.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

අනික් අය පොලීසියට ගියා කිව්ව. තවත් පිරිසක් දිව්වය කිව්ව. කාරණාව ඇත්ත වන්ට පුළුවන්. උපදෙස් දෙන්ට ගියා වෙන්ට පුළුවන්. එහෙත්, අපේ පැත්තෙ උදවිය තුළ අවංක භයක් ඇති වන්ට පුළුවන්, මෙවැනි ක්‍රියාවක් කරන්ට ඉඩ තිබෙනවය කියා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

හරි වැඩක්, පාරෙ යන්නත් බෑ.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

නැහැ, නැහැ. පාරෙ යන එක වෙනම වැඩක්.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

ඇයි එහෙනම් අවහිර කළේ ?

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

ඔව්, පාරෙ තමයි අවහිර කළේ. ඒ අය ගෙදරකට ගිහින් එන ගමන්. [බාධා කිරීම්] ඊට ප්‍රථම දවසෙ අපේ රැස්වීමක් පැවැත්වෙද්දී දඹදෙණිය ගරු මන්ත්‍රීතුමා (ආර්. ජී. සේනානායක මයා.) ඒ අසළින් ගමන් කළා. කිසිම අවහිරයක්, කරදරයක් තබා හූ ශබ්දයක්වත් ඇති නොකර ඒ මහතාට ගමන් කරන්ට ඉඩ ලැබුණා. 23 වැනිදා රාත්‍රියෙ යම් සිද්ධියක් වුණා නම් එය අගමැතිතුමාගෙ නියමයක් අනුව එහෙම නැත්නම් පක්ෂයෙ වෙනත් නායකයකුගෙ නියමයක් අනුව වුණු දෙයක් හැටියටයි, මහර ගරු මන්ත්‍රීතුමා (සූරියාරච්චි මයා.) තම කතාවෙන් හැඟෙව්වෙ. ඇත්ත වශයෙන්ම කිසිම නියමයක් තිබුණෙ නැහැ. අපි සැම දෙනාටම කිව්වෙ ඡන්ද විමසීම ඉවර වන තුරු සාමකාමීව, ඉවසීමෙන් වැඩ කරන්ට කියායි. මේ කාරණා නිසා මම ආඩම්බර වෙනව—[බාධා කිරීම්]

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

බලන්ගොඩ ඒ තත්ත්වය තිබුණෙ නැහැ.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

බලන්ගොඩ ගැන මම දන්නෙ නැහැ. බෙන්තර-ඇල්පිටිය ගැන කළ චෝදනාවලටයි, මම උත්තර දුන්නෙ.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

මුදල් ඇමතිතුමා එහෙ හිටිය.

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

මම හිතන්නෙ, කිසිම කලබලයක් වුණේ නැහැ.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

අපි කියන් නම්, වෙච්ච ඒව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
කිසිම කලබලයක් වුණේ නැහැ. මම එහෙ දවසක් හිටිය—[බාධා කිරීම්]

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
ඇත්ත වශයෙන්ම බෙන්තර-ඇල්පිටියෙ ගරු මන්ත්‍රීතුමාට මම ප්‍රශංසා කරන්ට කැමතියි. එතුමා ඉතා සාමකාමී අන්දමට මැතිවරණ කටයුතු සියල්ලක්ම කළා. අපි එතුමා දැක්ක; එතුමාට කථා කළා. ඒ වාගේම මැතිවරණ කටයුතු කරන්ට ආ විරුද්ධ පක්ෂයෙ ගරු මන්ත්‍රීවරු—බද්දේගම ගරු මන්ත්‍රීතුමා (නීල් ද අල්විස් මයා.) මහර ගරු මන්ත්‍රීතුමා—දවල් කාල යෙත්, රාත්‍රිකාලයෙත් නොයෙක් අවසථා වල අපට මුණගැසුණ. ඒ අය ඉතා හොඳින් අප සමග කථා කර ගිය බව විශේෂයෙන් මතක් කරන්ට කැමතියි. ඒ විදිය එයි, මැතිවරණ කටයුතු කරන්ට අපි උත්සාහ කළේ.

මේ මැතිවරණයෙන් දිනීම ගැන අපි පුදුමවන්නෙ නැහැ. ඒ ගැන අපි සන්තෝෂයි.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)
අපිත් සන්තෝෂයි—[බාධා කිරීම්]

**ගර එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
පුදුමවන්නෙ නැහැයි කියන්නෙ, මෙන්න මේ කාරණා නිසයි: ගුරුවරුන් 600 ක් වැඩ කළාය කිව්ව. "ඇත්ත" පත්‍රයේ "ජනදින" පත්‍රයේ දැන්වීම් දාල පෙන්වා ගත්, රජය විසින් පලිගත් ගුරුවරු 600 ක් පැල් බැඳගෙන වැඩ කළාය කිව්ව. ඒ නිසයි, අපි පුදුම වන්නෙ නැත්තෙ. විශේෂයෙන් බෙන්තර-ඇල්පිටියෙ ගරු මන්ත්‍රීතුමාට කියන්ට ඕනැ—මේව කියන්නෙ, අපි පැරදුණ නිසා නොවෙයි—ගියවර ඒ ආසනයට තුන් දෙනෙක් තරඟ කළ බව. එක් කෙනෙක් මහජන එක්සත් පෙරමුණෙන් තරඟ කළා. ඒ තැනැත්තාට ඡන්ද එක්දහස් ගණනක් ලැබුණ. ඊට පෙර බෙන්තර-ඇල්පිටියෙ ගරු මන්ත්‍රීතුමා හිටියෙ මහජන එක්සත් පෙරමුණෙයි. සමහර විට ඒ ඡන්ද සියල්ලම බෙන්තර-ඇල්පිටියෙ මන්ත්‍රීතුමාට ලැබෙන්ට ඇති, නමුත් ඇත්ත වශයෙන්ම බැලුවොත් බෙන්තර-ඇල්පිටිය ඡන්දදායකයන් 55,000 ක් පමණ සිටින විශාල ආසනයක්. ඒ අනුව බලන විට සියයට 2ක වෙනසක් පමණයි, ඇති වී තිබෙන්නෙ.

මේ මැතිවරණ නීති සංශෝධනය ගැන කථා කළ ගරු මන්ත්‍රීවරු කාරණා කීප යක් මතු කළා. ඒ ගැන අපි එකඟ වෙනව. විශේෂයෙන් මම එකඟ වෙනව, මැතිවරණ වියදම් සම්බන්ධයෙන් දැක්වූ අදහස් ගැන. මම කැමති නැහැ, ගරු මන්ත්‍රීවරු බොරු දිවුරුම් පෙත්සම් දී තිබෙනවායයි කියන්න. නමුත් මැතිවරණ කොමසාරිස්තුමාගෙ වාර්තාව දිහා බැලූ වාම පෙනෙන්නෙ, රුපියල් 2,000 කට වඩා වියදම් කළ මන්ත්‍රීවරයෙක් උන් නොත් එහෙමත් කෙනෙක් බවයි. අද පවතින කඩදාසි මිළ අනුව බැලුවාම ඡන්ද කාලෙ මුද්‍රණය කරන ලියකියවිලිවලටත්, ශබ්ද විකාශන යන්ත්‍ර ආදියටත් රුපියල් 2,000 කට වඩා වියදම් වෙනව.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)
Most of them are below Rs. 2,000 ?

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
I said, it is surprising that most of them are below Rs. 2,000. මේ ගණනට වඩා වියදම් නොකළ බොහෝ මන්ත්‍රීවරු ඇති. නමුත් කවුරුත් පිළිගන්නෙ නැහැ. එය රුපියල් 5,000 ක් නොවෙයි—[බාධා කිරීම්] නමුත් ඡන්ද නීතිය—[බාධා කිරීම්]

**වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාතන්** (නල්ලූර්)
*(டொக்டர் ஈ. எம். வீ. நாகநாதன்—நல்லூர்)*
(Dr. E. M. V. Naganathan—Nallur)
The rest was foreign aid.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

I did not spend. The party spent more than Rs. 2,000.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

He must be speaking about himself.—[*Interruption*].

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

D. M. K. money ? Why did you not come and speak at election meetings ? You speak only here.

ගරු එම්. ඩී. එච්. ජයවර්ධන
(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)
(The Hon. M. D. H. Jayawardena)

විශෙෂයෙන්ම ඡන්ද වියදම් ගැන පැහැදිලි විස්තරයක් අවශ්‍ය බව මතක් කළ යුතුව තිබෙනව. තමන්ගේ මුල් දේශපාලන පක්ෂය තමන් වෙනුවෙන් යම් දෙයක් වියදම් කළා නම් ඒ වියදම් සඳහන් කරන්නෙ කොහොමද ? වෙනත් කෙනෙක් තමන් නොදන වියදම් කළා නම් ඒ වියදම් සඳහන් කරන්නෙ කොහොමද, යනාදි වශයෙන් නොයෙක් ප්‍රශ්න නඟන්න පුළුවන්. එම නිසා ඒ කරුණු සම්බන්ධයෙන් ඉතා පැහැදිලි ලෙස සංශෝධනයක් ඇති කරනවා නම් සෑම මන්ත්‍රීවරයකුටම එය ප්‍රයෝජනවත් වේවිය කියා මම කල්පනා කරනව. ඒ ආකාරයෙන් පැහැදිලි නොකළොත්, මේ වර මැතිවරණයෙන් ඉදිරිපත් වුණ ඡන්ද පෙත්සම් සංඛ්‍යාව 43 වෙනුවට මම කල්පනා කරනවා ලබන වර ඡන්ද පෙත්සම් සංඛ්‍යාව එක සිය හතළිස් ගණනක් වෙන්නට ඉඩ ඇත කියා. ඒ නිසා විශේෂයෙන් ඡන්ද වියදම් ගැන පැහැදිලි සංශෝධනයක් අවශ්‍යමයි.

ඊ ළඟට කොඩි එල්ලීම පිළිබඳ ප්‍රශ්නය ගැන බලන විට, අද බොහෝ දෙනෙක් එල්ලන්නෙ එක්කො බෞද්ධ කොඩියක් නැත්නම් ජාතික කොඩියක්. ඒවා කවුරුත් ගළවාගන්නෙ නැති නිසා ඒවා එල්ලනව. ඒ නිසා ඒ සම්බන්ධයෙනුත් පැහැදිලි විස්තරයක් අවශ්‍ය වෙනව. සම්පූර්ණයෙන්ම කොඩි තහනම් කරනවද, එසේ නැත්නම් තමන්ගෙ සලකුණ පමණක් ඡන්ද පොළවල එල්ලන්න නියම කළොත් දැනට තිබෙන නීතියට වඩා හොඳද, යන ප්‍රශ්නය ගැනත් සලකා බැලීම අවශ්‍ය ය කියා මම පිළිගන්නව.

ඊ ළඟට ගමනාගමනය පිළිබඳව බලන විට, රථවාහනවලින් යාම තහනම් කර තිබෙනව. අද නීතියේ හැටියට තහනම් කර තිබෙන්නෙ තමන්ගෙ පෞද්ගලික රථවාහනවලින් යාම පමණයි. නමුත් කුලී රථවලින් යාම ගැන කිසිම තහනමක් නැහැ. තමන්ගෙ මුදල් ගෙවා—

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

එහෙම යන්න බැහැ. තහනම්.

ගරු එම්. ඩී. එච්. ජයවර්ධන
(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)
(The Hon. M. D. H. Jayawardena)

මම දන්න හැටියට—public transport, passenger transport and hiring vehicles.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Not hiring vehicles, only the C.T.B. and the Railway.

කෙනමන් මයා.
(திரு. கெனமன்)
(Mr. Keuneman)

And the passenger transport service of the Colombo Municipal Council.

ගරු එම්. ඩී. එච්. ජයවර්ධන
(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)
(The Hon. M. D. H. Jayawardena)

I stand to correction එපමණක් නොවෙයි. රථවාහනවලින් යාමේ පහසුව රෝගීන්ටද සලස්වා තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
අවසරයක් ඇතිව.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டி. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
ඔව්, අවසරයක් ඇතිව. ඒ සඳහා සුමානෙකට කලින් අවසරයක් ගන්න ඕනෑ. මම කල්පනා කරනවා ඒ සඳහාත් ඊට වඩා පහසු ක්‍රමයක් සැලැස්විය යුතුයි කියා. ඒ පිළිබඳව විමසා බලා අවසර දීම ප්‍රදේශයේ පොලීසියට භාර කරන්න පුළුවන්. ඒ මොකද ? දැනට තිබෙන නීතිය අනුව රෝගියකුට වාහනයකින් යාම සඳහා දවස් හතකට කලින් අවසරයක් ලබාගත යුතුව තිබෙනවා. නමුත් සමහර විට හදිසියේ අසනීප වන අවස්ථා තිබෙන්න පුළුවින්. එවැනි අවස්ථාවකදී පොලීසියෙන් අවසර ලබා ගැනීමට බලය දුන්නොත්—

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
පොලීසියට යන්න බයයි.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டி. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
ඒ, ඒ කාලෙ වෙන්න ඇති.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
නැහැ, දැනුයි බය.

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ள)*
(Mr. T. B. Tennekoon—Dambulla)
ජනෙල්වලින් දාන නිසා.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டி. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)
ඒවාගේම ඡන්ද පත්‍රිකා සම්බන්ධවත් කල්පනා කර බැලිය යුතුව තිබෙනවා. නමුත් නාන්සේලා දන්නවා ඇති, ඒ ඒ ඝණ්ඩවලට හිතවත් අය ඒ ඒ අපේක්ෂකයින්ගෙ අනුදැනීම නැතිව අනික් පක්ෂවලට අපහාස වන විධියට—ඒ කියන්නෙ තමන්ගෙ අපේක්ෂකයාට ප්‍රයෝජනවත් වේයයි සලකා—නොයෙකුත් පත්‍රිකා විසුරුවා හැරීමේ සිරිතක් තිබෙන බව. එවැනි ප්‍රචාරය කිරීම්ද නැවැත්වීමටත් නීතියක් තිබිය යුතුය කියා මම කල්පනා කරනවා. එවැනි දේ නිසා ඡන්ද පෙත්සම් මගින් යම් කෙනකුගෙ ආසන අහිමි වන තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්.

ඊ ළඟට සැලකිය යුතු තවත් කාරණයක් නම් ඒජන්සි මාගීයෙන් තමුන් වෙනුවෙන් කරන වැඩවලට තමන්ට උත්තර දීමට සිදුවීම පිළිබඳ ප්‍රශ්නයයි. එය ඉතාමත් භයානක ප්‍රශ්නයක් වී තිබෙනවා. තමන් පෙනී නොසිටින රැස්වීමක තමන්ගෙ ආසනයෙ, තමන්ගෙ වේදිකාවක, තමන් නොදැන තමන්ගෙ විරුද්ධවාදියෙක් කථාවක් කළොත්, එය තම ආසනය අහිමි වීමට හේතුවක් වෙන්න පුළුවන්. ඒ නිසා ඒජන්සි නොහොත් තමන් වෙනුවෙන් කරන වැඩ සම්බන්ධයෙන් පැහැදිලි විස්තරයක් අවශ්‍ය බව ගරු මන්ත්‍රීවරුන් කවුරුත් පිළිගන්නව ඇති.

කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් මීට වඩා කාලය ගැනීමට මම අදහස් කරන්නෙ නැහැ. එක්සත් ජාතික පක්ෂය කෙළේ මැතිවරණ සංශෝධනයක් අවශ්‍ය බව මහජනතාවට ඔප්පු කිරීමටයි. ඒ විශෙෂයෙන්ම මේ සංශෝධනය ඉදිරිපත් වාගේම විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් කීප පළක් විසිනුත් ඒක පිළිගෙන තිබෙනවා. නමුත් අවාසනාවකට වාගේ විරුද්ධ පක්ෂයේ සමහර මන්ත්‍රීවරු කථා කිරීමේදී බොහෝම චෝදනා නැගුව. එම නිසා ඒ චෝදනාවලට පිළිතුරු දීම මේ අවස්ථාවෙදි කළ යුතුම බව මට පෙනී ගිය නිසයි මේ විස්තරය කරන්න හේතු වුණේ. විශෙෂයෙන්ම බෙන්තර-ඇල්පිටිය ඡන්ද වැඩ කටයුතු භාරව ක්‍රියා කළ සංවිධායකයා වශයෙන් මා මෙයට පිළිතුරු නොදුන්නා නම් ඒ චෝදනා පිළිගත් හැටියට හිතන්න ඉඩ තිබෙනවා. එම නිසා ඒ චෝදනා අසත්‍ය බව මම නැවතත් මතක් කරන්න කැමතියි. එම මැතිවරණය ඉතාම සාමකාමීව සිද්ධ වුණා. ඒ අපෙක්ෂකයා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. එච්. ජයවර්ධන]

එකම රැස්වීමකදීවත් එකම අපහාසාත්මක වචනයක්වත් ප්‍රකාශ නොකළ බව සඳහන් කරන්න කැමතියි. ඒ බව මේ මන්ත්‍රීතුමාත් පිළිගත්තා. ඒ මන්ත්‍රීතුමා කිව්වා, එක තැනක ඇරෙන්න—අධිකරණ ඇමතිතුමා පැමිණි රැස්වීමක ඇරෙන්න—අනික් සෑම ඡන්ද පොළකදීම අපි ඒ විධියට ක්‍රියා කර තිබෙනවාය කියා. අනෙක් මැතිවරණ කොට්ඨාශවලත් ඒ විධියටම මැතිවරණ පැවැත්වුණා නම් මුළු ලංකාවෙම මැතිවරණ ඉතාමත් සාමකාමීව පැවැත්වුණාය කියා අපට සතුටු වීමට පුළුවනැයි මා කල්පනා කරනව. එතකොට සුදුස්සා හැටියට තම තමන් කල්පනා කරන කෙනකුට තමන්ගෙ ඡන්දය දී තමන්ගේ නියෝජිතයා පත් කර ගැනීමට අවස්ථාවක් මේ රටේ බහුතර ජනතාවට ලැබෙනව. එසේ කිරීමට අවස්ථාවක් ලබා දීම අප සියලු දෙනාගේම යුතුකමක් බව විශේෂයෙන් මතක් කරන්න කැමතියි. මීට වඩා කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ.

බෙන්තර-ඇල්පිටියෙ ගරු මන්ත්‍රීතුමා (කාරියවසම් මයා.) වෙත මගේ සතුට මේ අවස්ථාවේදී විශේෂයෙන්ම ප්‍රකාශ කරන්න කැමතියි. මක්නිසාද, ඒ මහත්මයාගේ සහයෝගය අපට නොයෙක් අවස්ථාවලදී ලැබුණා. ඒ වගේම අපේ සහයෝගයත් එතුමට සෑම අවස්ථාවකදීම පාහේ ලැබුණු බව මතක් කරමින් මගේ කථාව මෙයින් අවසන් කරනව.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I am sure hon. Members will agree that the matter has been sufficiently debated. Since there is agreement between all parties, shall I put the Question to the House?

**සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

There are one or two more speakers. I too wish to speak.

අ. භා. 2.54

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

ගරු කථානායකතුමනි, අපරටේ සාමාන්‍ය ජනතාව වෙත සමානාත්මතාවය පිළිබිඹු වන ආකාරයට ලැබී තිබෙන එකම බලය තමයි ඡන්දය. එම නිසා මැතිවරණ පවත්වන වේලාවලදී හැකි තරම් දුරට සමානාත්මතාවෙන් තම තමන්ගේ අදහස් අනුව තමන්ගේ කැමැත්ත ප්‍රකාශ කිරීමට ඉඩ ප්‍රස්තාව සලසා දීම ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන අප කවුරුත් අගය කරන්නකැයි මා විශ්වාස කරනව. ඒ වගේම ක්‍රමක්‍රමයෙන් අපේ මැතිවරණ හොඳ අතට හැරීගෙන එනවායයි අපට තරමක් සන්තෝෂ වෙන්නත් පුළුවනි. මැතිවරණ පනත 1956 න් පසු සංශෝධනය කරනු ලැබුවා. එහෙත් එය සංශෝධනය කරන්න ඉස්සර වෙලා බොහෝ දෙනකුට මැතිවරණයකට මුහුණ දීම ඉතාමත් අසීරු කාරණයක් වුණා. ඒ කාලයේ සාමාන්‍ය කෙනකුට මැතිවරණයකට මුහුණ දීම ඉතාමත් අසීරු කාරණයක්ව තිබුණු බව අප කවුරුත් පාහේ දන්න දෙයක්. මේ රටේ දේශපාලනය සම්පූර්ණයෙන්ම ධනවත් කොටස්වලට තමන්ගේ නම්බුව රැකීම පිණිස සීමා වූවක් හැටියටයි ඒ කාලයේදී තිබුණේ. ඒ එවකට මේ රටේ දේශපාලනය සම්බන්ධයෙන් පැවැති තත්ත්වයයි. එහෙත් 1956න් පසු රටේ පොදු යහපත ගැන හැඟීමක් ඇති, තමන්ගේ එම හැඟීම ක්‍රියාත්මක කිරීමේ රුචියක් ආශාවක් ඇති කෙනකුටත් දේශපාලනයේ ප්‍රමුඛස්ථානයක් අරගෙන වැඩ කරන්නට අවස්ථාවක් ක්‍රමක්‍රමයෙන් ලැබී තිබෙන බව සතුටින් මතක් කරන්න ඕනැ.

පසුගිය කාලවල ඇති වූ මැතිවරණවලදී නොයෙක් නොයෙක් බලපෑම් බහුල වශයෙන් නොයෙක් නොයෙක් පැතිවල ඇති වූ බව කියැවුණා. එවැනි තත්ත්වයක් තිබීම ගැන අප කනගාටු වෙනව. හැම අවස්ථාවකදීමත් අපට ආණ්ඩුව පැත්තෙන් අහන්න ලැබෙන කථාවක් තමයි—ගරු අගමැතිතුමාගේ කථාවෙනුත් සෞඛ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගේ කථාවෙනුත් කියැවුණා—එවැනි දේවල් තමන් අනුමත කරන්නේ නැතැයි යන්න. එහෙත් ඔය ඇත්තන් මේ පැත්තේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉන්න කාලයේදී පවත්වන ලද අතුරු මැතිවරණවලදී වුණේ කුමක්දැයි විමසිය යුතුව තිබෙනවා. මෙන්න මේ විධියේ බල පෑම් තිබුණාය, පොලිසිය මෙන්න මේ මේ දේ කළාය, රථවාහන මෙන්න මේ ආකාරයට පාවිච්චි කළාය, ලංගමයේ බස්රථ මේ අන්දමට යෙදෙව්වාය, පෞද්ගලික ලොරි මේ විධියට පාවිච්චි කළාය ආදී වශයෙන් කියා තිබෙනවා. ඒ කාලයේ ඇති වූ මහා මැතිවරණවලදීත් අතුරු මැතිවරණවලදීත් මෙවැනි දේ සිද්ධ වුණාය කියනවා. බොහෝ විට අප සෑම ප්‍රශ්නයක්ම පාහේ නිරාකරණය කරන්න හදන්නෙ කළ වරදට වඩා බරපතල තවත් වරදක් කරලයි. අද ආණ්ඩුවේ ඉඳගෙන හැම ප්‍රශ්නයකටම පිළිතුරු දෙන්න හදන්නෙ, නුඹලා ඒ වරද කළ නිසයි අපත් ඒ වරද කරන්නෙ යන හැඟීම ඇති වන ආකාරයට කථා කරමිනුයි, ක්‍රියා කරමිනුයි. අප අපේ රටේ ජනතාවගේ ශුභසිද්ධිය තකා වැඩ කරන්න ඕනෑ. ඒ අයගේ ආරක්ෂාව සලසා දෙන්න ඕනෑ. ජනතාව බලාපොරොත්තුවන යුතුකම් ජනතා නායකයන්ගෙන් ඉෂ්ට වෙනවා නම් එය ජනතාවගේ සෑනසීමට කරුණක් වෙනවා. ඒ සෑනසීම ලැබෙන්නට නම් කවුරුන් හෝ වේවා වරදක් කළොත් ඒ වරද ඇත්ත වශයෙන්ම වරදක් හැටියට පිළිගෙන ඒ වරද නැවතත් වරක් නොකරන්නට ඉටාගත යුතුව තිබෙනවා. නායකත්වය යන්නෙන් බලාපොරොත්තු වන්නේ එය බව පිළිගන්න ඕනෑ. "ඔයගොල්ලො කළේ කොහොමද" කියන ප්‍රශ්නය ගරු අගමැතිතුමාගෙන් හා ආණ්ඩු පක්ෂයේ ඉස්සරහ පෙළේ සිටින අයගෙන් නිතරම අසන්නට ලැබෙනවා. "ඔයගොල්ලො අවුරුදු 9ක් තිස්සේ මේ මේවා කළේ නැද්ද" කියා අපෙන් ප්‍රශ්න කරනවා. ඔය කථාව නවත්වන්නට තවම කාලය පැමිණියේ නැද්ද කියා මා අහන්න කැමතියි. යම් කෙනෙක් යම් අවස්ථාවක යම් වරදක් කර තිබෙනවා නම් එය ඔප්පු කිරීමට අපි එය හරි විධියට කළ යුතුව තිබෙනවා. යම් කෙනෙක් යම් වරදක් කළා නම් එය වරදක් බව ඔප්පු වන්නේ එතකොටයි. ඇතැම් විට බලය තිබෙන පැත්තෙන් බලපෑම් ඇති වන බව අපි දන්නවා. ලොකුම යුතුකම එය වැළැක්වීම බව අපි කියන්න ඕනෑ.

පසුගිය දවස්වල අතුරු මැතිවරණය තිබුණු ප්‍රදේශවල අඩුවක් නැතිව බඩුමුට්ටු බෙදුණාය කියන එක අපට අහන්නට ලැබුණා. ඒ අතුරු මැතිවරණ පැවැති ප්‍රදේශවල රජයේ සේවක නිලධාරීන්ගේ ගෙවල්වලට විරුද්ධ පාර්ශ්වයේ අය යන විටත් ඔවුන් පසු වුණේ ලොකු බයකින් හා භීතියකිනුයි. නිදසුනක් පෙන්වා දෙන්නට පුළුවන්. ගරු අධ්‍යාපන ඇමතිතුමාත් මෙහි සිටීම ගැන මා සන්තෝෂ වෙනවා—ඉස්කෝලෙ මහත්වරුන් මේ අප සමග කථා කළේ ප්‍රසිද්ධියේ එහෙම නොවෙයි.

**ජී. ජේ. පාරිස් පෙරේරා මයා. (ජාඇල)**
*(திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா—ஜா-எல)*
(Mr. G. J. Paris Perera—Ja-Ela)
හිතේ ගැස්ම ඇති නිසා.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
ඒක හරි.

**වෛද්‍යාචාර්ය නාගනාතන්**
*(டொக்டர் நாகநாதன்)*
(Dr. Naganathan)
Do you think the Hon. Minister knows all the teachers in Ceylon ?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)
ගරු කථානායකතුමනි, මා මුලින් සඳහන් කළාක් මෙන් අපේ රටේ අප හැමටම සාමානාත්මතාවයෙන් තිබෙන එකම බලය ඡන්ද බලයයි. එසේ ඡන්දය පාවිච්චි කිරීමට තිබෙන නිදහසත් උල්ලංඝනය කිරීමට බලය තිබෙන අය උත්සාහ කරනවා නම්, ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් ආණ්ඩුවක් විසින් අයුතු අසාධාරණ දේවල් කරනවා නම්, එය විශාල අපරාධයක්ය කියා මා කියනවා. එමෙන්ම අද තිබෙන මැතිවරණ නීතිය උඩ අපි ඉතා භයානක තත්ත්වයකට මුහුණ පා සිටිනවා. මා මුලින් සඳහන් කළ ආකාරයට, 1956ට පෙර මේ රටේ මැතිවරණයකට ඉදිරිපත්වීම හෝ දේශපාලනයේ ප්‍රධාන තැනක් ගැනීම මේ රටේ මුදල් ඇති, මුදල් වියදම් කිරීමේ ශක්තියක් ඇති, අයට පමණක් සීමා වී තිබුණා. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

ක්‍රමය අද වෙනත් විධියකට පරිවර්තනය වී තිබෙනව. එනම්, මැතිවරණ නීතිරීතිවල තිබෙන කඩුළු පැහැදිළි නැති නිසා සාමාන්‍ය කෙනෙක් මැතිවරණයකින් ජය ග්‍රහණය කළත් තමන් ළඟ විශාල ධනස්කන්ධයක් නැත්නම් ඒ ජයග්‍රහණය ආරක්ෂා කර ගැනීමට බැරි තත්ත්වයක් ඇති වී තිබෙන බව පැහැදිලිව පෙනී යාමයි. පසුගිය මහා මැතිවරණයෙන් පසු ඇති වෙච්ච ඡන්ද නඩු නිසා කීදෙනෙක් මුදල් අතින් එහෙම අමාරු තත්ත්වය කට මුහුණ පා සිටිනවාද කියන එක තමුන්නාන්සෙත් දන්නව ඇති. ඊට හේතුව කුමක්ද? ඕනෑම වචනයක් ඕනෑම අතකට පෙරළන්න පුළුවන් විධිය ටයි, අපේ නීතිය සකස් වී තිබෙන්නෙ. ඒ අනුව හැම වෙලේම ඕනෑ වචනයක් ඕනෑ පැත්තකට පෙරළගන්න පුළුවනි. විනිශ්චය කාරයන්ට කියනව, විනිශ්චය කරන්ටය කියා. විනිශ්චය කාරයොත් විනිශ්චය කරාවි. නමුත් මැතිවරණ නඩුවකදී දුප්පත් තැනැත්තෙක් ඉදිරිපත් වුණොත් මොකක්ද වෙන්නෙ? යුක්තිය ඉටු කරවා ගන්ට නීතිඥ ගාස්තු ගෙවන්න ගිය තැනදී එවැනි අයගෙන් බොහෝ දෙනාට දේශපාලනය පැත්තකට දමා අයින් වී සිටින්න කල්පනා වෙනව ඇති.

යම් ක්‍රියාවක් තහනම් කරනව නම් එය සම්පූර්ණයෙන්ම තහනම් කරන්ට ඕනෑ, නැවත වරක් එම ක්‍රියාව කොට අමාරුවෙ නොවැටෙන ආකාරයට. රථ වාහනයක් ගෙනියන්න බැහැ; කොඩියක් ගහන්න බැහැ; පත්‍රිකාවක් ප්‍රසිද්ධ කරන්ට බැහැ, යනාදි වශයෙන් කියනව නම් එය හැම අතින්ම පැහැදිලි වශයෙන් කියන්ට ඕනෑ, පොදු ජනතාව එමගින් ආරක්ෂාව ලබන්නෙ එත කොටයි. "යමක් කරන්ට බැහැ; නමුත් කරන්ට පුළුවනි" කියන තත්ත්වයට කරුණු සැලසූ විට විශාල අමාරුවකට මුහුණ දෙන්නටයි සිදු වන්නෙ. එතකොට සාමාන්‍ය පොදු මහජනයා වෙනුවෙන් ඉදිරිපත් වී ඔවුන්ගේ සහයෝගය හා කැමැත්ත උඩ ජයග්‍රහණය කර රටේ දියුණුව පිණිස යම්කිසි වැඩ කොටසක් කරන්න බලාපොරොත්තු වන උදවියට වන්නෙ කරදරයක්. මුදල් ඇති අයට නම් ඒක ඒ හැටි දෙයක් නොවෙයි. නීතිඥ ගාස්තු කොච්චර ගියත් ඒ අයට කමක් නැහැ. තමන්ගෙ වැඩේ බේරගෙන ඒ අයට අයින් වෙන්ට පුළුවනි. ජනතා සභාය, ජනතා හොඳ හිත කොපමණ තිබුණත් නීතියේ ඇති මෙවැනි දුර්වලතා නිසා, වැනෙන සුළු ගතිය නිසා, ඇදෙන සුළු ගතිය නිසා විශාල කරදරවලට පත් වන විශාල පිරිසක් සිටිනව, මේ රටේ.

මා මෙයින් අදහස් කරන්නෙ, මැතිවරණවලදී කුමන විදියක හෝ දූෂණ ක්‍රියාවක් කළයුතුය කියා ප්‍රකාශ කරන්ට නොවෙයි. මැතිවරණයකදී යම් කිසි දූෂණයක් බල පෑමක් ඇති වෙනව නම් එය සම්පූර්ණයෙන්ම නතර කළ යුතුය කියන එක අපි කවුරුත් පිළිගන්නව. සමානාත්මතාවෙන් යුතුව තමන්ගේ සිතට එකඟව කටයුතු කරන්ට අවස්ථාව සලසා තිබෙන්ට ඕනෑ. එම අවස්ථාව සලසා දීමෙදි ජනතාවට නීතියෙන් දෙන අවස්ථාව එක්කෝ නියමාකාර දෙන්ට ඕනෑ; නැතිනම් නොදී නිකම් ඉන්ට ඕනෑ; එසේ නොකොට අවිනිශ්චිත තත්ත්වයකින් කටයුතු කරන විට විශාල කරදරවලට පත් වන බව පේනව. මැතිවරණ නඩු දෙස බලන විට එය මැනැවින් පැහැදිලියි. මේ ආකාරයට කටයුතු කළොත් ඉදිරි කාලයේදී රුපියල් තිස් හතළිස් දහස නඩු සඳහා වියදම් කරන්ට තරම් ශක්තියක් නොමැතිකම හේතුකොට ගෙන බොහෝ දෙනා දේශපාලන කටයුතු සම්පූර්ණයෙන්ම අයින් කර දමා පැත්තකට වී සිටින්න සූදානම් වෙනවා ඇති. මෙහෙම නඩු කියන්ට සිදු වුණාම දේශපාලනයට බසින්ට තබා තමන්ගෙ නිදහස් ඡන්දය පාවිච්චි කරන්ටත් බැරි වෙන්ට ඉඩ තියෙනව නේද? මෙසේ වුණාම සාමාන්‍ය පුරවැසියකුට ලැබෙන අයිතිවාසිකම් පවා නැතිවන ආකාරයට නේද, කටයුතු කරන්ට සිදු වෙන්නෙ? අද තිබෙන තත්ත්වය උඩ කියන්ට තිබෙන්නෙ ඒ ටිකයි.

එම නිසා සාමාන්‍ය දුප්පත් අයට කොපමණ හොඳ හිත් තිබුණත් කොපමණ මහජන සහයෝගය තිබුණත්, දේශපාලනයට ඉදිරිපත් වෙන්ට හිතෙන්නෙ නැහැ. සල්ලි තියෙන කෙනෙක් ඇවිත් නඩුවක් දමාවිය කියා අයින් වී පැත්තකට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙලා සිටින්ටයි එවැනි අයට සිදු වන්නෙ. එම නිසා මා කියා සිටිනවා, මැතිවරණ වලදී යමක් කරන්න ඉඩ දෙනව නම් සම්පූර්ණයෙන්ම එය කරන්ට ඉඩ දෙන්න ඕනෑ බව. අතේ තියාගෙන කියවා ඉවත දමන්න පුළුවන් තරම් පුංචි කඩදාසි කෑබැල්ලක තම ප්‍රතිපත්ති මාලාව මුද්‍රණය කර ප්‍රචාරය සඳහා එය පාවිච්චි කරනවා විනා ඉන් පිටස්තර කිසිම දෙයක් මුද්‍රණය කොට බෙදා හැරීම තහනම් කරන්න නීතියක් තියෙනව නම් මා පෞද්ගලිකව ඉතාමත් කැමතියි. මැතිවරණ ප්‍රචාරක කට යුතුවලදී මා පෞද්ගලික වශයෙන් එතරම් කැමති වෙනත් කිසිම දෙයක් නෑ.

මැතිවරණ ප්‍රචාරක කටයුතුවලදි ප්‍රසිද්ධ තැන්වල දැන්වීම් ඇලවීම තහනම් බවත් පෞද්ගලික තැන්වල අලවන්න පුළුවන් බවත් දැන් කියවුණා. මේ අදහස පිළිබඳව අධිකරණය ඉදිරියෙදී නීතිඥයින්ට නොයෙක් නොයෙක් විධියට තර්ක ඉදිරිපත් කරන්න පුළුවනි. පෞද්ගලික තැනක අලවන දැන්වීම් ප්‍රසිද්ධ තැනක සිට කෙනකුට බලන්න පුළුවන් නම්, දැන්වීම අලවා තිබෙන අර පෞද්ගලික තැනත් ප්‍රසිද්ධ තැනක් වශයෙන් පරිවර්තනය කරන්න නීතිඥයින්ට පුළුවන් කම තියෙනව. ඒ පරිවර්තනය හරියයි යම් විනිශ්චයකාරයකුට වැටහුණොත් ඔහු ඒ අනුව තීන්දුව දෙයි. එම නිසා අවිනිශ්චිත විධියට, වචනවලින් නොයෙක් නොයෙක් ආකාරයට පෙරළන්න පුළුවන් අන්දමට නීතිරීතිවල කඩතොලු තිබුණොත් එයින් ප්‍රයෝජන ගන්නෙ නීතිඥයින් මිස පොදු මහජනතාවවත් මැතිවරණ සඳහා ඉදිරිපත් වන අයවත් නොවෙයි. මැතිවරණයකදි දැන්වීම් ප්‍රසිද්ධ කිරීම, දැන්වීම් ඇලවීම, කොඩි එල්ලීම, සැරසිලි කිරීම, කාර්යාල හැදීම, ප්‍රසිද්ධ රැස්වීම් පැවැත්වීම යනාදී වශයෙන් නොයෙක් දේ කරන්න සිදු වෙනව. එසේ කරන්න අවස්ථාව, ඉඩකඩ ලබා දීම පිළිබඳ නීතිරීති කෙනකුට ඒ පැත්තට මේ පැත්තට පෙරළන්න ඉඩක් නොලැබෙන විධියට සම්පාදනය කිරීම පොදු මහජනතාවගේ සමානාත්මතාව මත පවතින අයිතිය ආරක්ෂා කිරීමට ලොකු උපකාරයක් වෙනව. එසේ නැත්නම් ගරු සෞඛ්‍ය ඇමතිතුමා කිව්ව වගේ තත්ත්වයකුයි ඇති වන්නෙ.

සල්ලි කොපමණ තිබුණත් නීතිඥයින් ලබාගන්න බැරි වුණු අවස්ථා විරුද්ධ පක්ෂයේ සමහර ගරු මන්ත්‍රීවරුන්ට එළඹුණු බව මා දන්නව. එවැනි අවස්ථාවකදි ඉතාමත් භයානක තත්ත්වයකට මුහුණු දෙන්නයි අපට සිදු වන්නෙ. විශෙෂයෙන්ම සල්ලි නැති ඇත්තො හුඟක්ම ඉන්නෙ විරුද්ධ පක්ෂයෙයි. එම නිසා, මැතිවරණ ව්‍යාපාරවලදි, අයුතු බලපෑම්, දූෂණ කටයුතු වළකින අන්දමට ඒවයින් ප්‍රයෝජන ගන්න බලාපොරොත්තු වන උදවියට ඊට ඉඩක් නොලැබෙන විධියට නීති සම්පාදනය කිරීම සඳහා ගතයුතු සෑම පියවරක්ම ගැනීම ඉතාමත් ශ්‍රෙෂ්ඨ ඉතාමත් වැදගත් කරුණක්. එය අත්‍යවශ්‍යයි. එසේ නීති සම්පාදනය කිරීමෙදි එහි යෙදෙන වගන්ති ඉතාමත් පිරිසිදුව, නොයෙක් නොයෙක් අර්ථ ප්‍රකාශ කරන්න බැරි වන විධියට සකස් කිරීමත් අත්‍යවශ්‍ය බව මම මතක් කරනව. අත්දැකීම් උඩ ක්‍රම ක්‍රමයෙන් මේ නීති සංශෝධනය කිරීම අපේ සන්තෝෂයට කාරණයක්. නමුත් ඒ සමගම අපේ අවධානය යොමු විය යුතු තවත් කාරණා රාශියක් තිබෙනව.

විශේෂයෙන්ම කොඩි, ලොකු පෝස්ටර්, දැන්වීම් ආදී කලබල ඇති කරවන දේවල් අද ප්‍රදර්ශනය කරනව. ඒවාගේම යම් යම් ඡන්දදායකයින්ගේ නිදහස් භාවය නැති වන අන්දමට බලපෑම් කරන අවස්ථාත් තිබෙනව. පෙරේදා මේ ගරු සභාවේදී බණ්ඩාරවෙල වූ සිද්ධියක් ගැන සඳහන් කළා. බණ්ඩාරවෙල ගෙදරක එක්සත් ජාතික පක්ෂයෙ ලොකු පින්තූරයක් තිබුණලු. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් ගිය කෙනෙක් ඒ ගෙදරට ගිහින් ඒ ගෙදර උදවියට එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දීම හොඳ නැත කියා කරුණු අවබෝධ කරවන්ට සූදානම් වුණාලු. ඒ අවස්ථාවේදී ගෙදර සිටි අම්මන්ඩි හයියෙන් කෑගසා, අපි නම් ඡන්දය දෙන්නෙ එක්සත් ජාතික පක්ෂයට නොවෙයි, නමුත් මොකද කරන්නෙ, බලපෑම් නිසා ඔය පෝස්ටර් එක ගහන්න සිද්ධ වෙලා තියෙනව කියා කිව්වලු. සමහර විට ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

ගෙදර ඇතුලෙ ප්‍රදර්ශනය කළේ අගමැතිතුමාගෙ පින්තූරයක් වෙන්න ඇති. නැත්නම් ඡන්දාපේක්ෂකයාගේ පින්තූරයක් වෙන්න ඇති. ඒත් නැත්නම් ඒ දෙදෙනාගේම පින්තූරයක් වෙන්න ඇති. නමුත් ඒ පින්තූරය ප්‍රදර්ශනය කළේ ප්‍රසිද්ධ තැනක නොවෙයි. ගෙයකයි. එතකොට ඒ ගෙදර උදවියට යම් බලපෑමක් එල්ල කර තිබෙනව. එමනිසා හිතට විරුද්ධව වුණත් ඒ පින්තූරය තම ගෙදර ගහගෙන ඉන්න සිද්ධ වී තිබෙනව. මේ සිද්ධ වී තිබෙන දෙයක්. අද සැරසිලි කරන්නෙත් ඒ විධියටම තමයි.

ඇත්ත වශයෙන්ම මේ සැරසිලි කොඩි අවශ්‍ය නැහැ. අද මහජනතාව ඡන්දය පාවිච්චි කරන්නෙ වැඩියෙන් කොඩි තිබෙන පක්ෂය බලාගෙන නොවෙයි. ඒ වාගේම වැඩියෙන් කොඩි දෙන්න පුලුවන් පක්ෂය බලාගෙනත් නොවෙයි. ඒ වගේ ම වැඩිය හොඳට සැරසිලි කර තිබෙන, කරන්ට පුලුවන් පක්ෂය බලාගෙනත් නොවෙයි. දේශපාලන වශයෙන් හෝ වේවා, පුද්ගලයින් වශයෙන් හෝ වේවා, පොදු ජනතාවගේ දියුණුව පිණිස සේවය කිරීමේ ශක්තිය තිබෙන්නෙ කොයි පක්ෂයටද නැත්නම් කොයි පුද්ගලයාටද කියා තර්කානුකූලව කරුණු අවබෝධ කර ගෙන ඡන්දය පාවිච්චි කිරීමට තරම් අපේ ජනතාව අද බුද්ධිමත් බව මා ආඩම්බරයෙන් මතක් කරන්නට ඕනෑ. ඇත්ත වශයෙන්ම අද හුඟක් කොඩි වුවමනා වී තිබෙන්නෙ ඡන්දය දෙන ඡන්දදායකයාට නොවෙයි. ඡන්දය ඉල්ලන සමහර ඡන්දාපෙක්ෂකයින්ටයි වැඩියෙන් කොඩි වුවමනා වෙන්නෙ. මේ අන්දමට විශාල පෝස්ටර්, දැන්වීම්, කොඩි යනාදිය අද ගෙවලත් කඩසාප්පුවලත් ප්‍රදශීනය කරන්ට පුලුවන් වී තිබෙන්නෙ නීතියේ දුර්වලකම් නිසයි. දැනට තිබෙන ඇතැම් වගන්ති ඕනෑ පැත්තකට හරව ගන්න පුලුවන්. ඒ සමගම, එක්සත් ජාතික පක්ෂයේ හෝ වේවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හෝ වේවා, ලංකා සමසමාජ පක්ෂයේ හෝ කොමියුනිස්ට් පක්ෂයේ හෝ වේවා, අප කවුරුත් තරයේ සිත යොමු කළ යුතු දෙයක් තමයි දේශපාලන වේදිකාව. පසුගිය මහා මැතිවරණයෙන් පසු පැවරූ නඩු නිසා නොබෝද පවත්වන ලද අතුරු මැතිවරණවලදී දේශපාලන වේදිකාව ටිකක් හැඩ ගැසුණාය කියා මා විශ්වාස කරනවා.

දේශපාලනයට ඇපකැප වී සිටින අප දේශපාලන වේදිකාවෙන් මහජනයාට දිය යුත්තේ හරයක් ඇති කල්පනා කරන්නට පුළුවන් කාරණායි. අප දේශපාලන වේදිකාවෙන් ජනතාවට කුණුහරුප දෙන්නට යනවා නම් අප ඔවුන්ට කරන්නේ ලොකු අගෞරවයක්. පොදු ජනතාවගේ නායකත්වය දරන්නට ලැස්ති වන අය හැටියට අප ඉදිරියට එනවා නම් අපේ දේශපාලන වේදිකාව පිරිසිදුව ආරක්ෂා කර ගැනීම අප සියලු දෙනාගේම යුතුකමයි. දේශපාලන වේදිකාව පිරිසිදුව තබා ගැනීමේ වගකීම අප හැම දෙනාම භාර ගන්නට ඕනෑ. අපට වුවමනා කරන්නේ අපේ දේශපාලන වේදිකාව ජනතාවට හොඳ නරක කියා දෙන ධර්ම මණ්ඩපයක් බවට පරිවර්තනය කර ගැනීමයි. එසේ නැතිව අවස්ථාවට ගැළපෙන සේ කවුරුත් හෝ සන්තෝෂ කරගෙන අත්පොළසමක් බලාපොරොත්තුවෙන් දේශපාලන වේදිකාව මත නැඟී යම් යම් දේවල් කීම අප කාගෙනුත් නොසිදු විය යුතුයි. තාවකාලික අත්පොළසමක් ලබා ගැනීම සඳහා දේශපාලන වේදිකාව ප්‍රයෝජනයට ගන්නට ලැස්ති වීමෙන් අප අපේ ඡන්දදායකයන්ට කරන්නේ විශාල අගෞරවයක් හා අයුක්තියක් බව අප කල්පනා කරන්නට ඕනෑ. අපේ දේශපාලන වේදිකාව හැකි තරම් පවිත්‍රභාවයෙන් ආරක්ෂා කර ගැනීමට නීති සම්පාදනය වීමේ අවශ්‍යතාව ගැන අප කාගේත් සැලකිල්ල යොමු විය යුතුයි. පොදු ජනතාව වෙනුවෙන් ඉදිරිපත් වී සිටින අපේ වැදගත් යුතුකමක් වන්නේ ඒ විධියට නීති සම්පාදනය කිරීමයි.

ගරු කථානායකතුමනි, අතුරු මැතිවරණ ඉවර වෙනවාත් සමගම වාගේ මෙම යෝජනාව සාකච්ඡාවට ගැනීම ගැන අප සතුටු වෙනවා. තවත් කල් ගොස් මේ යෝජනාව ඉදිරිපත් කළා නම් සමහර කරුණු අමතක වන්නට ඉඩ තිබුණා. කරුණු අමතක වන්නට පෙර මේ යෝජනාව ඉදිරිපත් කිරීම සතුටුදායකයි. අපේ මැතිවරණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හැකි තරම් පවිත්‍රභාවයෙන් කර ගෙන යෑමට හැකි වන පරිදිත්, මුදල් හදල් නැති වුණත් අවංකභාවය තිබෙනවා නම් ජනතාවට නායකත්වය දීමට හැකි වන පරිදිත් අපේ මැතිවරණ නීති සකස් කිරීම ඉතා මත්ම වැදගත් බව ප්‍රකාශ කරමින් මගේ වචන සවල්පය අවසන් කරනවා.

අ. භා. 3.21

**එම්. එම්. මුස්තාfපා මයා. (සමාජසේවා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(ஜனாப் எம். எம். முஸ்தபா—சமூக சேவை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. M. M. Mustapha—Parliamentary Secretary to the Minister of Social Services)

It is expected that the experience gained in the last general election and in the recent by-elections would help the Government to introduce legislation which would ensure cleaner and more peaceful elections. That is why soon after the by-elections the Government has thought it necessary to introduce this Motion, and we as Members of this House should welcome the opportunity afforded by this Motion to make our suggestions and help the Government to achieve its aim. I have no doubt that this Motion would receive the support of the entire House.

I think all of us are agreed that the election law as it stands today is in need of revision and amendment in several respects.

The hon. Member for Dompe (Mr F. R. Dias Bandaranaike) suggested that the observations made by certain election judges during the hearing of election petitions should also be considered by the Select Committee that is to be appointed to go into this question. The Prime Minister has stated that the Government has no objection to the adoption of that suggestion.

I propose to make certain suggestions in regard to the very concept of the filing of election petitions and I hope that they would engage the very serious attention of the Select Committee that is to be appointed.

What happens soon after an election? What happens soon after a candidate is elected? Our experience is that soon after the election, the defected candidate or a combination of defeated candidates collect Rs. 5,000 and file an election petition. However fantastically frivolous the charges may be, the Member of Parliament concerned, the successful candidate, is put to the expense and worry of defending himself in the Supreme Court.

The successful candidate in his anxiety and in order that he may not take any risks retains the most capable and experienced lawyers, which is quite understandable. If any person who has contested a seat is guilty of a breach of election law he must face the consequences. But that is not my complaint. Any person is entitled to file an election petition. That right to file an election petition should be there. That is not my complaint.

My complaint is this. The defeated candidate has not the courage to file an election petition in his name, but we all know that when an election petition is filed it is backed by the defeated candidate. The defeated candidate gets hold of a man of no consequence, a person from among the riff-raff, gives him Rs. 5,000 and gets him to file an election petition. We all know that that is what happens in every election petition: the defeated candidate is behind it.

After a protracted hearing, if there is no merit in the petition, it is dismissed, but the successful candidate has paid a heavy penalty. Why? Because he has won an election. And the defeated candidate has been saved all the expense and bother to which the successful candidate has been put.

Though the degree of proof required in an election petition is the degree of proof that is required in a criminal case, the procedure that is followed in certain respects is governed by the Civil Procedure Code.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. එම්. මුස්තාෆා මයා.]

Under the Civil Procedure Code when the plaintiff files an action against a defendant, the defendant has the right to file a claim in reconvention, and upon the merits the judge can not only dismiss the plaintiff's action but also hold against him on the basis of the claim in reconvention made by the defendant. That is to say, the whole transaction between the parties is gone into.

Now, an election petition is not a matter that really affects the successful candidate only. It is a public matter that affects the whole electorate. My suggestion is that the election law should be so amended that it would be possible for the election judge to go into the whole matter of the election.

We are all aware that in some cases the defeated candidate, who gets another person to file an election petition against the successful candidate, has committed the most serious breaches of the election law. He or his agents are sometimes guilty of unbridled thuggery. If that is the case it should be possible in an election petition to make such a charge against the defeated candidate so that that matter too may be gone into by the election court.

**අනිල් මුණසිංහ මයා.**
*(திரு. அனில் முனசிங்க)*
(Mr. Anil Moonesinghe)

There is provision for a cross-petition.

**මුස්තාෆා මයා.**
*(ஜனாப் முஸ்தபா)*
(Mr. Mustapha)

I am sure my Friend is referring to a second count and all that. After a recount you can succeed; there is no petition. How can he file an election petition against a man who is not a party? That is a different matter.

What I am saying is that it should be possible for the respondent to an election petition to file a claim in the nature of a claim in reconvention in a civil case and ask for an inquiry into the entire election. I dare say I have gone into the election laws myself and I find that there is no provision now for that to be done in the same case. After all if election law is designed to ensure a clean election and not to penalize the man only because he has won, we should see that the election itself is conducted in a clean manner, in a peaceful manner. To ensure that we have to examine the conduct of defeated candidates also, because on a very, very trivial and technical point a man who has won an election can be unseated and he may not be able to contest a seat for seven years. The man who has lost, may be by ten thousand votes, can thereby get rid of his rival and can thereafter contest the by-election.

After all, Sir, this opportunity comes once in five years, and the Select Committee which is going to be appointed might examine this aspect of the matter too.

අ. භා. 3.29

**බර්නාඩ් සොයිසා මයා.** (දකුණු කොළඹ)
*(திரு. பேர்னட் சொய்ஸா—கொழும்புத் தெற்கு அங்கத்தவர்)*
(Mr. Bernard Soysa—Colombo South)

ගරු කථානායකතුමනි, නොබෝදා ගරු රාජ්‍ය ඇමතිතුමාගේ මෙහෙයීමෙන් දෙහිවල සත්වෝද්‍යානයේ සාකච්ඡා සම්මේලනයක් පවත්වන්නට යෙදුනා, අපේ රටේ අලි බේරා ගන්නෙ කොහොමද කියා තීරණයකරන්නට. පසුගිය සභා වාරයේ සිට මේ මොහොත දක්වා මේ ගරු සභාවෙන් අලි පන්නන්නෙ කොහොමද, අලි බේරා ගන්නෙ කොහොමද කියා දෙපැත්තෙන්ම සාකච්ඡාවක් පවත්වා තිබෙනව. එයින් අලි බේරා ගැනීම පිළිබඳව ඉදිරිපත් කරන ලද කරුණු සහ තර්ක සාමාන්‍ය වශයෙන් බලන විට විශාරද තත්ත්වයකින් ඉදිරිපත් වූ බව නම් කාටත් පැහැදිලි වුනා. මෑතදී ඇති වූ අතුරු මැතිවරණ තුනේදී විඳින්නට සිදු වූ පරාජය නිසා, ආණ්ඩු පක්ෂයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමහරුන් තුළ ඊට කලින් සාකච්ඡාවට—විවාදයට—තිබුණු එඩිතර භාවය හුඟක් දුරට හීන වී ගොස් තිබෙන බව ගරු අගමැතිතුමාගේ කථාවෙන්ම පෙනී ගියා.

ගරු කථානායකතුමනි, මේ වේලාවේ මේ ප්‍රශ්නය සාකච්ඡාවට ගැනීම නිසා ආණ්ඩුවට විශේෂ අවාසනාවන්ත තත්ත්වයකට මුහුණ දෙන්න සිදු වුනාය කියා කල්පනා කරන්න පුළුවනි. මේ ප්‍රශ්නය වෙනත් වේලාවක සාකච්ඡාවට ඉදිරිපත් වුනා නම් පසුගිය දා සහ අද ආණ්ඩුවට අසන්නට සිදු වූ චෝදනා අසන්නට ලැබෙනවා ඇතැයි මම විශ්වාස කරන්නෙ නැහැ. සාමාන්‍යයෙන් අවාසනාවන්ත කාලයක්—අපල කාලයක්—ඇති වුනාම අහක යන දේවලින් පවා තුවාළ වන්නට පුළුවන් බව අපේ ජ්‍යොතිශ්ශාස්ත්‍රඥයො කියනවා. විශේෂයෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමා ඒ ගැන සාක්ෂි දරණවා ඇති.

ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)

*(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாசார விவகார அமைச்சர்)*

(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

අපේ විශ්වාසයක් නැහැ, ජ්‍යොතිශ් ශාස්ත්‍රය ගැන.

බර්නාඩ් සොයිසා මයා.

*(திரு. பெர்னாட் சொய்சா)*

(Mr. Bernard Soysa)

ඒ මතය තිබෙන බවට නම් එතුමා සාක්ෂි දරණවා ඇති. ගරු කථානායකතුමනි, අද තිබෙන මැතිවරණ නීති පිළිබඳව, අත්දැකීම් අනුව යම් යම් සංශෝධන ඇති කිරීම ගැන සාකච්ඡා කරන්නට ඉදිරිපත් වන මේ අවස්ථාවේදී, 1965 මහා මැතිවරණයේදී ලැබූ අත්දැකීම් විශේෂයෙන් වළංගුය කියායි, මෙතැන ප්‍රකාශ වී තිබෙන්නෙ. ඒ මහා මැතිවරණයේදී මගේ පෞද්ගලික අත්දැකීම් නම් ඉතා සතුටුදායක වූ නමුත් සාමාන්‍යයෙන් දකුණු කොළඹ ඡන්ද දායකයන්ගේ අත්දැකීම් නම් ඒ තරම් සතුටුදායක වුනේ නැතැයි මම විශ්වාස කරනව. ඒ ඡන්දදායකයන් සියළු දෙනාටම ඔවුන්ගේ ඡන්දය යම් විධියකින් අහිමි වූ හැටියට සලකා ඒ ඡන්දදායකයන් තවමත් දෝෂාරෝපණය කරන බව කව්රුත් දන්න දෙයක්.

ගරු කථානායකතුමනි, අද තිබෙන ඡන්ද නීතියේ හැටියට ඡන්දදායකයාගේ නම, ලිපිනය ඡන්ද අංකය යනාදී කරුණු ඇතුළු දීම පිළිබඳව කාඩ් පතක් සැපයීමේ සිරිත සංශෝධනය කළ යුතු බව පැහැදිලි කිරීමට මේ විවාදයේදී උත්සාහ කරන්නට යෙදුන. පසු ගිය වර කළ සංශෝධනයට කලින් ඡන්ද අපේක්ෂකයන් සියළු දෙනාම ඒ විධියේ කාඩ් පතක් මුද්‍රණය කර බෙදා හරින සිරිතක් තිබුන. එය නුසුදුසුය කියා තීරණය කළ පසුගිය මැතිවරණ විශේෂ කාරක සභාව ඒ වෙනුවට ආණ්ඩුව විසින් සූදනම් කර මුද්‍රණය කරන ලද කාඩ් පතක් බෙදා දිය යුතුයයි තීරණය කළා. මේ තීරණයෙන් තවත් අමාරුවක් ඇති වී තිබෙන බව මතක් කරන්න ඕනෑ. තමන්ට අයිති නැති ඡන්දයක්—හොර ඡන්දයක්—පාවිච්චි කරන්නට යන කෙනකුගෙ අතට ඒ කාඩ් පත ලැබුනොත් ඒ කාඩ්පත අතේ තිබෙන නිසා වඩාත් ආත්ම විශ්වාසයක් ඇතිව ඒ වරද කරන්නට ඉදිරිපත් වෙනව. ඒ නිසා කාඩ්පත නොදිය යුතුය කියා මම කියන්නෙ නැහැ. ඒ වෙනුවට වෙනත් යෝජනාවක් තිබුන, නීති ගත නොවුනත්. ඡන්ද අපේක්ෂකයන්ගේ ගණන අනුව කාඩ් පත් මුද්‍රණය කර අපේක්ෂකයන් සියළු දෙනාටම කාඩ් පත් බෙදා හැරීමට දෙන්නටය කියායි, ඒ යෝජනාව තිබුනෙ. එයින් ඕනෑම කෙනෙකුගේ කාඩ්පතක් අතේ තිබුණය කියන කාරණය හොර ඡන්දය පාවිච්චි කිරීමට යන කෙනෙකුට අමුතු බලපත්‍රයක් දීමක් හැටියට සලකන්න බැහැ. 1965 මැතිවරණයේදී ඡන්දදායකයකු පිළිබඳව මට දැන ගන්න ලැබුණු දෙයක් මෙහෙමයි. එක් ඡන්ද පොලක සිටි අපෙක්ෂකයකුගේ නියෝජිත මහත්මයෙක්, තමන්ට අයිති නැති ඡන්දයක් පාවිච්චි කරන්න පැමිණි පුද්ගලයෙක් යැයි එක් පුද්ගලයකු එතැන සිටි මැතිවරණ නිලධාරියාට ඉදිරිපත් කළ විට, කාඩ් පතක් අතේ තිබෙනවා නම් හොර ඡන්දයක් පාවිච්චි කරන්න පැමිණි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

පුද්ගලයෙක් යැයි කියන්නෙ කොහොම ඇයි එම නියෝජිත මහතාගෙන් ප්‍රශ්න කර තිබෙනව. කාඩ්පත අතේ තිබීම ප්‍රබල සාක්ෂියක් හැටියට සලකාගෙනයි මැතිවරණ නිලධාරියා ඒ අන්දමින් ප්‍රශ්න කර තිබෙන්නෙ. කාඩ්පත අතේ තිබීම නියම ඡන්දදායකයායයි ඔප්පු කර ගැනීමට එය මාර්ගයක් වෙනව. එම නිසා එය අවලංගු කරන්න නම් මෙයට පෙර යෝජනා කර තිබුණු පිළිවෙළට අපේක්ෂකයින්ගේ ගණනට කාඩ්පත් මුද්‍රණය කර හැම කෙනෙකුටම බෙදා හරින්න අපේක්ෂකයින්ට ඉඩ දුන්නාම, අපේක්ෂකයින් ගැනත් ඡන්දදායකයින්ට වුවමනා කරුණු දැනගන්න පුළුවන් වනවා පමණක් නොවෙයි කාඩ් පතේ ඇති විශේෂ වැදගත්කමත් අඩු වී යනව.

ගරු කථානායකතුමනි, ඡන්දය පැහැර ගැනීම වැළැක්වීම සඳහා තීන්ත පැල්ලමක් ඇඟිලිවල සලකුණු කිරීම පසුගිය වාරයේදී කළ දෙයක්. මේ පිළිබඳව සැක රාශියක් ඇති වුණා. මන්ද? ඡන්ද අවලංගු කරන්න මෙය ප්‍රයෝජනයට ගනීයයි ඇත්ත වශයෙන්ම කීප දෙනකු තුළ මේ ගැන බියක් ඇති වුණා. මැතිවරණය පැවැත්වෙන දිනට කලින් ඡන්දදායකයාට සුළු මුදලක් දී අවසර ලබාගෙන, ඇඟිල්ලේ තීන්තවලින් සලකුනු කරනු ලැබුවොත් එයින් පසුව ඒ පුද්ගලයාට ඡන්දය පාවිච්චි කිරීමට නොහැකි වේය යන භයක් ඇති වුණා. ගරු කථානායකතුමනි, මේ පිළිබඳව සාකච්ඡා කරන විට අපට මතක තබා ගන්න වුවමනා දෙයක් නම් සාමාන්‍යයෙන් මනුෂ්‍ය විද්‍යාව, මනුෂ්‍ය ඥානය පාවිච්චි කරමින් වැරදි වැඩ නැවැත්වීමට යම් පිළිවෙළක් ඇති කරනවා නම් ඒ මනුෂ්‍ය ඥානයම, විද්‍යාවම පාවිච්චි කර ඇති කරන පිළිවෙළින් රිංගා ගැනීමේ මාර්ගයක් සෙවීමට ඉඩ තිබෙන බවත් අප මතක තබා ගත යුතුයි. එම නිසා සියයට සියයකින්ම මේ විධියෙ වැරදි වළක්වන්න පුළුවන් ක්‍රමයක් තවම සොයා ගන්න බැහැ. අපේ රටේ ජනතාව විශේෂයෙන්ම ඒ අතින් විශිෂ්ටත්වයක් දරන බව අප කාටත් ආඩම්බරයෙන් මතක් කරන්න පුළුවනි.

පසුගිය යුධ කාලයේදී හමුදාවට අයත් පෙට්රල් විකිණීම වැළැක්වීම පිණිස ඊයම් වලින් සාදන ලද රසායනික ද්‍රව්‍යයක් එම පෙට්රල් සමග මිශ්‍ර කොට ප්‍රයෝජනයට ගන්න පටන් ගත්ත.

**ලක්ෂ්මන් ජයකොඩි මයා.** (දිවුලපිටිය)

*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய)*

(Mr. Lakshman Jayakody—Divulapitiya)

ඇස්ප්‍රෝ පෙත්තක් දැම්මාම හරි.

**බර්නාඩ් සොයිසා මයා.**

*(திரு. பெர்னாட் சொய்சா)*

(Mr. Bernard Soysa)

අපේ දිවුලපිටියෙ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ පිළිවෙළට ඒ උපක්‍රමය පරදවන්න, අපේ දක්ෂ මොල ඇති ජනතාව වෙනත් ක්‍රමයක් එහෙම නැත්නම් ඇස්ප්‍රෝ පෙත්තක් පාවිච්චි කරමින් හමුදාවේ ඒ උපක්‍රමය පරදවන්න, වළක්වන්න, හැකියාවක් ලබාගත්ත. මේ අනුව කල්පනා කර බලන විට, කොයි තරම් උපක්‍රම යෙදුවත් එම උපක්‍රමයන් වළක්වන්න, පරදවන්න, මාර්ග සොයා ගැනීමේ දක්ෂතාවක් අපේ මනුෂ්‍යයන් තුළ තිබෙන බව අප පිළිගත යුතුයි. ඒ හැරත්, කොපමණ ක්‍රම යෙදුවත්, විධිමත් ක්‍රම යොදා ගත්තත්, සමාජයේ තිබෙන පංක්ති ස්වභාව අනුව මැතිවරණ තීන්දු වීමට බෙහෙවින්ම බලපෑම් තිබෙන බවත් අප මතක තබා ගත යුතුයි. දේශපාලනමය කරුණු වෙනුවට මැතිවරණ උපක්‍රම යෙදන්නට කිසිම විධියකින්වත් බැහැ. ඒ මාර්ගයෙන්, එවැනි පෙළඹීම්වලින්, තොරව තීරණ ගැනීමට හැකියාවක් ඇති වන්නේ විශේෂයෙන් මහජනයාගේ උද්ඝෝෂණයක් ඇති වන කාලවල පමණයි. තීන්ත පැල්ලමක් පාවිච්චි කිරීම නම් විශේෂයෙන් මහා මැතිවරණයේදී ප්‍රයෝජනවත් වූ බව පිළිගන්ට පුළුවනි. එහෙත්, අතුරු මැතිවරණයකදී එයින් එතරම් ප්‍රයෝජනයක් වෙනව යයි කල්පනා කරන්ට බැහැ.

ඊළඟට, මැතිවරණ නීතිවල තිබෙන වගන්තියක් තමයි, කායඝිල පැවැත්වීම තහනම් කියන කාරණය. සැම දේශපාලන පක්ෂයක්ම බොහොම ලෙහෙසියෙන් ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කාරණයෙන් ගැලවුණා. කොහොමද? ඡන්ද අපේක්ෂකයාගේ කාර්යාල හැටියට නොව තම පක්ෂයේ කාර්යාල හැටියට සෑම පළාතකම වගේ කාර්යාලයන් පිහිටුවා ගත්ත. පොලීසියේ හෝ මැතිවරණ කොමසාරිස්තුමාගේ කිසිම විරුද්ධත්වයක් නැතුව ඒ අන්දමට කාර්යාල රාශියක් පිහිටුවා ගන්න පුළුවන් වුණා. මෙවර බෙන්තර-ඇල්පිටිය අතුරු මැතිවරණ කට යුතු බලන්න ගිය අවස්ථාවේදි මා දැක්ක, සැතැප්මෙන් සැතැප්මට වගේ "එක්සත් ජාතික පක්ෂයේ කාර්යාලය" කියා කාර්යාල තිබුණු බව. දැන්වීම් පුවරු විශේෂයෙන් ප්‍රදර්ශනය කරමින් ස්ථාන කීපයක්ම තිබුණා. එම නිසා කාර්යාල පැවැත්වීම වළක්වන්ට වුවමනා නම්, නීති සංශෝධනය කර, එක්කො ඒවා සම්පූර්ණ යෙන්ම වළක්වන්ට ඕනෑ, එසේ නැත් නම් සම්පූර්ණයෙන් පවත්වාගෙන යන්ට ඉඩ දෙන්ට ඕනෑ. දැන් තිබෙන තහන මෙන් ප්‍රයෝජනයක් නැහැ. දැන් සිදු වෙන්නෙ නීතිය විහිළුවට ලක්වීම විතරයි. ඒ වගේම මැතිවරණ නීතිවල සඳහන්ව තිබෙනව, අපේක්ෂකයන්ගේ සළකුණු ප්‍රදර්ශනය කිරීම තහනම්ය කියා. ප්‍රසිද්ධ තැනක ප්‍රදර්ශනය කිරීම තහනම් කියායි නීතියේ සඳහන් වෙන්නෙ. ඒ අනුව තමයි, ප්‍රසිද්ධ ස්ථානවල සළකුණු සහිත විශාල දැන්වීම් ඇළවීම නීති විරෝධි හැටියට පිළිගන්නෙ. මෙතැන අමාරුව තිබෙන්නෙ, නීතියෙ හැටියට ප්‍රදර්ශනය කරන තැනැත්තා වශයෙන් අල්ලා ගත යුත්තෙ දැන්වීම් අළවන තැනැත්තා වීමයි. අළවන වෙලාවක අල්ලා ගන්ට බැරි වුණොත්, එය ඉරා දැමීම හැර වෙන කිසි ශම් පිළියමක් නැහැ. එම නිසා සළකුණු ප්‍රදර්ශනය කිරීම පිළිබඳ තහනමක් වෙනත් ක්‍රමයකට සකස් කළ යුතුයි.

මේ තහනම් සියල්ලක්ම කඩන්නට අපේ ජනතාවට හැකියාවක් තිබෙනව. මට මතකයි, යුද්ධ කාලයෙදී, ඇන්ඩෲ කොල්ඩිකොට් ආණ්ඩුකාරතුමාගෙ කාල යෙදි, යුද්ධ ආරක්ෂක නීති කියා නීති වගයක් පැනෙව්ව බව. ඒ නීති අනුව තමයි යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) වැනි අය— අපව—හිර භාරයට ගන්ට යෙදුණේ. ඒ විශේෂ රෙගුලාසි යටතේ පැනෙව්ව නීතියක් තමයි, ඇකැත්තයි මිටියයි ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කිරීම තහ නම් කියන නීතිය. ඒ තහනම නිකුත් කිරීමත් සමගම විශේෂයෙන් සමසමාජ පක්ෂයට හිතවත් තරුණ වයසෙ උදවිය සෙල්ලමක් හැටියට භාර ගත්ත, දේශ පාලන වශයෙන් අධිරාජ්‍යවාදි සටනෙ විශේෂ අංගයක් හැටියට ප්‍රසිද්ධ ස්ථාන වල හැකිතාක් දුරට ඇකැත්තයි මිටියයි ඇඳීම. ඒ දවස්වල ඇකැත්තයි මිටියයි නැතුව කොළඹ නගරයේ කාගෙවත් තාප්පයක් බේරුණෙ නැහැ. පොලීසියට මෙය අල්ලා ගැනීම අමාරුවක් වූ අවස්ථා වෙදි අහිංසක පුද්ගලයින් කීප දෙනකු අල්ලා ගෙන ගිහින් පොලීසියෙන් තළන්ට යෙදුණා. මේ අතරේ වනාතමුල්ලෙ හිටිය, අපේ පක්ෂයට ඒ දවස්වල හිතවත්කමක් දැක්වූ පුද්ගලයෙක්. ඔහු ඇකැත්තයි මිටියයි පිටේ කොටවා ගත්ත. එසේ කිරීමෙන් පසුව මොහු බැනියමක් නැතුව ප්‍රසිද්ධ ස්ථානවල ගැවසෙන්න පටන් ගත්ත. තහනම් කරන ලද සළකුණු වන ඇකැත්තයි මිටියයි ප්‍රදර්ශනය කරනවා කියන චෝදනාව උඩ පොලීසිය මේ මිනිහව අල්ලගෙන ගියා. ඒ මිනිහ පොලීසියෙදි කිව්ව, මේ ඇකැත්තෙයි මිටි යෙයි සළකුණු මට ඉවත් කරන්ට බැහැ කියා. එහෙම නම් බැනියමක් අඳින්ට කිව්ව. එහෙත් බැනියමක් අඳින්ට කියා බල කරන්ට මේ රටේ නීතියක් නැහැ. කොහොම හරි බැනියමක් අඳින්නෙ නැත් නම් නඩු දමන බවට තර්ජනය කළායින් පසුව ඔහු කමිසයක් ඇඳගෙන ගිහින් පොලිස් නිලධාරීන්ට කිව්ව, මේ කමිසය ගළවන්ට පුළුවන් කොයි ස්ථානවලදී දැයි මට ලියා දෙන්න කියා. ඒ නිසා මේ සලකුණු ප්‍රදර්ශනය කිරීම පිළිබඳ විහිළුවට ලක් වන නීතිය නැතිකොට, එම සලකුණු අනවශ්‍ය පිළිවෙළට ප්‍රදර්ශනය කිරීම වැළැක්වීමේ සීමා ඇති කිරීම සඳහා නීති යක් තිබුණොත් වඩා යෝග්‍ය යයි මා කල්පනා කරනව.

ගරු කථානායකතුමනි, විශේෂයෙන් මෑත කාලයේ තිබුණු ඡන්ද නඩු පිළිබඳව වචනයක් නොකියා බෑ. ඡන්ද අපේක් ෂකයකුගේ චරිතයට කැළලක් ඇති වන ආකාරයේ අසත්‍ය ප්‍රකාශයක් ඡන්ද අපෙක්ෂකයකු විසින් හෝ ඔහුගේ නියෝජිතයකු විසින් හෝ කිරීම මැතිවරණ නීති යටතේ වැරැද්දක් හැටියට පිළි ගන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

නවා. මේ නිසා වැරදි රාශියක් ඇති වී තිබෙනවා. එකක්, නීතියෙන් කියන්නේ කුමක්ද යන්න හරියාකාර පැහැදිලි ලෙස තීන්දු වී නැහැ. දෙවනුව යම් ප්‍රකාශයක් අසත්‍ය යයි ඔප්පු කරන්ට බැරි වුණොත් එයින්ම පිළිගැනීමක් ඇති වෙනව, එය සත්‍යයක් හැටියට. යම් ප්‍රකාශයක් අසත්‍ය බව ඔප්පු කිරීම ඉතා අමාරු දෙයක්. මැතිවරණ කාලයකදී යම් කෙනෙක් කිව්වොත් අසුවල් අපේක්ෂකයා බොරු ප්‍රකාශ කර තිබෙනවා කියා, එම ප්‍රකාශය සත්‍යයක් ද, අසත්‍යයක් ද? විශේෂයෙන්, බොරුව මොකක්ද කියා විස්තර කළේ නැත්නම් ඉතා ගැටළු තත්ත්වයක් මතු වෙනව. තමන්ගේ ජීවිත කාලය තුළ දීම බොරුවක් නොකී කෙනෙක් සොයා ගැනීම අමාරුයි. මම දන්නෙ නැහැ මේ ගරු සභාවෙ වුණත්—මම ගරු මන්ත්‍රීවරුන් චෝදනාවකට ලක් කරනව නොවෙයි—එවැනි උදවිය ඉන්නවද කියා. විශ්වාස කරන්ට නම් අමාරුයි. ඒ නිසා ඒ ප්‍රකාශය බොරුය කියා කිව්වොත්, බොරු කියන මිනිහෙක් හැටියට හංවඩු ගැහෙනව; එවැනි චෝදනාවකට ලක්වෙනව; එයින් අවාසියක් සිදු වෙනව.

බෙන්තර-ඇල්පිටියෙ එදා සිටි ගරු මන්ත්‍රීතුමා ඡන්ද අපේක්ෂකයකු හැටියට ඉදිරිපත් වුණු අවස්ථාවෙ යම් යම් චෝදනා නැඟුව. ඡන්ද නඩුව විභාග කළ විනිශ්චයකාරතුමා යම් යම් චෝදනා පිළිබඳව ප්‍රකාශ කළා, "මෙය අසත්‍යයක් හැටියට ඔප්පු වුණේ නැහැ" කියා. එයින් හැඟෙන්නේ ඒවා සත්‍ය බවයි. එයින් විශේෂ අවාසියක් ඒ පුද්ගලයාට සිදු වන බව අපේ සමහර විනිශ්චයකාරතුමන්ලට කල්පනා වන්නෙ නැහැ. එවැනි දෙයක් පත්‍රයේ පළ වුණාම අපේ රටේ ජනතාව හිතනව, මෙය ඇත්ත වෙන්ට ඕනෑය කියා. ඒක බොරුවක් ද? ඒ නිසා එවැනි චෝදනා ප්‍රතික්ෂේප කරන අවස්ථාවලදී එයින් ඇති වන හානිය සලකා බලා මේ නීතිය නැවත වරක් සංශෝධනය කරන්ට ඕනෑ.

පසු ගිය අතුරු මැතිවරණ පිළිබඳව උණුසුම් සටනක් කෙරුනු බව කවුරුත් දන්නව. මම ගිය පළාත්වලදී, විශේෂයෙන් බලන්ගොඩ ප්‍රදේශයෙදී, දකින්ට ලැබුණු කරුණු අනුව නම් ආණ්ඩු පක්ෂයේ උදවියට විශේෂ වරප්‍රසාද තිබෙනවය යන හැඟීම උඩ නොයෙක් උදවිය ක්‍රියා කළ බව කියන්ට කැමතියි. කෙනෙකුගේ පැමිණිල්ලක් පිළිබඳව බලන්ට මම 24 වැනි දා දවල් බලන්ගොඩ පොලීසියට ගියා. ඒ ගිය අවස්ථාවේදී එතැන 11 දෙනෙක් පමණ පොලිසියේ අත් අඩංගුවට අරගෙන සිටියා. මම ඇහුව මොකක්ද චෝදනාව කියා. ඔවුන් අත් අඩංගුවට අරගෙන ආ පොලිස් නිලධාරීන්ගෙන් පිළිතුරු ලැබුණෙ මොන කාරණයක් නිසා ඔවුන් අත් අඩංගුවට ගත්තද කියා ඔවුන් නොදන්න බවයි. චෝදනාව මොකක්ද, කුමන ආකාරයේ චෝදනාවක්ද කියා අප දන්නෙ නැත, පළාතේ පොලිස් අධිකාරි මහතාගේ අණ පිට අපි ඔවුන් අත් අඩංගුවට ගත්තාය කියන එකයි ඔවුන් ගෙන් දැන ගන්න ලැබුණෙ. කුමන හේතුවක් නිසා, කුමන කරුණක් නිසා, කුමන චෝදනාවක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තුවෙන් අත් අඩංගුවට ගත්තාද කියන එක ගැන වචනයක්වත් දැන ගන්න ලැබුණෙ නැහැ. පසුව අපට දැන ගන්න ලැබුණා, මේ අය බලන්ගොඩ පළාතට අයිති නැති පිරිසක් නිසා පොලිස් අත් අඩංගුවට ගත්තය කියා.

ටී. බී. සුබසිංහ මයා. (කටුගම්පොළ)
(திரு. ரீ. பி. சுபசிங்க—கட்டுகம்பொள)
(Mr. T. B. Subasinghe—Katugampola)
එහෙනම් අගමැතිත් ගන්න එපාය.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
(திரு. சிறிமாவோ பண்டாரநாயக்க)
(Mrs. Sirimavo Bandaranaike)
ඇමතිවරුත් ගන්න එපාය. මුළු ඇමති මණ්ඩලයම සිටියා.

**බර්නාඩ් සොයිසා මයා.**
(திரு. பேர்னாட் சொய்சா)
(Mr. Bernard Soysa)
ගරු කථානායකතුමනි, ඡන්ද ව්‍යාපාරයක් පවත්වාගෙන යන අවස්ථාවේදී, යම් නිලයක් දරණ කෙනෙක් නිල බලයෙන් කරන බල පෑමක් අයුක්ති සහගතය කියන කාරණය නීතියෙන් පිළිගෙන ඉවරයි. නමුත් රජයේ නිලයක් දරණ කෙනෙකුගෙන් අයුක්ති සහගත බල පෑමක් සිදු වීමේදී එහි සීමාව කොහේද කියන එක නීතියෙන් කියලත් නැහැ;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සාමාන්‍යයෙන් නීතියෙන් විස්තර කෙරෙන්නෙත් නැහැ. නමුත් අපි හරියා කාර නීතියේ අර්ථය ගන්නවා නම්, එහි හරය අනුව කල්පනා කරනවා නම්, ඉතා මත් කනගාටුවෙන් කිය යුතුව තිබෙන් නේ, එදා ඔක්තෝබර් 24 වෙනිදා බලංගොඩදී නිල බලය අනුව අයුක්ති සහගත බල පෑමක් ඇති වුණා නම් ඇති වුණේ අපේ අගමැතිතුමාගෙන්ය කියායි. එය මට ඉතාමත් කනගාටුවෙන් වුවද මතක් කරන්න සිදු වී තිබෙන දෙයක්. ගරු අගමැතිතුමා මෙහි නොසිටින අවස්ථා වකදී මෙසේ කියන්නට සිදු වීම ගැන මම කනගාටු වෙනව. නමුත් එතුමා මෙහි නොසිටීම—එකම ඇමතිවරයකුවත් මෙහි නොසිටීම—මගේ වරදක් නොවෙයි.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
**(Mrs. Sirimavo Bandaranaike)**
**අපි කියන ඒව අහගෙන ඉන්න බයයි.**

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்சா)*
**(Mr. Bernard Soysa)**
මෙම විවාදයට සහභාගි වුණ අපේ බිංගිරියේ ගරු මන්ත්‍රීතුමා (ජේ. එල්. සිරිසේන මයා.) නා නා විධියේ ප්‍රකාශ කරන්න යෙදුණා. "ගල් පැළෙන බොරු" ආදී වශයෙන් කියමින් කෑ ගහන්න යෙදුණු බව තමුන්නාන්සේලාට මතක ඇති. මම නම් ඒ චෝදනාව කරන්නෙ නැහැ. "ගල් පැළෙන බොරුය" කියන වචනයෙන් මම චෝදනා නොකරන්නෙ ඒ ගරු මන්ත්‍රීතුමා ඒ ප්‍රකාශය කරන වෙලාවෙදි ඒ ගරු මන්ත්‍රීතුමාගෙ ඔළුව පැළුණෙ නැති නිසයි.

ගරු කථානායකතුමනි, ඡන්දයක් ලබා ගැනීමට අරක්කු දෙන එක අවුරුදු ගණ නාවක් තිස්සෙ මේ රටේ කරගෙන ආ සිරිතක්; අයුතු විධියට ඡන්ද වැඩ කට යුතු කරගෙන යන අය විසින් පුරුදු පුහුණු කරගෙන ආ සිරිතක්. විශේෂයෙන් 1947 සිට එක්සත් ජාතික පක්ෂය මේ විධියේ දේවල් කරනවාය කියන කාර ණය රටේ පැතිර තිබෙනව. නමුත් යම් කෙනෙකුගේ අකමැත්තෙන් බලහත් කාරයෙන් අරක්කු දී ඡන්දය ගන්නට පුළුවනිය කියන කථාව මට අහන්න ලැබුණු පළමුවෙනි වතාවයි, මේ. ඒක බිංගිරියෙ ගරු මන්ත්‍රීතුමාගෙනුයි මට පළමුවෙනි වතාවට අහන්න ලැබුණෙ. ඡන්දයක් දෙනවාය කියන්නෙ, යම් කිසි කෙනකු විසින් තමන්ගෙ කැමැත්ත ඇතිව, යම් ඡන්ද පොළකට ගිහින් ඡන්ද පත්‍රිකාවක් අරගෙන ඒ ඡන්ද පත්‍රිකාවෙ අනුපිළිවෙළින් මුද්‍රණය කර තිබෙන නම්වලින් තමන් කැමති නම ඉදිරියේ කතිරයක් ගැසීමයි. එය තමන්ගෙ කැමැත්තෙන්ම සිදු විය යුතු දෙයක්. නමුත් බලහත්කාරයෙන් යම් කිසි කෙනකුගෙ ඡන්දයක් ගන්න පුළුවන් කියන එක පුදුමයට කාරණයක්. මට අරක්කු එපා, මම අරක්කු බොන්නෙ නැහැ කියා කියද්දි බලහත්කාරයෙන් පොවා ඡන්දය ගන්න උත්සාහ කළාලු! මේ තරම් ළාබාල විධියේ තර්ක ඉදිරිපත් කිරීමට සිදු වී තිබෙන්නේ ඇත්ත වශයෙන්ම කියන්න වෙන යම් කරුණු නැති නිසා නොවේද කියා අපට හිතන්න සිදු වී තිබෙනව.

පසු ගිය අතුරු මැතිවරණයේදී ඔක්තෝබර් 24 වෙනිදා පාන්දර සිදු වූ කාරණයක් ගැන මේ අවස්ථාවේදී මතක් කළ යුතුව තිබෙනව. එදින අලුයම පහට මා නින්දෙන් අවදි කරනු ලැබුවේ පොලිස් නිලධාරි මහත්වරුන් දෙන්නෙක් විසිනුයි. මා නිදාගෙන සිටි කාමරයේ දොරට තට්ටු කරන ශබ්දය ඇසීමෙන් මා අවදි වුණා. දොර ඇර එළියට ඇවිත් බලන විට මට ඒ ස්ථානයේ පොලිස් නිලධාරීන් දෙදෙනකු දකින්න ලැබුණා. ඒ දෙදෙනාගෙන් කෙනෙක්, "විජේසූරිය මහත්මයා කෝ," කියා මගෙන් ඇහුවා. විජේසූරිය මහත්මයාගේ නිවසෙයි මා එදා රෑ නිදාගෙන සිටියෙ. ඒ මහත්මයා තමයි ඒ ගෙයි ප්‍රධාන පදිංචිකාරයා. ඒ නිවස අයිතිකාරයත් ඒ මහත්මයාමයි. ඒ මහත්මයා අත් අඩංගුවට ගැනීමටයි ඔය කියන පොලීස් නිලධාරීන් දෙදෙනා ඒ අවස්ථාවේ ඒ ස්ථානයට පැමිණ සිටියේ. ඒ කොයි හැටි වෙතත්, විජේසූරිය මහත්මයා පොලීසියට අරන් යන්න ඉඩ දෙන්න නිකම්ම මට බැරි වුණා. අන්තිමේදි අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (අනිල් මුණසිංහ මයා.) සහෝදරයකු සමග මාත් එහි ගියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

How can you analyze figures and find out ? You are also as simple-minded as the Prime Minister. You think this is a matter of arithmetic.

රාසමානික්කම් මයා.
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

All that I want to say is that there has been no landslide victory in the three by-elections in the recent past.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Nobody said that.

රාසමානික්කම් මයා.
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

And that is a definite indication that there has been no major change in the thinking of the voters in these electorates.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**පී. බී. විජයසුන්දර මයා. (කිරිඇල්ල)**
*(திரு. பீ. பி. விஜேசுந்தர—கிரியெல்ல)*
(Mr. P. B. Wijesundara—Kiriella)
We scored a hat-trick.

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)
A general election is fought on policy, and a by-election—if the learned doctor would examine the by-elections conducted after the last several general elections—generally follows the pattern of the general election.

In the 1960 general election Nikaweratiya was an S.L.F.P. seat, and in the by-election it became a U.N.P. seat. That was the only change in the pattern in the 1960 by-elections. In the 1965 general election Bandarawela was an S.L.F.P. seat, and so was Balangoda. In the by-elections both these seats were won by the S.L.F.P. In the Bentara-Elpitiya by-election you have won with a reduced majority. So, I say definitely and categorically that the people of Bandarawela, Balangoda and Bentara-Elpitiya were not influenced by any communal cry you raised.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
Who said that ?

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)
You are saying it.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
When ?

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)
Several of your speakers have said so.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
Nonsense !

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)
Your communal cry has had no influence at all on the people in these electorates.

There have been no landslide victories. I would have conceded that the Sinhala masses had changed, and changed radically, only if you had been able to win landslide victories in these electorates ; but you have not been able to do so. The U.N.P. obtained the same number or a greater number of votes in these electorates. They obtained more votes while you obtained less votes, even though you won.

So, I would repeat that the communal cry—the question whether the National Government has conceded to the Tamil-speaking people of this country certain rights, and the propaganda that the country has been sold to Mr. Chelvanayakam—has had no effect on the people, and they have voted wisely and correctly. The results of the by-elections are not something about which you should be elated. We have also an indication, from the results of the last by-elections, that the Sinhala masses not only appreciated the attitude and action taken by he National Government in solving the problems of the minorities, but also endorsed their policy.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
The Prime Minister denied any agreement.

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)
What is the agreement ? We have had agreements with you.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

We never had an agreement with you.

රාසමාණික්කම් මයා.
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)

Why not? Do not bluff. I can understand your saying this in this House merely for the sake of defending yourself, but you and I know what happened behind the scenes.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Nothing ever happened behind the scenes. I have never had talks with you about—

රාසමාණික්කම් මයා.
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)

If having talks means that the Federal Party had gone to Dr. N. M. Perera's house or that Dr. N. M. Perera had come to Mr. Chelvanayakam's house, it may not be so. But we have had talks elsewhere—in the Chamber of this House, in the Lobbies, in the Committee Rooms.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I have had talks about giving jobs to your leader's daughter. Such talks I have had.

රාසමාණික්කම් මයා.
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)

This is just a diversion.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

I agree. It is all a diversion I think!

රාසමාණික්කම් මයා.
(திரு. இராசமாணிக்கம்)
(Mr. Rasamanickam)

However hard we may talk in the well of this House, we have our own dealings outside the House and I think the learned doctor does not deny it.

I think I have placed before the House certain suggestions which might be of use to the Committee and I would reiterate that the amendment of the election law in a number of ways will assist us in purifying our elections and will endow us with the ability to conduct elections in a more efficient and democratic way.

I commend these suggestions to the House.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

The hon. Member for Katugampola.

ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)
(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence and External Affairs)

Shall we take the vote? There is also a Motion of "No Confidence" in you, Sir.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

That is tomorrow.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

We can start today.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

 අ. භා. 5.31

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)

I will not take long.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

This Motions is only to appoint a Select Committee.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

The hon. Member for Matara, the hon. Member for Habaraduwa and the hon. Member for Kiriella want to speak. If they are willing to stand down, I do not mind taking it up now.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)

I do not know to which faction of the Federal Party the hon. Member for Paddiruppu (Mr. Rasamanickam) belongs.

වී. ධර්මලින්ගම් මයා. (උඩුවිල්)
(திரு. வி. தர்மலிங்கம்—உடுவில்)
(Mr. V. Dharmalingam—Uduvil)

There are no factions.

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)

It was quite obvious to me!

After having made an excellent speech analyzing the experience we have had ever since the Donoughmore Constitution or the Independence Constitution came into being, the hon. Member for Paddiruppu—having made that beautiful analysis tried at the end, it seemed to me, to allay some of the suspicions about the Federal Party that have arisen amongst the backbenchers of the Government itself.

They speak of communalism. They are entitled to make all manner of demands. They are entitled even to embarrass the Government at a time when the Government is oppressed by public opinion. They are prepared to ask for their pound of flesh even when the Government is trying to face criticism on all fronts, economic and otherwise. Having done all that to embarrass the Government, they want to come here and accuse us of communalism for pointing out some of the unreasonable demands they make at times and call us communalists. I think that is political dishonesty.

We are concerned, as they are, about preserving the rights of everybody in this country, but to say that there is oppression of the Tamils or of the Muslims in this country, I think is absurd. That is what is said all over the country—that the Tamils are an oppressed minority. We do not accept that position and we are entitled to point that out. But at no time have we denied the just rights of the Tamil people.

Having said that in English, I would like to pass on to Sinhala because I wish to express certain views in my own language on this subject.

Mr. Deputy Speaker,——

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

The transition period is difficult!

සුබසිංහ මයා.
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාව දවස් කීපයක් තිස්සේ මේ ගරු සභාවේ සාකච්ඡාවට භාජන වී තිබෙනව. ඇත්ත වශයෙන්ම අර පැත්තේ සිටින ගරු මන්ත්‍රීතුමන්ලාත්, මේ පැත්තේ සිටින ගරු මන්ත්‍රීතුමන්ලාත් මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් පොදුවේ පිළිගන්න කරුණු රාශියක් තියෙනව. ඒ නිසා මේ කාරක සභාව පත් කර වැදගත් තීරණවලට බැසීමට අමාරුකමක් ඇති වේය කියා මම මොහොතකටවත් හිතන්නෙ නැහැ. නමුත් අවාසනාවකට වගේ මේ මැතිවරණ නීති සම්බන්ධවත්, අපේ ආණ්ඩු ක්‍රම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුබසිංහ මයා.]

ව්‍යවස්ථාව සම්බන්ධවත් කල්පනා කරන විට අපට මුහුණ පාන්නට සිදු වී තිබෙන ප්‍රශ්න රාශියක් ඇති වී තිබෙන්නෙ, අපේ රටේ පරිසරය ගැන, අපේ රටේ පසුබිම ගැන, අප අත්හදා බැලීමෙන් ලබාගෙන තිබෙන පළපුරුද්ද ගැන කිසිම දෙයක් කල්පනා කරන්නෙ නැතිව, එංගලන්තය වැනි රටවල් සකස් කරගෙන තිබෙන නීති රීති කඳන් පිටින් ගෙනැවිත් ඒවා මේ රටටත් බෝ කිරීම නිසා බව අපට පැහැදිලිව පෙනෙනවා. මේ විවාදයට සහභාගි වීමේ බලාපොරොත්තුවෙන් මා නිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දෙසත් ටිකක් බැලුවා. මේක මහා පුදුමයක්. බ්‍රිතාන්‍ය පුරවැසියකු නොවන කෙනකුට මේ පාර්ලිමේන්තුවේ වාඩි වෙන්න බැරිය කියා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙ තිබෙනවා. මා මේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ගැන කථා කරන්න බලාපොරොත්තු වෙනවා නොවෙයි. ඒ කාලයේ කල්පනා නොකර ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර ගත් වගන්ති ගැනයි, මා මතක් කළේ.

මට විරුද්ධව තිබුණු පෙත්සම් විභාගයේ දී, මා මේ රටේ තානාපතිවරයකු හැටියට පිටරට ගොස් කාලයක් පදිංචිව සිටි නිසා මගේ මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම මට හිමි නැහැ. කියා විනිශ්චයකාරවරයෙක් තීරණය කර මට ආසනය අහිමි කළා ; මේ පුටුවේ වාඩි වීමට මට අයිතිවාසිකමක් නැත කියා තීරණය කළා. අපේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ හැටියට බ්‍රිතාන්‍ය පුරවැසියකුට මේ පාර්ලිමේන්තුවේ වාඩි වන්න පුළුවනි. නමුත් මේ රටේ සේවය පිණිස පිටරට ගිය කෙනකුට මේ පාර්ලිමේන්තුවේ වාඩි වෙන්න බැහැ, සමහර විනිශ්චයකාරවරුන් තීරණය කරන හැටියට. කල්පනා නොකර මේ රටට නීති ගෙනැවිත් තිබෙන නිසා අපට හුඟක් දුරට මේ විධියේ ප්‍රශ්නවලට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. නමුත් 1956 න් පසු මේ මැතිවරණ නීතිවල තිබෙන පරස්පර විරෝධිකම්, දුර්වලකම් මේ රටට නොගැළපෙන තැන් හරිගැස්වීමට—ඒ අනුව මැතිවරණ නීති සංශෝධනය කිරීමට—විශේෂ කාරක සභාවක් පත් කරන්නට යෙදුණා. ඒ කාරක සභාවෙන් හුඟක් දුරට ඒවා පරිගැස්සුනා. ඇත්ත වශයෙන්ම එම කාරක සභාවේ මූලික පරමාර්ථය වුණේ මේ රටේ මැතිවරණ පුළුවන් තරම් දුරට ප්‍රජාතන්ත්‍රවාදී පිළිවෙලට ගෙන යාමට හැකි වන පිණිස නීතිරීති සකස් කිරීමයි. ඒ අනුව සෑහෙන තරම් දුරට ඒ නීති රීති වෙනස් කර අළුත් නීති මාලාවක් පිළියෙළ කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කලින් තිබුණු පිළිවෙලේ හැටියට සල්ලි ඇති මිනිහට සෑම අතින්ම වාසි ඇති වුණා. කාර් ආදිය පාවිච්චි කරන්න පුළුවන් වෙලාවෙදි, කොඩි දමන්න පුළුවන් වෙලාවෙදි, බිත්තිවල පත්‍රිකා ඇලවීමට ඉඩ දී තිබුණු වෙලාවෙදි සල්ලි ඇති මිනිහට සෑම අතින්ම වාසි තිබුනා. ඒවා පසුගිය ඡන්දයේදී බොහෝ දුරට පිරිසිදු වෙලා තියෙනවා. නමුත් අත්හදා බැලීමෙන් අපි දන්නවා, ඒ නීතිවලත් දුර්වලකම් තිබෙන බව. ඒවා සංශෝධනය කර මේ නීතිය තව දුරටත් ප්‍රජාතන්ත්‍රවාදී කිරීම අවශ්‍යයි. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කොයි තරම් දුරට මේ නීති රීති ප්‍රජාතන්ත්‍රවාදී පිළිවෙළට සකස් කර මේ පාර්ලිමේන්තුවෙන් අනුමත කර ගත්තත් අවසානයේදී එය ක්‍රියාවේ යොදවන්නට යාමේදී ක්‍රියා කරන පාලක පක්ෂය කොයි ආකාරයෙන් ඒවා ක්‍රියාවේ යොදවනවාද යන ප්‍රශ්නය උඩයි, ඒ ප්‍රජාතන්ත්‍රවාදී නීතිරීතිවලින් මහජනයාට ප්‍රයෝජනයක් ලැබෙනවද නැද්ද යන්න රඳා තිබෙන්නෙ. මේ නීති ප්‍රජාතන්ත්‍රවාදී කළ යුතුය කියා අගමැතිතුමත් ආණ්ඩු පක්ෂයත් කොයි තරම් කිව්වත්, අද මේ රටේ ඇති වේගෙන එන ආර්ථික සහ දේශපාලන තත්ත්වය අනුව මේ ආණ්ඩුවට මුහුණ පාන්නට සිදු වන අනාගතය ගැන කල්පනා කරන විට අප තුළ විශාල සැකයක් ඇති වෙනවා, කොයි තරම් ප්‍රජාතන්ත්‍රවාදී නීති රීති ඇති කළත් මේ ආණ්ඩුව ඒවා ක්‍රියාත්මක කරාවිද කියා.

පසුගිය අතුරු මැතිවරණයේදී සිදුවූ දේවල් ගැන මේ පැත්තෙන් කථා කළ ගරු මන්ත්‍රීවරුන් නොයෙකුත් උදාහරණ සහිතව කරුණු ඉදිරිපත් කළා. මේ අවස්ථාවේදී මගේ පෞද්ගලික ජීවිතයේදී අත්හදා බැලූ දෙයක් ගැනද සඳහන් කරන්නට කැමතියි. මා මේ සඳහන් කරන්නේ මගේ මැතිවරණ සටනේ දී මට ලැබුණු අත්දැකීමකුයි. මා කටුගම්පොල මන්ත්‍රීවරයා වශයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පත් වීමට විරුද්ධව ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කර තිබුණා. මැතිවරණයට පෙර පොලිස් දෙපාර්තමේන්තුවට දී තිබුණු නියෝගය ගැන මා දන්නවා. යම් තැනක පැවැත්වෙන ප්‍රසිද්ධ රැස්වීමකදී යම් කථිකයෙකු කථා කරන විට ආගමික අංශයෙන් හෝ ජාතිද්‍රෝහී අංශයෙන් හෝ මිනිසුන් කුලප්පු වන විධියේ දේවල් සඳහන් කළොත් ඒවා ලියා ගත යුතු බවට පොලිසියට නියෝග කර තිබුණා. අපහාස කිරීම සඳහා යම් දෙයක් කථා කළහොත් ඒවා සම්බන්ධයෙන් ඒ ඒ උදවිය පෞද්ගලික වශයෙන් හෝ වෙනත් විධියකින් හෝ ක්‍රියා කළ යුතු මිස ඒවා සම්බන්ධයෙන් පොලිසිය මැදිහත් වන්නට වුවමනාවක් නැති බවත් ඒ සමගම දන්වා තිබුණා. නඩු විභාගයකදී මේ පිළිබඳව සාක්ෂියක් ද ඉදිරිපත් වුණා. මගේ පත්වීමට විරුද්ධව ඉදිරිපත් කර තිබුණු පෙත්සම විභාග වන අවස්ථාවේදී මට මීට වඩා වෙනස් දෙයක් දැන ගන්නට ලැබුණා. අපහාසයක් වන ආකාරයේ දේවල් කීම සඳහාද ක්‍රියා කළ යුතු යයි නියෝගයක් දුන් සේ සැලකිය යුතු බවට මැතිවරණයෙන් පසුව පොලිසිවලට දැන්වීමක් කර තිබෙනවා. මේ වගේ වැඩ ගැන අප කල්පනා කර බැලිය යුතුයි. අප මෙහි පැමිණි කොතරම් බෙරිහන් දුන්නත් නියම විධියට වැඩ නොකෙරෙනවා නම් ඒ බෙරිහන් දීම්වලින් කිසිම ප්‍රයෝජනයක් නැහැ. ප්‍රජාතන්ත්‍රවාදය අනුව ක්‍රියා කළ යුතු යයි කොතරම් කීවත් ක්‍රියාත්මක කිරීමට ඇති බලය අයුතු ලෙස පාවිච්චි කරනවා නම් අප කොයි තරම් ප්‍රජාතන්ත්‍රවාදී නීති මෙහිදී සම්මත කර ගත්තත් වැඩක් නැහැ.

ඉහතින් සඳහන් කරන ලද එක උදාහරණය ගැන කල්පනා කරන විට වුවද ලබන මැතිවරණයේ දීවත්—මැතිවරණයක් ඇත්නම්—නියම අන්දමට කටයුතු සිදු වේද කියන කාරණය ගැන අප තුළ සැකයක් ඇති වෙනවා. ඇත්ත වශයෙන්ම මැතිවරණ නීති ප්‍රජාතන්ත්‍රවාදී ලෙස සකස් කරනවා පමණක් නොව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවද ප්‍රජාතන්ත්‍රවාදී ලෙස සකස් කර ගැනීම අවශ්‍යයි. මැතිවරණ නීතිරීති ප්‍රජාතන්ත්‍රවාදී ලෙස සකස් කර ගැනීම සඳහා අප ආණ්ඩුවට සම්පූර්ණ සහයෝගය දෙන්නට කැමතියි. මේ අතර ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් ආණ්ඩුව අනුගමනය කරන ක්‍රියා මාර්ගය ගැන අපේ සැකයක් ඇති බව කියන්නට ඕනෑ. ඒ ව්‍යවස්ථාව ප්‍රජාතන්ත්‍රවාදී ලෙස සකස් කර ගැනීමට මේ ආණ්ඩුවේ උනන්දුවක් ඇති බවක් අපට පෙනෙන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් අප ඉදිරිපත් කරන කරුණු ගැන කල්පනා කර බලා ඒවාට එකඟ වන්නට ආණ්ඩුව ලැස්ති වෙනවා නම් ඒ ව්‍යවස්ථාවත් ප්‍රජාතන්ත්‍රවාදී අන්දමට සකස් කර ගන්නට අපට ඉඩ ලැබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කළාට පමණක් වැඩක් නැති බව ආණ්ඩුවට මතක් කර දෙන්නට ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදීව වැඩ කරන බව ක්‍රියාවෙන් ඔප්පු කරන්නට ඕනෑ. දැනට කෙරී ගෙන යන වැඩ අනුව නම් ප්‍රජාතන්ත්‍රවාදයට සැලකිල්ලක් නැති බවයි, පෙනෙන්නෙ.

අ. භා. 5.49

**බී. වයි. තුඩාවෙ මයා.** (මාතර)
*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*
(Mr. B. Y. Tudawe—Matara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැතිවරණ සම්බන්ධයෙන් දැනට බල පවත්වන නීතිරීති සහ සම්ප්‍රදායයන් අවශ්‍යයයි හැඟෙන පරිදි සකස් කිරීම පිළිබඳව කාරක සභාවක් පත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් මාත් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට බලාපොරොත්තු වෙනවා. කොතරම් හොඳ නීතිරීති හැදුවත් ඒවා හරියාකාර ක්‍රියාත්මක නොකරනවා නම්, නැතහොත් ඒවා හරියාකාර ක්‍රියාත්මක කළ හැකි වන පරිදි අනිකුත් අවශ්‍යතාවන් සම්පූර්ණ නොකරනවා නම් ඒ හොඳ නීතිරීතිවලින් වැඩක් නැතිව යනවා. ඡන්ද පොළ වෙත ගෙන යෑම සඳහා සෑම ඡන්දදායකයකුටම තමන්ගේ නම සහ ලිපිනය ලියන ලද කාඩ්පතක් ලැබෙනවා. ඡන්ද පොළ වෙත ඒ කාඩ්පත ගෙන ගොස් භාර දී තමන්ගේ ඡන්ද පත්‍රිකාව ලබා ගෙන පාවිච්චි කිරීමට ඡන්දදායකයාට පුළුවන්කම තිබෙනවා. එහෙත් මෙහිදී කිවයුත්තක් නම් ඒ ඡන්ද කාඩ්පත් මහජනයාට හරියාකාර නොලැබෙන බවයි. මහජනයාගෙන් මේ ඡන්ද කාඩ්පත් ලබාගෙන ඒවා වෙනුවට ඡන්දාපේක්ෂකයන්ගේ සලකුණු සහිත කාඩ්පත් ඔවුන්ට සපයන ඡන්ද නියෝජිතයන් සිටිනවා. ඒ ඡන්ද කාඩ්පත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවෙ මයා.]

රගෙන ඡන්ද පොළ කරා ගොස් ඡන්දය පාවිච්චි කිරීමට මහජනයාට පුළුවනි. මෙය ඉතාමත්ම වැරදි සහිත වූ වැඩ පිළිවෙළක් බව අප කල්පනා කරන්නට ඕනෑ.

බොහෝ ඡන්දදායකයන්ට තමන්ගේ පක්ෂයේ පාට පැළඳගෙනවත් ඡන්ද පොළ වෙත ගොස් ඡන්දය පාවිච්චි කරන්නට සමහර විට ඡන්ද පොළ භාර නිලධාරින්ගෙන් ඉඩ ලැබෙන්නේ නැහැ. එහෙත් අපේක්ෂකයන්ගේ නැත්නම් නියෝජිතයන්ගේ සලකුණු සහිත කාඩ්පත් ගෙන ගොස් තම තමන්ගේ ඡන්දය පාවිච්චි කිරීමට ඉඩ ලැබෙනවා. මෙය මහජනයා රැවටීමක් හැටියට සලකන්නට පුළුවනි. තැපැල් මගින් ඡන්දදායකයන් වෙත ලැබෙන ඡන්ද කාඩ්පත් ඡන්ද පොළේදි ඉදිරිපත් කරනවා වෙනුවට ඡන්ද නියෝජිතයන් විසින් දෙන ලද කාඩ්පත් ඉදිරිපත් කරන අවස්ථා තිබෙනවා. ඡන්ද නියෝජිතයන් මහජනයාගේ ඒ නියම කාඩ්පත් ලබාගෙන සලකුණු සහිත කාඩ්පත් ඔවුන්ට සපයනවා. එම නිසා නීතියක් ඇති කරන්න ඕනෑ, මෙම ඡන්ද කාඩ්පත ආපසු ගැනීමත්, යම් නියෝජිතයකුගේ සලකුණු සහිත කාඩ් පතක් අරගෙන ඡන්ද පොළට පැමිණීමත් නීති විරෝධි කිරීමට, වැළැක්වීමට.

එක් ප්‍රදේශයක එක් ස්ථානයකට වැඩි ගණනක මැතිවරණ කාර්යාල පවත්වාගෙන යන්න ඡන්ද අපේක්ෂකයන්ට පුළුවන්කමක් නැහැ. නමුත් මෙම අතුරු මැතිවරණයෙදි බෙන්තර-ඇල්පිටිය ඡන්ද කොට්ඨාශය තුළ බඹයෙන් බඹයට පමණ ඡන්ද කාර්යාල නැතිනම් පක්ෂ කාර්යාල පිහිටුවා තිබුණ, අපට දකින්න ලැබුණ. ඇත්ත වශයෙන්ම මේවා මැතිවරණ කාර්යාල හැටියට නොවෙයි, එක්සත් ජාතික පක්ෂයේ කාර්යාල හැටියටයි පාවිච්චි කර තිබුණේ. ඡන්ද කාලයට පමණක් සීමා වුණු එක්සත් ජාතික පක්ෂයේ මෙම මැතිවරණ කාර්යාලවල තමයි ඡන්දය පිළිබඳව අප්‍රමාණ දූෂණ කටයුතු සිදු වුණේ. මැතිවරණ කාර්යාල වශයෙන් පිහිටුවා ගනු ලැබූ මෙම කාර්යාලවලින්, තමන්ගේ ආධාරකරුවන්ගේ මාර්ගයෙන් අල්ලස් දූෂණ කටයුතු කිරීමට ඒ අයට පුළුවන් වුණු බව මේ අවස්ථාවේදී මතක් කර දෙන්න කැමතියි. [බාධාකිරීමක්] බොහෝ විට පළාතේ සිටින බලවත් පුද්ගලයකුගේ නිවසක කාමරයක් ඉල්ලාගෙන එය එක්සත් ජාතික පක්ෂයේ කාර්යාලයක් වශයෙන් පරිවර්තනය කර ගැනීමට පුළුවන්කම තිබුණ. එම ස්ථානයෙන් තමයි ප්‍රදේශයේ වැඩි හරියක්ම මැතිවරණ දූෂණ කටයුතු කරන්න පුළුවන් වුණේ. එපමණක් නොවෙයි, කාර්යාල වශයෙන් පවත්වාගෙන ගිය මෙම ස්ථාන එක්සත් ජාතික පක්ෂය ලබාගෙන තිබෙන්නෙ රුපියල් පන් සියය හය සියය වියදම් කරලයි. ඇත්ත වශයෙන්ම පසුගිය වර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වැඩ කළ බෙන්තර-ඇල්පිටිය කොට්ඨාශයට අයත් යම් කිසිවකුගෙ ගෙයක් එක්සත් ජාතික පක්ෂයේ කාර්යාලයක් වශයෙන් ප්‍රයෝජනයට ගැනීමට මුදල් දී තිබෙන බව අපට විශ්වාසවත් අන්දමින් දැනගන්න ලැබුණා. එම නිසා, කවර දේශපාලන පක්ෂයකට වුණත් මැතිවරණ කාලයෙදී වුවමනා වුවමනා අන්දමට තාවකාලික කාර්යාල විවෘත කරන්න අවකාශ නොලැබෙන පරිදි නීති රීති සකස් කිරීම අවශ්‍ය බව මම විශ්වාස කරනව.

මැතිවරණයකදී ඉතාමත් අවශ්‍ය දෙයක් තමයි රැස්වීම් පැවැත්වීම. සියලුම දේශපාලන පක්ෂවලට මේ කාලය තුළදී රැස්වීම් පැවැත්වීමට අවස්ථාව සැලසීම ඉතාමත්ම වැදගත් කරුණක්. නමුත් සමහර ගම්කාර්ය සභාවලට, පළාත්පාලන ආයතනවලට අවස්ථාවක් ලැබුණ, රැස්වීම් පැවැත්වීමට තිබෙන ප්‍රසිද්ධ ස්ථාන, පිට්ටනි, තමන්ගෙ පක්ෂ නියෝජිතයින්ට පමණක් මුළු කාලය තුළදී ලබාගත හැකි පරිදි, ඒ වාගේම විරුද්ධ පක්ෂය ඒවායේ රැස්වීම් පැවැත්වීමෙන් වැළැක්විය හැකි පරිදි, කලින් වෙන් කර තබා ගැනීමට. මෙවැනි තත්ත්වයක් වැළැක්වීමට, මැතිවරණ කාලයෙදී දින ගණනාවක්ම පිට්ටනි තමන්ගෙ පක්ෂයෙ රැස්වීම් පැවැත්වීමට පමණක් වෙන් කරවා ගැනීම වැළැක්වීමට, විරුද්ධ පක්ෂයට තමන්ගෙ රැස්වීම් පවැත්වීමට ඉඩ ප්‍රස්තා නොදී ක්‍රියා කිරීමට සමහර උදවිය ගෙන යන ව්‍යාපාරය නැවැත්වීමට, මැතිවරණ නීතිය සකස් කිරීම වැදගත් බව පෙන්නා දෙන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පොලීසිය සම්බන්ධයෙනුත් ගරු මන්ත්‍රීවරුන් කරුණු ඉදිරිපත් කළා. ආණ්ඩු පක්ෂයෙ ඇතැම් මන්ත්‍රීවරුන් කීව දැන් පොලීසිය බොහොම හොඳය කියා. නමුත් ඒ කාරණය අපට නම් කොයි අන්දමකින් වත් පිළිගන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය අතුරු මැතිවරණයෙදි පමණක් නොව මේ මාසයෙ—නොවැම්බර් මාසයෙ—3 වැනිද ඇදිගම ගම්කාර්ය සභාවෙ නාපෙ-ඔත්නාපිටිය කොට්ඨාශයට නියෝජිතයකු පත් කර ගැනීම සඳහා පවත්වන ලද අතුරු මැතිවරණයෙදි සිදුවූ දේවල් දිහා බැලුවම පැහැදිලි ලෙස පෙනියනව, පොලීසිය කොතරම් පක්ෂග්‍රාහීව ක්‍රියා කරනවාද කියා. මෙම පළාත් පාලන අතුරු මැතිවරණයෙදි එක්සත් ජාතික පක්ෂයේ නියෝජිතයන් විසින් ඡන්ද දායකයන් රථවාහනවලින් ඡන්දපොළවලට ගෙන ගොස් තිබෙනව. මේ පිළිබඳව පොලීසියට පැමිණිලි රාශියක් කර තිබෙන නමුත් පොලීසිය ඒ සම්බන්ධයෙන් කිසිම පියවරක් ගෙන නැහැ. මෙම තරඟය පැවතුනෙ කෙළින්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයකුත් එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයකුත් අතරයි. එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයාගේ ආධාර කරුවන් බය වද්දමින් නොයෙක් විධියේ දූෂණ ක්‍රියාවල යෙදී තිබෙනව. ඔහු බීගෙන විශාල මැරවර පිරිස් ඇතුව පෙළපාළි පවත්වා තිබෙනව. ඒ සම්බන්ධයෙන් පොලීසියට දැනුම් දුන් නමුත් කිසිම ක්‍රියාමාර්ගයක් ගෙන නැහැ. පොලීසියේ අඩන්තේට්ටම්වලට මුහුණ පාන්ට සිදු වුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයන්ට පමණයි. පියදාස විජේසේකර කියන මහත්මයත්, එච්. ඒ. ආරියදාස කියන මහත්මයත් පොලීසියේ අතවරවලට මුහුණ පෑ දෙදෙනෙක්. ආරියදාස මහත්මයාව පොලීසියට ගෙන ගොස් ඔහුගේ හිස කෙස් කපා දමා තිබෙනව. ඉතා දරදඬු විධියට පොලීසිය ක්‍රියා කර තිබෙන බව අපට දැනගන්ට ලැබුණ. ඔහුට ඇප දෙන්ට පොලීසියට ගිය පොඩි ගුණවර්ධන නමැති මහත්මයාට පොලීසිය කළේ මොකක්ද? ඔහුට අඩන්තේට්ටම් කරල ඔහුගේ ඔළුව උඩ මේසයක් තබා පොලීසිය වටේ ඇවිද්දවා තිබෙනව. මේ අන්දමට මේ දෙදෙනාට ඉතාමත්ම දරුණු විධියට පොලීසිය අඩන්තේට්ටම් කළා පමණක් නොව දෙදෙනාම එකට මාංචු දමාගෙන බස් නැවතුම්පොළට එක්ක ගිහින් එතැනින් කෑගල්ල පොලීසියට ගෙන ගොස් තිබෙනව. තවත් බොහෝ පිරිසකට ඉතා නරක විධියට පොලීසිය හිරිහැර කර තිබෙන බව අපට දැනගන්ට තිබෙනව. මේ සියල්ලක්ම සිදු වුණේ අගමැතිතුමාගේ කොට්ඨාශයෙයි. මා කියන්නෙ නැහැ, අගමැතිතුමා දැනුවත්ව සිදු වුණාය කියා. එහෙත් අගමැතිතුමාගේ පෞද්ගලික ලේකම් ජෝ කරුණාරත්න මහත්මයා එහි ගියාට පසු තමයි, මේ සියල්ලම සිදුවී තිබෙන්නෙ. ඒ මහත්මයාගේ බලපෑම නිසයි, පොලීසිය ඒ පැත්ත අරගෙන පක්ෂග්‍රාහීව කටයුතු කර තිබෙන්නෙ. දැන් එතුමා සභා ගර්භයේ නැති වුණත්, මා විශ්වාස කරනව, ඒ අහිංසක ඡන්දදායකයින්ට හිරිහැර කළ ඒ පොලීසියේ නිලධාරීන්ට විරුද්ධව කටයුතු කරයි කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැතිවරණය පවත්වා ඡන්ද ගණන් කර අවසාන වීමෙන් පසු ජයග්‍රහණය කළ අයටත් අනික් අයටත් පොලිස් රැකවරණ ලබා දීම සාමාන්‍ය සම්ප්‍රදායක්. එහෙත්, පසුගිය මැතිවරණයෙදි මාතර ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළ අවස්ථාවෙදි පොලිස් රැකවරණ නොලැබුණු එකම නියෝජිතයා මමයි. මම පොලීසියෙ රැකවරණ ඉල්ලා සිටියෙ නැහැ. නමුත් අනෙකුත් ආසනවල ජයග්‍රහණය කළ නියෝජිතයන්ට සම්ප්‍රදායයක් වශයෙන් රැකවරණය දී තිබෙනව. මාතර ආසනය ජයග්‍රහණය කළ මට පොලිස් ආරක්ෂාව දීමට පොලීසිය ක්‍රියා කළේ නැහැ. මට පොලිස් ආරක්ෂාව වුවමනා කරන්නෙ නැහැ. මගේ ආරක්ෂාවට මහජනයා ඉන්නව. නමුත් මා මෙයින් පෙන්නුම් කරන්ට අදහස් කරන්නෙ, යම් යම් අවස්ථාවල පොලිසිය පක්ෂග්‍රාහී ලෙස ක්‍රියා කළ බවයි.

පොලිසිය කළ යම් යම් ක්‍රියා මැතිවරණ කාලෙදි ප්‍රසිද්ධියේ මහජනයාට කියන්ට සිදු වූ නිසා, එක්සත් ජාතික පක්ෂයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවෙ මයා.]

පැත්ත අරගෙන පොලිසිය පෞද්ගලික වශයෙන් මට විරුද්ධව තදින්ම ක්‍රියා කළ බව මම දන්නවා. ඒ නිසා තමයි මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශ කළ පසු සම හර පොලිස් නිලධාරීන් බේබද්දන් වගේ හැසිරෙමින් බස්වල තිබූ බණ්ඩාරනායක රූපයත් ගලවා දමා රියැදුරන්ටත් ගසා ඉතාමත් නින්දිත විදියට හැසිරුණේ. ඒ පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් කුමක්ද කළේ? ඔවුන් තාමත් මාතර පොලිසියෙ සිටිනවා. ඔවුන් ගැන කිසිම පියවරක් අරන් නැහැ. පොලිස් නිලධා රීන් මේ විදියට මැතිවරණ නීති රීති හා සම්ප්‍රදායයන් කඩ කරනවා පමණක් නොවෙයි, අහිංසක මහජනයාට තමන් ගෙ නිදහස් ඡන්දය නිදහස් අන්දමට පාවිච්චි කිරීමට ඉඩ නොදී ක්‍රියා කර තිබෙනවා. නමුත් ඔවුන්ගේ ඒ ක්‍රියා සම් බන්ධයෙන් ආණ්ඩුව නිශ්ශබ්ද වෙනවා නම්, ඇහැත් කණත් පියාගෙන ඉන් නවා නම්, කොයි තරම් නීති රීති දැම් මත් මේ රටේ පිරිසිදු මැතිවරණයක් පවත්වන්ට බැරි බව කියන්ට සිදු වී තිබෙනවා.

ඒ නිසා කවර ආණ්ඩුවක් හෝ වේවා, මෙවැනි නීති රීති සම්පාදනය කරනව නම්, නිලධාරීන් එම නීති රීති හරියාකාර ක්‍රියාවට පරිවර්තනය කරනවාද නැද්ද කියා සොයා බැලීමත් ඉතාමත් අවශ්‍ය කටයුත්තක්. ඒ නීති රීති ගැන සැලකිල් ලක් නොදක්වා ඒවා උල්ලංඝනය කරන නිලධාරීන් ඉන්නව නම් ඔවුන්ට විරුද් ධව ක්‍රියා කිරීමත්, සාධාරණ ආණ්ඩුව කින් ඉටු විය යුතු යුතුකමක්. නමුත් අපට දැනගන්නට ලැබී තිබෙන අන්ද මට, එසේ නීති රීති උල්ලංඝනය කර මින් කටයුතු කළ නිලධාරීන්ටයි, මේ ආණ්ඩුවෙන් උසස්වීම් ලැබෙන්නෙ. අකු රැස්සෙ පොලිසියෙ ඉන්ස්පෙක්ටර්වරයා එක්සත් ජාතික පක්ෂයෙ නියෝජිත යාට කෙළින්ම ආධාර කරමින් කොමි යුනිස්ට් පක්ෂයෙන් තරග කළ අපේ පක්ෂයෙ නායකයාට විරුද්ධව ක්‍රියා කළ බව දැන් හොඳටම පැහැදිළියි. ඔහුට මොකක්ද කළේ? ඔහුට උසස්වීමක් දී බණ්ඩාරවෙලට යවා තිබෙනවා.

අතුරු මැතිවරණය දාට කලින් දා මම බණ්ඩාරවෙල සිටියා. 23 වැනි දා රාත්‍රියෙ බණ්ඩාරවෙල එක්තරා නිවසක මා නිදා ගත්ත. අකුරැස්සෙන් බණ්ඩාරවෙලට යැවූ පොලිස් පරීක්ෂක මහතා එදා රෑ 2ට පමණ අප නිදාගත්ත ඒ නිවසට ඇවිත් මොකක්ද කළේ? රාත්‍රී 2 ට ඒ නිවෙස පරීක්ෂා කරන්ට ඕනෑය කිව්වා. එදා රෑ ඒ නිවෙසෙ වැඩි හරි යක් හිටියෙ මන්ත්‍රීවරු. බෝම්බ ගෙනැවිත් තිබෙන බව ආරංචියි කියා ඔහු එදා ඒ රෑ නිවසට ආවා. නාන කාමරේ පරීක්ෂා කර ආපහු යන්න ගියා. ඒ වෙලාවෙ මම නිදි. මට දැනගන්ට ලැබුණ, පරීක්ෂා කිරීම සඳහා එදා රෑ 2 ට පොලිසිය ගෙට පැන්න බව. මහජන මන්ත්‍රීවරුන් ඉන්න නිවසකට පැන ඔය විදියට තර්ජනාත්මක ලෙස ක්‍රියා කළා නම්, දුප්පත් මහජනයා සම්බන්ධ යෙන් කොයි ආකාරයෙන් ක්‍රියා කරාවිද කියා හිතා ගන්ට පුළුවන්. මේ විදියට තමයි පොලිසිය මහජනයා බිය ගන්වා කට යුතු කරන්ට සූදානම් වන්නෙ.

මේ නීති රීති කඩ කිරීම් සම්බන්ධයෙන් ඡන්දාපේක්ෂකයන් විසින් පැමිණිලි කළ යුතුව ඇත්තෙ පොලිසියටයි. ඒ නිසා මේ නීති රීති සම්බන්ධයෙන් වැඩි වශයෙන්ම මැදිහත් වන්ට සිදු වන්නෙ පොලිසියටයි. නමුත් පොලිසියට මේවා සම්බන්ධයෙන් පැමිණිලි කළාම පොලිසිය ඒවා ගණන් ගන්නෙ නැහැ. බණ්ඩාරවෙල ආසනයෙ ගොරදියකුඹුර ඡන්දපොළේ මම හිටියා. ඡන්දය පටන්ගත් හැටියෙම පොලිස් පරීක්ෂක මහත්මයා ඇවිත් අපට කිව්වා, "මේ ස්ථානයෙ ඉන්ට ඉඩ දෙන්ට බෑ. දෙපක්ෂයෙම උදවිය හැතැප්ම $\frac{1}{4}$ ක් එහායින් ගිහින් ඉන්ට" කියා. අපි ඒ අනුව ගිය නමුත් වුණේ මොකක්ද? විනාඩි 5 ක් යන්ට හම්බ වුණේ නෑ. එක්සත් ජාතික පක්ෂයෙ උදවිය සියලු දෙනාම නැවත වරක් එතැනට ඇවිත් මහජනයා පොළඹ වන්ට පටන් ගත්ත. ඒ පොලිස් පරීක්ෂක වරයා කළේ අප එතැනින් ඉවත් කර, එක්සත් ජාතික පක්ෂයෙ උදවියට අවසථා ව ලබා දීමයි. ඊට පසුව අපේ ආධාර කරුව නුත් ඒ ස්ථානයට පැමිණ ඔවුන් අනුගම නය කළ ප්‍රතිපත්තිය අනුගමනය කරන්න පටන්ගත්ත. මේ විධියට පොලීසිය ක්‍රියා කිරීමට හේතුව—මට ආරංචි හැටියට—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බණ්ඩාරවෙල ආසනය කෙසේ හෝ එක්සත් ජාතික පක්ෂයට ලබා දීමට පොලිස් පරීක්ෂකවරයා පොරොන්දුවක් දී තිබීමයි.

**ගරු මොන්ටේගු ජයවික්‍රම (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමති)**

*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம—அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர்)*

(The Hon. Montague Jayewickreme—Minister of Public Works, Posts and Telecommunications)

බොරු, බොරු.

**තුඩාවෙ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

නියෝජ්‍ය කථානායකතුමනි, පොලිස් පරීක්ෂකතුමා එසේ කීම පුදුමයට කාරණයක් නොවෙයි. රාජ්‍ය ඇමතිතුමා තමයි බණ්ඩාරවෙල මැතිවරණ කටයුතු භාරව සිටියෙ. ඒ නිසා අර—

" බරනිඳු ගෙළෙ වසන නා රද වෙමින් ගරු
ගුරුළිඳු අතින් ඇසි කිම යහළු තොර තුරු "

කිව්ව වාගෙ රාජ්‍ය ඇමතිතුමා බණ්ඩාරවෙල ඉන්න විට පොලිස් පරීක්ෂකතුමා ඒ විධියට හිස උදුම්මා ගැනීම පුදුමයට කාරණයක් නොවෙයි; පුරසාරම් කියන එක පුදුමයක් නොවෙයි; මන්ත්‍රීවරුන් ඉන්න ගේකට පැන බෝම්බ පරීක්ෂා කරන එක පුදුමයක් නොවෙයි; මහජනතාවට හිංසා පීඩා කරන එක පුදුමයක් නොවෙයි.

මේ කරුණු අනුව බලන විට නියෝජ්‍ය කථානායකතුමනි, පිරිසිදු මැතිවරණයක් පැවැත්වීම සඳහා වැඩි වැඩියෙන් නීති රීති අවශ්‍යයි. නමුත් ඒ නීති රීති අනුව ක්‍රියා කිරීම, ඒ නීති රීති ක්‍රියාවෙ යෙදීම, එවකට බලයේ පවතින ආණ්ඩුවේ යුතුකමක්. එසේ නැතිව, තමන්ගෙ වාසියට, තමන්ගෙ ප්‍රයෝජනයට, තමන්ගෙ ජයග්‍රහණයට ආණ්ඩුවේ අත යෙදීමට, පොලීසිය යෙදීමට ක්‍රියා කරනවා නම් ඇත්ත වශයෙන්ම එවැනි ක්‍රියා හෙළා දැකීමට අපට සිද්ධ වෙනවා.

මෙහිදී මතක් කළ යුතු තවත් කාරණයක් නම්, අකුරැස්සෙ පොලීසියෙ පොලිස් පරීක්ෂකවරයා නඩු ගණනාවක්ම උසාවියට ඉදිරිපත් කළ නමුත්, වැරදි අන්දමට ඉදිරිපත් කළ ඒ නඩුවලින් අපේ ආධාරකරුවන් සැම දෙනකුම නිදහස් වුණා බවයි. ඔහු ඒ නඩු ඉදිරිපත් කරන්න යෙදුණෙ ඉතාම වැරදි අන්දමටයි. ඒ අනුව, ඔහුට විරුද්ධව ක්‍රියා කළ යුතුව තිබියදී ඔහුගේ තනතුර උසස් කිරීමට මේ ආණ්ඩුව ක්‍රියා කළා. පොලීසිය බොහෝම හොඳය කියා යූ. එන්. පී. හත්හවුල් ආණ්ඩුව කිව්වත්—ඇත්ත, පොලීසිය ආණ්ඩුවට හොඳයි. ඒ මොකද? යූ. එන්. පී. හත්හවුල් ආණ්ඩුව ආරක්ෂා කිරීමට පොලීසිය ක්‍රියා කරන නිසා පොලීසිය හොඳයි. යම් යම් උසස්වීම් ලබා ගැනීමට ඇති කෑදරකම නිසා, ඇමතිවරුන්ගේ සිත් සතුටු වන විධියට අද පොලීසිය ක්‍රියා කරන එක ඇත්ත. උසස්වීම් ලබාගැනීම පිණිස, තමන්ගේ අභිමතාර්ථ මුදුන් පත් කර ගැනීම පිණිස අවසථාවාදී ලෙස ක්‍රියා කරන මෙවැනි නිලධාරීන් කෙරෙහි විශ්වාසය තබන්න එපාය කියා අපි ආණ්ඩුවට අවවාද කරන්න කැමතියි.

මැතිවරණ නීති රීති සම්බන්ධයෙන් මීට වඩා දීර්ඝ ලෙස කථා කිරීමට මම අදහස් කරන්නෙ නැහැ. මට අවස්ථාව ලබා දීම ගැන තමුන්නාන්සේට ස්තුතියි.

අ. භා. 6.10

**ගරු මොන්ටේගු ජයවික්‍රම**

*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*

(The Hon. Montague Jayewickreme)

නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ විවාදයට ඇහුම්කන් දීමට ලැබුණේ සුළු වේලාවක් පමණයි. මෙම විවාදයේදී මා කථා කිරීමට අදහස් කරගෙන නොසිටි නමුත්, මාතර ගරු මන්ත්‍රීතුමාගේ කථාවට ඇහුම්කන් දීමෙන් පසුව ඊට පිළිතුරු දීම් වශයෙන් වචන ස්වල්පයක්වත් කථා කළ යුතුය කියා මට කල්පනා වුණා. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් කීප දෙනකු විසින් ඉදිරිපත් කරන ලද කරුණුවලට පිළිතුරු නොදුන්නොත්, ඇත්ත යුක්තිය නොදන්නා අය, පත්‍ර මාර්ගයෙන් හෝ හැන්සාඩ් වාර්තාව මාර්ගයෙන් හෝ මේ කරුණු කියවූ විට වැරදි හැඟීම් ඇති කර ගැනීමට ඉඩ තිබෙන නිසයි මම ඒ වචන ස්වල්පයවත් කථා කිරීමට අදහස් කළේ.

මෙම මැතිවරණ කාලයේදී මම එක් දිනක් බෙන්තර-ඇල්පිටිය ආසනයේත්, දෙදිනක් බලංගොඩ ආසනයෙත්, සතියක් පමණ බණ්ඩාරවෙල ආසනයෙත් සංචාරය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු මොන්ටේගු ජයවික්‍රම]

කළා. මේ අවස්ථාවේදී නියෝජ්‍ය කථානායකතුමනි, 1965 දී පැවතුණ මැතිවරණය කෙරෙහිත්, මේ අවුරුද්දෙ පැවතුණ මේ අතුරු මැතිවරණය කෙරෙහිත් මම තමුන්නාන්සේගෙ අවධානය යොමු කරවන්න කැමතියි. නොයෙක් නොයෙක් ආසනවල නොයෙක් නොයෙක් බල පෑම් ඇති වුණේ කොයි ආකාරයෙන්ද, කොයි ආණ්ඩුව තිබුණ අවස්ථාවේදිද, කියන කරුණු ගැන කල්පනා කර බලන්න. එදා මැතිවරණයේදී මගේ ආසනයේ සිදු වූ සිද්ධියක් මම මතක් කරන්න කැමතියි. වෙන ආසන ගැන මම කියන්න යන්නෙ නැහැ. මගේ ආසනයේ මම දන්න කරුණක් මම ඉදිරිපත් කරන්නම්. එම මැතිවරණයට මාස දෙකකට පෙර වැලිගම පොලිස් ස්ථානාධිපතිතුමා පැය 24 න් මන්නාරමට මාරු කළා. ළමයින් කිහිප දෙනකු ඉන්න විවාහකයකු වන වැලිගම පොලිස් ස්ථානාධිපති පැය 24 ක් ඇතුළත මන්නාරමට මාරු කර යවා ඒ වෙනුවට වෙන කෙනකු වැලිගමට එව්වා. ඔහු ආ දවසේ සිට මා යම් පැමිණිල්ලක් කළා නම් ඒ පැමිණිල්ල කළේ විරුද්ධ පාර්ශ්වයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට නොව අවුරුදු හතරක් මන්ත්‍රීවරයකු හැටියට සිට නැවත මැතිවරණයකට ඉදිරිපත් වූ අපේක්ෂකයකු හැටියටයි. පැමිණිලි ඉදිරිපත් කරන්නට ආ වෙනත් අය ඔහු හිර භාරයට ගත්තා. එවැනි සිදුවීම් මට හොඳට මතකයි. තුවාලකරුවකු පැමිණිල්ලක් කරන්න ගියාම හිර භාරයට ගන්නෙ ඒ පැමිණිලිකාරයාවයි. ඊට සම්බන්ධ විත්තිකරු ගැන කිසිම දෙයක් කරන්නෙ නැහැ. වරක් මා නියෝජනය කරන කොට්ඨාශයේ මැතිවරණ රැස්වීමකට සහභාගි වීමට මගේ කාර් රථයෙන් මා ගිය අවස්ථාවකත් මෙවැනි දෙයක් සිදු වුණා. මේ සම්බන්ධයෙන් මාතරට ටෙලිපෝනයෙන් කථා කරන්නට පැය 2 ක් පමණ ගත වුණා. ඔහු අගතියෙන් යුතුවයි ක්‍රියා කළේ. පැමිණිලිකාරයා හිරභාරයට ගත්තා, විත්තිකාරයා ගැන කිසිම දෙයක් කළේ නැහැ. ගිය මැතිවරණයේදී යුද්ධ හමුදාව පවා ගෙන්නුවා. වැලිගම පොලිස් ස්ථානය ළඟ යුද්ධ හමුදාවේ භටයන් හතර පස් දෙනකු කටයුතු කළ බව මා හොඳාකාර දන්නවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ හවුල් ආණ්ඩුව එදා සාධාරණ මැතිවරණයක් නොකෙරෙන අන්දමට වැඩ කටයුතු කළ බව අපි හොඳාකාර දන්නවා.

තවත් කාරණයක් කියන්නම්. නොයෙක් නොයෙක් ස්ථානවල නොයෙක් නොයෙක් විධියට කාරණා සිදු වුණා. යම් ස්ථානයක ඇති වූ පෞද්ගලික රණ්ඩුවක් නිසා එක් කුඩා ළමයෙකුට තුවාලයක් සිදු වුණා. දබරයට හේතුව පෞද්ගලික කාරණයක් පමණයි. ඊට සම්බන්ධ දෙපක්ෂය නෑදෑයෝ. එක් පවුලක් එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දෙනවා. අනෙක් පවුල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටයි වැඩ කරන්නෙ. අර තුවාලකාරයා ගැන පැමිණිලි කළ තැනැත්තා හිර භාරයට ගත්තා. අලුතින් ආ ඉන්ස්පෙක්ටර්ට ටෙලිපෝන් කර, ඇයි මෙහෙම කරන්නෙ කියා ඇහුවා. ළමයා මරණාසන්නලු, පසුව මා දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරි මහත්මයට—ඩී. එම්. ඕ. මහත්මයට—ටෙලිපෝන් කර ඒ ගැන කිව්වා. බාහිර රෝගීන්ගේ අංශයට—ඕ. පී. ඩී. එකට—මේ ළමයා යවා අයඩින් සවල්පයක් දමා පිටත් කර තිබෙනවා. ඒ තත්ත්වය පොලිස්කාරයට කියා දීම නිසයි අන්තිමේදී සිර භාරයට ගත් තැනැත්තා පොලීසියෙන් ඉවත් කර ගන්න පුළුවන් වුණේ. ඔය විධියට අගතිගාමී ලෙසිනුයි කටයුතු කළේ.

බලංගොඩ සිද්ධි ගැන මේ ගරු සභාවට කියන්න වුවමනාවක් නැහැ, එවැනි දේවල් කර, දැන් විරුද්ධ පාර්ශ්වයේ වාඩි වෙලා ඉන්න අය. නොයෙක් නොයෙක් විධියට ආණ්ඩුවේ සේවකයන්ට තර්ජනය කළා, ආණ්ඩුවේ නිලධාරීන් බිය ගැන්නුවා.

**විජයසුන්දර මයා.**
*(திரு. விஜயசுந்தரா)*
(Mr. Wijesundara)

කවුද ?

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

කවුරුදයි අහන්න අත්තනගල්ලේ ගරු මන්ත්‍රීවරියගෙන්. කෙනකුට කවුරුත් හම්බ වෙන්න ඉඩක් දුන්නෙ නැහැ. ඔය ප්‍රතිඵල ලැබුණු එක පුදුමයි. ඊට හේතු මොනවාදයි පෙන්වමින් ගරු අග්‍රාමාත්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුමා යම් ප්‍රකාශයක් කළා. නොයෙක් නොයෙක් ස්ථානවල නොයෙක් නොයෙක් තැන්වල—බෙන්තර-ඇල්පිටිය, බලංගොඩ, බණ්ඩාරවෙල, අවුරුදු දහයේ දෙළහේ ළමයින්ගේ නම් පවා ඡන්ද ලැයිස්තුවට දැම්මා.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
කවුද ?

ගරු මොන්ටේගු ජයවික්‍රම
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
ග්‍රාම සේවකයාගෙන් අහන්න.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
තමුන්නාන්සෙලාගෙ කාලෙ පිළියෙල කළ ඡන්දදායක ලැයිස්තු නේද ?

ගරු මොන්ටේගු ජයවික්‍රම
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
අපේ කාලේ නොවෙයි. මම තෝරා දෙන්නම්.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
No, you were not here.
විරුද්ධ පාර්ශ්වයේ ගරු නායිකාව ඒ කාරණය මේ ගරු සභාවට පැහැදිලි කරන වෙලාවෙ ගරු ඇමතිතුමා මෙහි සිටියේ නැහැ.

ගරු මොන්ටේගු ජයවික්‍රම
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
Please let me explain.—[*Interruption*]. Please allow me to explain.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
You were not here when the hon. Leader of the Opposition made the position clear after having verified the facts from the Commissioner of Elections.

ගරු මොන්ටේගු ජයවික්‍රම
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
What I am trying to make out is that the 1965 electoral register was prepared in 1964.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
No.

නියෝජ්‍ය කථානායකතුමා
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
Anyway, that is his contention. Let him continue.

ගරු මොන්ටේගු ජයවික්‍රම
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
The 1965 electoral register was prepared during the year 1964.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
No fear! You do not know.

ගරු මොන්ටේගු ජයවික්‍රම
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
The then Government, the Sri Lanka Freedom Party and its Coalition supporters, did not expect to go to the polls in 1965 on the 1964 register. They went to the polls in 1965 because they were defeated in this House. They expected to go to the polls on the 1965 register.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
The answer was given.

ගරු මොන්ටේගු ජයවික්‍රම
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
Answer! You had better ask her whether she knows the answer.—[*Interruption*]. I am telling you what

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු මොන්ටේගු ජයවික්‍රම]

happened.—[*Interruption*] That is my point of view. Let her come and deny it, I do not care.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)

The Commissioner of Elections will answer that.

ගරු මොන්ටේගු ජයවික්‍රම
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

I want to make this point clear. The 1965 voters' lists were prepared in 1964. The Commissioner of Elections will have to admit that. He cannot prepare the election registers within a matter of a month. I have the highest regard for the Commissioner of Elections. He is one of the finest Commissioners of Elections this country has ever produced, and both sides of the House are full of praise for him.

The Commissioner has nothing to do with this. The registers are not compiled by the Commissioner; they are compiled by the grama sevakas. They produce them before the Government Agent at the kachcheri. The 1965 registers, I repeat, were prepared in the year 1964. The names of U.N.P. supporters were deleted. In one family, out of 13 people, only 2 were allowed to vote in 1965. Eleven names were deleted.

ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා. (හපුතලේ)
*(திரு. டபிள்யூ. பீ. ஜீ. ஆரியதாச—ஹப்புத்தளை)*
(Mr. W. P. G. Ariyadasa—Haputale)

By whom?

ගරු මොන්ටේගු ජයවික්‍රම
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

When the inquiry takes place, you will know.

Then they prepared the 1965 electoral registers expecting that the S.L.F.P. and Coalition parties will go to the polls in 1966, but it so happened that they got defeated in the House and had to go to the polls in 1965.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)

You are talking of the by-election or the general election?

ගරු මොන්ටේගු ජයවික්‍රම
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

I am talking of the General Election.

So, according to these registers, you will be surprised to find, if you were to peruse them carefully that a number of persons, mainly supporters of the National Government, had been disenfranchized.

ආරියදාස මයා.
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

How can you say that?

ගරු මොන්ටේගු ජයවික්‍රම
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

I know it. Even today I had a delegation from my own electorate.

සිරිමාවෝ බණ්ඩාරනායක මිය.
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

You are preparing the lists, not we.

ගරු මොන්ටේගු ජයවික්‍රම
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

We have V. C. elections and U. C. elections. Even today I had a delegation from a ward in my constituency, Pelana. The grama sevaka—

ආරියදාස මයා.
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

May be a U.N.Per.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

We know what you did. Please do not talk. If I come out with a little more you will be ashamed. But let me tell you, the president of a rural development society made a complaint to me that the grama sevaka of the area—fortunately he was transferred by the Hon. Minister for Home Affairs—had struck off the names of some U.N.P. supporters from every household. If there were ten names in the family or if there were four, only two were allowed to remain, the rest being scored off.

සිරිමාවෝ බණ්ඩාරනායක මිය.
(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)
(Mrs. Sirimavo Bandaranaike)

That has been done this time.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

I strongly suggest to the fair Leader of the Opposition that she please keep quiet. It will do her much good if she keeps quiet.

සිරිමාවෝ බණ්ඩාරනායක මිය.
(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)
(Mrs. Sirimavo Bandaranaike)

He will like it if I keep quiet.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

I do not wish to get entangled in a dialogue with one who I think, is the most charming Member of this House.

සිරිමාවෝ බණ්ඩාරනායක මිය.
(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)
(Mrs. Sirimavo Bandaranaike)

Thank you for the compliment.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

I always thought so and I always will.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

If you finish with your compliments it will be good because we want to finish the Debate.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Compliments will not help him.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

He is making every effort.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

I am going to revert to my mother tongue. I had to speak in English because the interruptions of my Friend the hon. Member for Yatiyantota were in English.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේ ප්‍රශ්න ගැන ඉතාම පිරිසිදු ලෙස කල්පනා කරන්නට මහජනතාවට අවසථා වක් ලැබී තිබෙනවා. මේ රටේ සිටින තරුණ සින්ගෙන් සියයට 85 කට වැඩි ප්‍රමාණයක් අද ලැදිව සිටින්නේ මේ ජාතික ආණ්ඩුවට නැත්නම් එක්සත් ජාතික පක්ෂයට බව මේ අතුරු මැතිවරණ තුන ගැන කල්පනා කර බලන විට කිසිම බයක් සැකක් නැතිව කියන්නට අපට පුළුවන්කම තිබෙනවා.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

ඒක තමයි පැරදුණේ.

ගරු මොන්ටේගු ජයවික්‍රම
(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)
(The Hon. Montague Jayewickreme)

බණ්ඩාරවෙල ආසනය ගැන බලන්න. වැඩි ඡන්ද 147 යි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
ඡන්දය දෙන්න එන්න දුන්නෙ නැහැ නෙ.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
සියයට 84ක් ඡන්දය දී තිබෙනව.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
එන්න දුන්න නම් සියයට සියයක්ම ඡන්දය දෙනව.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
තමුසෙලා දිනල; හැබැයි ආසන අපට.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
We have no objection to your claiming victory if we get the seats!

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු රාත්‍රි කාලයේ හුඟක් ගමන් කළා. රාත්‍රි 8ට ගිය ගමන ආපසු එන විට උදේ 5යි. කොහේ ගියාද දන්නෙ නැහැ. අපේ තරුණ පෙරමුණේ අයට අපි කිව්ව මේ අය යන්නෙ කොහේද කියා විකක් සෝදිසි කර බලන්නය කියල. ඇයි සල්ලි බෙදන්න ගියාද දන්නෙ නැහැ නෙ. [බාධා කිරීමක්]

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)
අගමැතිතුමා ඇවිද්දෙ නැද්ද? එතුමා බෙලිහුල්ඔය රෙස්ට්හවුස් එකට යන්නෙ රෑ දෙකට විතර.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
විරුද්ධ පාර්ශ්වයෙ අය නම් රෑ තිස්සෙ ම ඇවිද්ද. සාරි හත අට මාරු කර කර එක එක විධියට ගිහින් සල්ලිත් බෙදුව.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
It is a downright lie.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
හෙණ ගහන කථා.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
දවස තිස්සෙම අනික් පැත්තෙන් හෙණ ගහන කථා කියල, මම ඇත්ත කියන විට හෙණ ගහන කථාය කියනව.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
බලංගොඩ තැපැල් කාර්යාලයේ තිබුණු දිවංගත අගමැතිතුමාගේ පින්තූරය අස් කළේ නැද්ද?

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
මම?

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
ඇමතිතුමා එනවාය කියල තැපැල් ස්ථානාධිපතිවරයා විසින් ඒ පින්තූරය අස් කළා.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)
අස් කරන්නය කියල මම කිව්වෙ නැහැ නෙ.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
ඇමතිතුමා එන නිසාය කියලයි අස් කළේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

ඉතින් මම මොනව කරන්නද ? අස් කරන්නය කියල මම කිව්වයැ. මා කියන්නට අදහස් කළේ අපේ නායිකාව—

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

අපේ නායිකාව ?

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

එහෙම කිව්වෙ වැඩි ආදරේට.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

කට බොරු කිව්වට දිව බොරු කියන්නෙ නැහැ.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

මා නම් කවදාවත්ම විරුද්ධ පාර්ශවයේ නායිකාවට ප්‍රශංසාවක් කළා නම් මිස අප්‍රශංසාවක් කරලා නැහැ. එතුමියට අපි හැම විටම ප්‍රශංසා කරන්න ඕනෑ. මා එසේ කියන්නේ හොඳ ලක්ෂණ, හොඳ හැඩහුරුකම් ඇති කාන්තාවක් නිසයි.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

ඔය බටර් ගාන්නෙ මොකටද ?

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

බටර් දන් හුඟක් ගණන්.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

කොටින්ම කියනවා නම් මමත් මිනිහෙක් නිසා ලක්ෂණ කාන්තාවක් දැක්කම වර්ණනා කරන එක පුදුමයක් ද ? ඒක පුදුමයක් නොවෙයි. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

You might restrain yourself and go on with your speech!

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දැන් තමුන්නාන්සේට කියන්නට යන්නේ මෙන්න මේකයි : පසුගිය අතුරු මැතිවරණ තුන ඉතාමත්ම සාන්ත ලීලාවෙන් කිසිම කරදරයක් හිරිහැරයක් නැතුව සිදු වුණු බව කියන්ට කැමතියි. මා සිතන හැටියට එම කොට්ඨාශ තුනේ එකම ස්ථානයකින්වත් කිසිම චෝදනාවක් නැහැ, පොලීසිවලට.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

මෙච්චර වෙලා අපි කීවෙ මොනවද ?

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டாக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

මේ බීරි අලියෙක්.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

බීරි අලින්ට වීණා ගායනා කරන්න වාගෙ.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

අකුරැස්සෙ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) ගැන මා විස්තර කරන්ට ගියොත් එතුම මෙතැනින් පැනල යාවි. මා විතර මේ ගරු මන්ත්‍රීතුමා ගැන දන්න වෙන කිසිවෙක් මෙහි නැහැ. මා කියන්න පටන් ගත්ත දවසෙදි එතුම පැනල යාවි. එච්චරයි මම කියන්නෙ.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

ඇයි නොකියන්නේ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Avoid personalities and go on.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

They have nothing else to say, but to refer to personalities.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

මේ මැතිවරණ තුන පැවැත්වූ අන්දම ගැන විරුද්ධ පාර්ශ්වයෙ ගරු මන්ත්‍රීවරුන්ට බොහොම අමාරුයි. ඒ අය නොයෙකුත් විධියෙ දේ කියන්ට යෙදුණ. බෙන්තර-ඇල්පිටියෙ ගරු මන්ත්‍රීතුමා (එච්. ජී. ඒ. කාරියවසම් මයා.) කිව, බෙන්තර-ඇල්පිටිය කොට්ඨාශය තුළ අපේ පක්ෂයෙ යම් යම් ප්‍රකාශ බලහත්කාරයෙන් ප්‍රචාරය කළ බව. අපේ නම් කියල කීව. එය සම්පූර්ණ අසත්‍යයක්. මම රැස්වීම් කීපයකට ගියා. මම බෙන්තර-ඇල්පිටිය ප්‍රදේශයෙ සංචාරය කළේ ස්වල්ප කාලයයි. උදේ වරුවෙ පැය 2 යි; සවස වරුවෙ පැය 2 යි නැතිනම් 3 යි. කාව්ද මේ උදවිය රවටන්න හදන්නෙ? අපේ පක්ෂයේ දේවල් මොකටද බලහත්කාරයෙන් අපි ප්‍රචාරය කරන්නෙ? ඒකෙන් කිසිම වැඩක් වන්නෙ නැහැ. රහස් ඡන්දය පාවිච්චි කිරීමට කාටත් පුළුවනි. ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන පක්ෂයකට ඡන්දය දෙන්න කාටත් පුළුවනි. ඒකයි අපි කියන්නෙ. විරුද්ධ පාර්ශ්වයෙ ගරු මන්ත්‍රීවරුන් අතරෙ නොයෙකුත් විධියෙ කතා ඇති වුණා. නමුත් මම එකක් කියන්ට කැමතියි. මේ මැතිවරණ තුනේදි අපි ඉතාමත් සාධාරණ අන්දමින් කටයුතු කර තිබෙනවා. ඒ වගේම මම කියන්නට ඕනෑ අපට ඡන්දය දෙන්ට සිටි දහස් ගණනකට ඡන්දය දීමෙ වරප්‍රසාදය ලැබී තිබුණෙ නැති බව.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

අපටත් ඒකම සිදු වුණා.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

අපේ හුඟ දෙනෙකුට ඡන්දය තිබුණෙ නැහැ. ලියාපදිංචි කරන අවස්ථාවෙදි හුඟක් තරුණයන්ගෙ නම් කපා දමා තිබීම ඊට හේතුවයි. ඒක බොහොම ලෙහෙසියෙන් සොයා ගන්ට පුළුවනි. මගේ කොට්ඨාශයෙ පැලැන පළාත ගැන මට ආරංචියක් ලැබුණ. එවැනි කරුණු ගැන පරීක්ෂා කරන්ට ඕනෑ. [බාධාකිරීම්]

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ඇමතිතුමාගෙ පෞද්ගලික ලේකම් නෝද ඩී. ආර්. ඕ. ?

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

අකුරැස්සෙ ගරු මන්ත්‍රීතුමා කතා කරන්ට ඕනෙ නැහැ. කොමියුනිස්ට් පක්ෂයට බොහොම අමාරුයි ඇත්ත කියන විට. [බාධාකිරීම්]

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

Then sack the Commissioner of Elections.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

The present Commissioner of Elections is the best Commissioner we ever had.—[*Interruption*]. What has the Commissioner of Elections got to do here?

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)

සිංහලෙන් කතා කරන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொன்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

හැම ඡන්ද කොට්ඨාශයකම ඡන්ද දෙතුන් දාහක් කපල තියෙනව. [බාධා කිරීමක්]

I am trying to tell you that we did not interrupt when Members of the Opposition spoke. But when we reply, they interrupt.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

You are experienced enough to ignore all that and go on.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொன்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

Thank you for the compliment.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේ ඉතාමත්ම ලොකු ප්‍රශංසාවක් කළා, ඔය මෝඩ ප්‍රශ්නවලට පිළිතුරු දීමට නොයන්න තරම් දැනුමක් මට තිබෙනවාය කියා. බාධා ගැන නොසලකා මගේ කථාව මම කර ගෙන යන්නම්. මම කලිනුත් කී අන්දමට මෙම අතුරු මැතිවරණ තුනේදීම ඉතාම සාධාරණ අන්දමට අපි කටයුතු කළ බව කියන්න කැමතියි.

නාම ලේඛනවල ඇති අඩුපාඩුකම් ගැන මම දොස් කියන්නෙ එම ප්‍රදේශවල කටයුතු කළ ග්‍රාම සේවක මහත්වරුන්ටයි. සමහර ග්‍රාම සේවකයින් අපක්ෂපාතව තමන්ගෙ සේවය ඉටු කළ අතර, තවත් සමහර ග්‍රාම සේවකයින් නොයෙකුත් අන්දමේ අකටයුතුකම්වල යෙදුණු බව මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. ඇතැම් අය ගෙයක් ගෙයක් පාසා ගොස් නොයෙකුත් අක්‍රමිකතාවල යෙදුණු බව අපට දැනගන්න ලැබුණා. මගේ කොට්ඨාශයේ එබඳු අය පිළිබඳව සවදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාට කරුණු ඉදිරිපත් කර, දැනටමත් ඒ අය ගැන ක්‍රියා කර ඇති බව දැනගන්න තිබෙනව. මෙම කාරණය සම්බන්ධයෙන් මතක් කළ යුතු වැදගත් කරුණ නම්, අවුරුදු 18 න් වැඩි සියලු දෙනාටම ඡන්දය පාවිච්චි කරන්න පුළුවන් වන ආකාරයට, ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සම්පූර්ණයෙන්ම තහවුරු කර දීමට අපි ස්ථිර වශයෙන්ම පියවර ගත යුතු බවයි. එසේ නැතුව 18න් වැඩි අයගේ ඡන්දය පාවිච්චි කිරීම වැළැක්වෙන අයුරින් ඔවුන්ගේ නම් ඡන්ද ලේඛනවලින් කපා දමා ඇත්නම්, ඔවුනට තම ඡන්දය පාවිච්චි කරන්න අවහිර කර ඇත්නම්, මා හිතන හැටියට එය ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයට ගහන බලවත්ම පහරක්. එම නිසා, අවුරුදු 18 ට වැඩි සෑම දෙනාටම ඡන්ද බලය ලැබෙන අන්දමට සාධාරණ විධියට ඡන්ද ලැයිස්තු සකස් කිරීමටත්, ප්‍රතිඵල කොහොම වුනත් සාධාරණ අන්දමට මැතිවරණ කටයුතු කිරීමටත්, මහජනතාවට තම අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ ප්‍රස්තාව ලැබෙන අන්දමින් කටයුතු කිරීමටත් අවස්ථාව ලැබේ යයි බලාපොරොත්තු වන අතර, මේ පිළිබඳව ගරු අගමැතිතුමාත් ප්‍රකාශයක් කරාවි යයි බලාපොරොත්තු වෙමින් මගේ කථාව මෙයින් අවසන් කරනව.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Is it the wish of the House that we finish this Debate today ?

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)

No, Sir.

අ. භා. 6.35

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතුරු මැතිවරණයකින් පසුව මෙම යෝජනාවින්‍යාය පත්‍රයට අඩංගු කර ඒ පිළිබඳව අපේ අදහස් දැක්වීමට අවස්ථාවක් සලසා දීම ගැන ගරු රාජ්‍ය ඇමතිතුමාට පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනව. මෙවර අතුරු මැතිවරණයෙදි ලොකු අකරතැබ්බයකට මුහුණ දෙන්න මට සිද්ධ වුණා. අප වැඩ කළේ බලංගොඩ ආසනයෙයි. මම පළමුවෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට උදව් කරනවාය කිව්, උදව් කළ, උඩුගම කියන ගමේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නියෝජිතයා හමුවන්න යන විට, අතර මග එක්තරා ස්ථානයකදී, හාමුදුරු නමක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

හමුවුණා. ඒ අවස්ථාවේදී අපි ගමන් කර මින් සිටි රථය ඒ හාමුදුරුවන්ගෙ පන් සල ලඟ නවත්වා රථයෙන් බැස, හාමුදුරු වන්ට වැඳ අපි පැමිණි කාරණය කිව්වාම —අපි මේ ප්‍රදේශයේ මැතිවරණ කටයුතු සඳහා පැමිණියාය, ඔබ වහන්සේත් දැක බලාගෙන යන්න පැමිණියාය කිව්වාම— මහත්මයා කව්දැයි මගෙන් ප්‍රශ්න කළා. දිවුලපිටියෙ මන්ත්‍රීවරයා මා බව කියා, ඒ හාමුදුරුවන් දිවුලපිටිය ප්‍රදේශය තිබෙන් නෙ කොහේදැයි නොදන්නවා විය හැකි යයි සිතා එය අගමැති ඩී. එස්. සේනා නායක මහත්මයා නියෝජනය කළ මීරි ගම ආසනයෙන් කොටසක්ය කියා කිව් වාම හාමුදුරුවො බොහොම ආදරයෙන් අප පිළිගෙන පන්සල ඇතුළට එක්කර ගෙන ගියා. මා සමග මිත්‍රයකුත් ගියා. අප පන් සල ඇතුළට එක්කරගෙන ගිහින් වාඩි වෙන්න සලස්වා දුන්නාට පස්සෙ අපි ඇහුවා, "හාමුදුරුවනේ, මේ ප්‍රදේශයේ තත්ත්වය කොහොමද ?" කියා. එතකොට ඒ හාමුදුරුවන් කියනව, "මෙදා පාර කැර කුවේ නැත්නම් කවදාවත් හරියන්නෙ නැත" කියා. හාමුදුරුවන්ගෙ හිතේ මාත් එක්සත් ජාතික පක්ෂයට අයත් මන්ත්‍රී වරයෙක්ය කියායි. ඉතින් මම කිව්ව "කොහොමද හාමුදුරුවනේ මෙදා කරකවන් නෙ" කියා. එතකොට කිව්ව, "ඒක නේන්නම් මහත්තයො, මේක තමයි ලොකුම අමාරු වැඩේ, ඉටියෙන් හරි මැටි යෙන් හරි— "

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

කව්ද ඒ හාමුදුරුවො ?

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி.)*
(Mr. Jayakody)

උඩගම ගමේ සුදු හාමුදුරුවො කියන් නෙ ඒ හාමුදුරුවන්ටයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඒ ටික මදි. හාමුදුරුවන්ගෙ නම කියන්න.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி.)*
(Mr. Jayakody)

නම මට මතක නෑ. උඩගම ඡන්ද පොළ තිබුණ ගමේ සුදුහාමුදුරුවො කියායි කියන්නෙ. නම දන්නෙ නෑ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

එහෙනම් බොරුවක්.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

හාමුදුරුවන් අදහස් කරන වැඩ පිළි වෙළ එළිදරවු වෙනතුරු මාත් බොහොම ආසාවෙන් ඊට ඇහුම්කන් දීගෙන හිටිය. සල්ලි යොදල හෝ මේ මැතිවරණය දිනා ගන්න ඕනෑ යයි හාමුදුරුවො කිව්ව. "පන්සලේ අලුතෙන් ධර්ම ශාලාවක් හද නව, ඊට එක්සත් ජාතික පක්ෂයෙන් සල්ලි බලාපොරොත්තු වුණු නමුත් ලැබු ණෙ නෑ, මේ අතුරු මැතිවරණය ජයග්‍රහ ණය කළොත් අබුසාලි මහත්මයගෙන් හෝ එක්සත් ජාතික පක්ෂයෙන් හෝ අපට සල්ලි ලැබෙනව" කියා හාමුදුරුවො කිව්ව. මේ විධියට කියාගෙන යන විට මට එතැන ඉන්න බැරිව ගියා. මට කණගාටු හිතුන. ඒවගෙම ලජ්ජත් හිතුණ. පසුව මම, ගිහින් එන්නම් කියා පන්සලෙන් පිට වෙන්න හදන විටම හාමුදුරුවො මට පොඩ්ඩක් ඉන්න කියා පන්සල ඇතුළට ගිහින් මොනිටර් එක්සර්සයිස් පොතක් ගෙනාව. එහි හේම බස්නායක මහත්මය, දැවමොට්ටාවෙ අමරවංශ හාමුදුරුවො, නන්ද මැතිව් මහත්මය ආදී කීපදෙනෙක් සටහන් ලියා තිබුණ. හාමුදුරුවො මටත් කිව්ව සටහනක් ලියන්න. මම, ධර්ම ශාලාවෙ වැඩ බොහොම හොඳට කෙරෙ නව, ඒ කටයුත්ත ඉතාමත් ඉක්මණින් අවසාන කරන්න ඕනැයි කියා ලියල ලක්ෂ්මන් ජයකොඩි, දිවුලපිටිය යන්නත් සඳහන් කර එතැනින් විගහට පැනල ආව. ජැක් කොතලාවල මහත්මයත් එතෙනට ඇවිත් ගිය බව හාමුදුරුවො කිව්ව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1931 පටන්ම අපි පිරිසිදු මැතිවරණ පැවැත්වීමට කොයිතරම් නීති රීති යොදා තිබුණත්, ඉතාමත් දියුණු යුගයක් හැටි යට සැලකෙන මේ කාලයෙදි, ආසියාවෙ දියුණු රටක් වශයෙන් හැඳින්වෙන අපේ රටේ අදත් මැතිවරණ කටයුතු සම්බන්ධ යෙන් නොයෙක් විධියෙ දූෂණයන් සිදු වීමට ඉඩ ප්‍රස්තා තිබෙනව. සමහර අය තවමත් එවැනි දේ කිරීමට අදහස් කිරීම ගැන අපි කනගාටු විය යුතුයි. එවැනි බොහෝ දේවල් අපට දකින්න ලැබුණ. මේ ගරු සභාවෙදිත් එවැනි දූෂණ සම් බන්ධ කරුණු අසන්න ලැබුණ. ගරු අග මැතිතුමා රයි වත්තෙ දෙමළ ස්කෝලෙ ඡන්ද පොළටත් මොරහැල ඡන්ද පොළ වත් ගිය ගමන මම සියැසින්ම දැක්ක. මගේ අදහස අග්‍රාමාත්‍යතුමා ගිය ඒ ගමන මැතිවරණ නීතිරීතිවලට විරුද්ධ බවයි. දැන් පවතින මැතිවරණ නීතියෙ එක්තරා දුර්වලකමක් තියෙනව. එනම්, ඕනෑ කෙනකුට ඒ ඒ පක්ෂවලට බලපාන පාට අඳින්න පුළුවනි, දිවංගත බණ්ඩාරනායක මැතිතුමාගෙ ඡායාරූපය හෝ ඩී. එස්. සේනානායක මැතිතුමාගෙ ඡායා රූපය හෝ ඩඩ්ලි සේනානායක මහත්මයගෙ ඡයා රූපය හෝ බණ්ඩාරනායක මැතිණිය ගෙ ඡායා රූපය හෝ යෙදීමටත් ඉඩකඩ තියෙනව. ඡන්ද සලකුණු පමණයි පාවිච්චි කරන්න බැරි. "අත" හෝ "අලියා" හෝ ප්‍රදර්ශනය කරන්න බෑ. මේ ඡායා රූප ප්‍රදර්ශනය කරගෙන යාමෙන් කෙනකුගෙ පක්ෂපාත භාවය පිළිබිඹු වෙනව. ඒ ගැන අප කල්පනා කළ යුතුයි.

ඡන්දය දෙන්න යන තැනැත්තා හැතැප්ම කාලෙ සීමාව ඇතුළත පයින් යන්නෙ මැතිවරණ ප්‍රචාරවලදි ආණ්ඩු පක්ෂය කී දේත් විරුද්ධ පක්ෂය කී දේත් කිරා බලා අවසානයෙදි කතිරය ගැසිය යුත්තෙ මොන පක්ෂයටද යන තීර ණය කරගෙනයි. ඊට බාධා වන්නට ඉඩ තැබිය යුතු නෑ, නමුත් අග්‍රාමාත්‍යතුමා රයි වත්තෙ දෙමළ පාසලේ ඡන්ද පොළට ගිය අවස්ථාවෙ ඇති වුණු තත්ත්වය මා දැක්ක. එතුමා "රයිලි" කාර් එකකින් එතෙන්ට ගියා. එතුමගෙ ඉදිරියෙන් පයි ලට් කාරෙකත් පසුපසින් වේල් කාරෙ කත් ගියා. ඊට කලින් තරුණයින් පිරි සක් ලොරියකින් ගෙන ගොස් එම තැන් තැන්වල බැස්සුව. අග්‍රාමාත්‍යතුමා එන විට එහි සිටි පොලිස් කාරයින් සේරම අයින් වුණා අර සෙනග, අර ළමයි, "ජයවේවා" කියා ප්‍රීතිඝෝෂා කරන්න පටන් ගන්නව. අගමැතිතුමා රථයෙන් බැස ඡන්ද පොළට ඇතුළු වන විට එහි සිටින නිලධාරි මහත් වරු නැගිටිනව. මක්නිසාද? ඩඩ්ලි සේනා නායක මැතිතුමා හැටියට නොවෙයි, එතුමා එන්නෙ; අග්‍රාමාත්‍යතුමා හැටියට, රටේ නායකයා හැටියට, එන්නෙ. අග්‍රාමාත්‍ය තුමා එහෙම ගියාම ඊළඟට මොකද වෙන් නෙ? එතන වැඩ කටයුතු සම්පූර්ණ යෙන්ම අවුල් වෙනව. එපමණක් නොවෙයි, ඒ මොහොතේ සිට, අග්‍රාමාත්‍ය තුමා පැමිණි මොහොතේ සිට සවස 5 වන තුරු, ඡන්දය දීම අවසාන වන තුරු, ඒ ස්ථානය පක්ෂග්‍රාහී ස්වරූපයක් ගන් නව. ඒ පෝලිමේ එක්සත් ජාතික පක්ෂ යට හෝ අග්‍රාමාත්‍යතුමාට හෝ ආදරයක් ලැදියාවක් තිබෙන කෙනෙකු සිටියොත් ඔහු අගමැතිතුමාට වඳිනව. අගමැතිතුමාත් පෙරළා ඒ තැනැත්තාට වඳිනව. ඒ සමගම පෝලිමේ සිටින අනික් ඡන්දදායකයිනුත් ඒ තැනැත්තා අනුගමනය කර මින් වඳිනව. අගමැතිතුමාත් පිළිවෙළින් ආචාර කරගෙන කරගෙන යනව. ඒක නවත්වන්න බැහැ. ඉතින් මෙවැනි දේවල් සිදු වූ විට එය සාධාරණ මැතිවරණ යක්ය කියා අපට පිළිගන්නට පුලුවන්ද? අගමැතිතුමා ඒ ගමන ගිහින් කිසිම කෙනෙකුට "අපට ඡන්දය දෙන්න" යයි එතුමාගේ කටින් කිව්වාය කියා මා කවදාවත් කියන්නෙ නැහැ. ඒක අපි දන්නව. නමුත් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්ට ඕනෑය කියා කෑගහන ජන රංජන නායකයකු විසින් යායුතු ගම නක් නොවෙයි, එදා ගරු අගමැතිතුමා ගියෙ.

නියෝජ්‍ය කථානායකතුමනි, තවත් කාරණයක් තිබෙනව. පසුගිය මහා මැති වරණයේදී බලපෑම් ඇති වුණේ නැත කියා කියන්ට බැහැ. අභාග්‍යයකට මෙන් 1965 මාර්තු 22 වැනිදායි, මහා මැතිවරණය සඳහා අප තෝරා ගත්තෙ. ඊට පෙර දින සැම පන්සලකම වාගේ ඩී. එස්. සේනා නායක ගුණානුස්මරණ සභා කියා එකක් පටන් ගත්ත. ඒක හොඳ නැති දෙයක්ය කියා මා කියනවා නොවෙයි. මමත් හැම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

අවුරුද්දකම වාගේ ඩී. එස්. සේනානායක ගුණානුස්මරණ සභාවලට යන කෙනෙක්. නමුත් මැතිවරණයට පෙර දින, නැසී ගිය ඩී. එස්. සේනානායක මැතිතුමාගෙ නාම යෙන් අපට ඡන්දය දෙන්නය කියා පෙළ ඹිමක්, ඒ කළේ. එවැනි පෙළඹිමක් පල්ලි වලිනුත් කළා. අපි ඒවත් දැනගන්න ඕනැ. පිරිසිදු මැතිවරණ පවත්වන්නට ඕනැය කියනවා නම් අපි මේ සෑම අංශ යක් ගැනම බලන්න ඕනැ.

තවත් කාරණයක් තිබෙනව. ඒක බලංගොඩ මද්දෙගම කියන ගමේ වූ සිද්ධියක්. පසුගිය මහා මැතිවරණයෙන් බලංගොඩ කොට්ඨාශය ජයග්‍රහණය කළ සී. එස්. රත්වත්තෙ මැතිතුමාට ඒ කොට්ඨාශය අහිමි වුණේ පියසේන කියන මහත්මයකු විසින් ඉදිරිපත් කළ ඡන්ද පෙත්සම නිසයි. ඒ පියසේන කියන මහත් මය මද්දෙගම හිටපු ආරච්චි රාළ කෙනෙක්. ඒ පෙත්සමෙන් ජයග්‍රහණය කළාට පසු මේ පියසේන කියන පුද්ගලය ඒ ප්‍රදේශය දෙවනත් කරමින් අනෙක් ඡන්දදායක යින්ට තර්ජන හිරිහැර ඇති වන ස්වරූප යෙන් ඡන්ද කටයුතු කර තිබෙනව. මැති වරණ දිනයේදී මද්දෙගමට යන්න මා තුළ බලාපොරොත්තුවක් තිබුණේ නැහැ. නමුත් මේ පියසේන කියන තැනැත්තා ඡන්ද පොළේ නොමනා වැඩ පිළිවෙළක් ගෙන යනවාය කියා මට ආරංචියක් ලැබුණා. මද්දෙගමට යන්න පොඩි පඩි පෙළක් තිබෙනව. මට මතක හැටියට ශ්‍රී පියරතන ධම් ශාලාවෙයි, ඡන්ද පොළ තිබුණේ. මේ පුද්ගලයා ඒ ස්ථානයෙ අලිය වගේ සළකුණක් ගහගෙන අනිකුත් ඡන්දදායකයින්ට තර්ජනයක් වන අන්ද මේ වැඩ පිළිවෙළක් ගෙන ගියා. නමුත් කවුරුවත් ඊට විරුද්ධව ඉදිරිපත් වුණේ නැහැ. එතන අංක 7061 දරණ පොලිස් නිලධාරිය හිටිය. මම ඒ මහත්මයට අඬ ගසා මේ ගැන කිව්ව. නමුත් ඒ මහත්මයට කරන්න දේකුත් නැහැ. තාර පාරෙ සිට සැතපුම් භාගයක් දුර පයින් යන්න ඕනැ මේ මද්දෙගම කියන ගමට. මේ ස්ථානයට පොලිස් නිලධාරීන් දෙදෙනයි පත් කර හිටියෙ. මා කලින් සඳහන් කළ අංකය දරන පොලිස් නිලධාරි මහත්මය පියසේන එතැනින් ඉවත් කරන්න මහන්සි ගත්ත. ඊළඟට මා මේ ගැන ඡන්ද ස්ථානාධිපති මහත්මයටත් කියන්න ඕනැය කියා ගියා. ඡන්ද ස්ථා නාධිපති මහත්මයගෙන් මා ඇත්ත වශ යෙන්ම කළේ ඉල්ලීමක්. මා කළ ඉල්ලීම නම්, ඡන්ද පොළට සැතපුම් කාලක් ඇතුළත කිසිම කෙනෙකුට ඡන්ද වැඩ කරන්ට ඉඩ දෙන්න එපාය, අලියා ලකුණ හෝ අත ලකුණ හෝ තිබෙන සෑම දෙයක්ම ගලවා දමන්නය යන්නයි. ඒ මහත්මය මගේ ඉල්ලීම පිළිගත්තා. පිළිගෙන අර පියසේන කියන තැනැත්තා එතැනින් පන්නා ගෙන තිබෙනව. ඊළඟට මා ආපසු එන විට මේ පියසේන කියන තැනැත්තා අර පොලිස් නිලධා රියාටත් ඡන්ද නිලධාරීන්ටත් කිය නව, " උඹල හිතන්න එපා මේක බණ්ඩාර නායක යුගය කියල, මේක සේනානායක යුගය " කියා. ඒ අන්දමේ තර්ජනාත්මක දේවල් අදත් ගම්වල සිද්ධ වෙනව. මැරවර බලය යෙදූ අවස්ථා ගැන අප දන්නවා. එදා රාත්‍රියේ මා උඩවෙල නමැති ගමට ගියා. එක්සත් ජාතික පක්ෂයේ උදවිය මොනවා කරනවා දැයි බලා ගැනී මටයි, එසේ ගියේ. එක්සත් ජාතික පක්ෂයේ උදවිය කොළපාට කබා ඇඳගෙන උඩවෙල ගමේ පාරේ තොග ගණනින් සිටියා. ඒ අය මොනවා කරනවා දැයි බලන ලෙස මා අපේ හිතවතුන්ට කීවා. එක්සත් ජාතික පක්ෂයේ ආධාර කාරයන් ඒ ස්ථානයේ තබා ගැනීමටයි, මට වුවමනා කෙළේ. අපේ කණ්ඩායමත් ඔවුනොවුන් මුහුණ බලාගෙන එදා රෑ නවයේ සිට පසුදා පාන්දර පහ පමණ වනතුරු සිටියා. මෙහි ප්‍රතිඵලයක් වශ යෙන් මේ වර උඩවෙල ගමින් ගිය වතා වට වඩා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඡන්ද ලැබුණා.

කොයි තරම් නීතිරීති තද කළත් අයුතු බල පාන්නට ඉඩ දුන්නොත් මේ රටේ පිරිසිදු මැතිවරණයක් ඇති කරන්නට ලැබෙන්නේ නැහැ. දැන් තිබෙන තත්ත්‍වය අනුව මුදල් නැති කෙනකුට මේ රටේ මැතිවරණ සටනක් සාර්ථක ලෙස කර ගෙන යන්නට අමාරුයි. මා එසේ කියන්නේ හේතු ගණනාවක් නිසයි. ඒවා එකින් එක ගෙන හැර දක්වන්නට මා දැන් අදහස් කරන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1956 න් පසු බණ්ඩාරනායක අගමැතිතුමා අදහස් කෙළේත් ක්‍රියා කෙළේත් මේ රටේ සාධාරණ මැතිවරණ ඇති කරන්නටයි. ධනය කොතරම් අඩු වුවත් කොතරම් වැඩි වූවත් හැම කෙනකුටම සාධාරණ ලෙස මැතිවරණ පැවැත්වීම සඳහා ඒ කාලයේදී නීතිරීති ඇති කළා. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් තමයි, "ගස් ගෙඩි කඩන කොල්ලන් අද පාර්ලිමේන්තුවට පැමිණ සිටිනවා" යයි එක්තරා හිටපු අගමැතිවරයකු ප්‍රකාශ කෙළේ. තවමත් සෑහෙන තරම් දුරට මුදල් බලය පාවිච්චි කරන්නට පුළුවනි.

ලංගම බස් යෙදවීම ගැනත් වචනයක් දෙකක් කියන්නට කැමතියි. ලංගම බස් යෙදවීමෙන් නම් සාඵක ප්‍රතිඵල ලැබුණේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මැතිවරණ රැස්වීමක් බලංගොඩ තිබුණු දවසේ ඒ ප්‍රදේශයේ ධාවනය කරවන ලද බස් රථ සංඛ්‍යාව ඉතාමත්ම අඩුයි. සමහර විට පැය ගණනකට එක බස් රථයක්වත් ධාවනය කෙළේ නැහැ. නමුත් එක්සත් ජාතික පක්ෂයේ රැස්වීම පැවැත්වූ දින යේ ලංගම බස් රථ බොහෝ ගණනක් ධාවනය කරවා තිබුණා. ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම උඩ මැතිවරණ සමයේ දී නොයෙකුත් රැස්වීම් සඳහා බස් රථ වැඩිපුර යොදවා තිබුණා. එසේ වුවත් එම බස් රථ ධාවනයෙන් ලංගමයට පාඩු සිදු වුණා මිස ලාභ ලැබුණේ නැහැ. හැම දෙනාම බලාපොරොත්තු වුණේ ඒ බස් රථවල නොමිලයේ ගමන් කරන්නටයි. එක්සත් ජාතික පක්ෂයේ රැස්වීමක් පින්නවල පැවැත්වුණු දවසෙ පැය දෙකක් ඇතුළත ලංගම බස් රථ 35 ක් පින්න වලින් හරවා ධාවනය කළ බව මා දැක්කා. බලංගොඩටම බස් රථ 25ක් ධාවනය කෙරෙව්වා. ඒ හැර බලංගොඩ-රත්නපුරය, බලංගොඩ-හපුතලේ ආදී වශයෙන් තවත් බස් රථ විශාල ගණනක් ධාවනය කෙරෙව්වා. [බාධා කිරීමක්] මා ඒ ප්‍රදේශයේ වැඩ කළ නිසා මා ඒ කරුණු දන්නවා. ඒ සැම ධාවනයකින්ම පාඩුයි. අද බස් රථ ගමනාගමනය කඩා වැටී තිබෙනවා නම් එසේ සිදු වී තිබෙන්නේ ඒවා නිකරුණේ ධාවනය කරවීම නිසයි. ඒ බස් රථවල එක්සත් ජාතික පක්ෂයේ ආධාරකරුවන් දෙදෙනෙකුත් දෙනකු හෝ ගමන් කරමින් එක්සත්

ජාතික පක්ෂයට ඡන්දය දිය යුතු යයි සඳහන් කළා. ඒකත් එක්තරා විධියක පෙළඹවීමක් බව කියන්නට කැමතියි. එසේ හෙයින් පසුගියදා සාධාරණ මැතිවරණයක් ඇති වුණා යයි අපට කියන්නට පුළුවන්කමක් නැහැ.

දන්වීම් ඇලවීම සම්බන්ධයෙනුත් වචනයක් දෙකක් කියන්නට කැමතියි. "මෙය ප්‍රසිද්ධ ස්ථානයක ඇලවීමට නොවේ" යන වාසගමද මුද්‍රණය කරන ලද දැන්වීම් බෙදා හරිනවා. නමුත් කරන පළමු වැඩේ ඒක ප්‍රසිද්ධ ස්ථානයක ඇලවීමයි. මොරහැල්ල හන්දියේ සිට පාගල් ඕවිට, පඹදෙනිය, කුරුපනාවල නමැති ගම් හරහා ඇටවත්තලම නැමති හන්දිය දක්වාත්, ඒ හන්දියේ සිට පින්නවල ප්‍රදේශය දක්වාත් දිගටම පාර අයිනේ පෞද්ගලික ගස්වල අග්‍රාමාත්‍යතුමාගේ ඡායා රූපයත්, එතුමාගේ පැමිණීම පිළිබඳ දැන්වීමත් අලවා තිබුණා. එපමණක් නොවෙයි, පාගල් ඕවිට නමැති ගමේ ගම් සභා කාර්යාලය ඉදිරිපිට ගෙයක අබුසාලි මහත්මයාට ඡන්දය දෙන්නය කියා අලියා ලකුණත් සමග දැන්වීමක් ගහල තිබුණා කතිරයත් ගහල තිබුණා. මම පොලීසියට ගිහින් ඇහුව, ඇයි ඒක ගලවන්නෙ නැත්තෙ කියා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
කව්ද ගැහුවෙ?

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)
ඡන්දදායකයා. පාගල් ඕවිට වී. සී. එක ඉදිරිපිට ගෙදරක. ජේසුස්වාමිදරුවන්ගේ රූපයකුත් ඒ ගෙදර ගහල තිබුනා. ඒගේ මට හොඳට මතකයි. පොලිසියට ගිහින් කිව්වට පොලිසිය ඒක ගලවා දැම්මෙ නැහැ. ඒක පෙළඹවීමක්, නීතියක් තියෙනවා නම් මැතිවරණ සලකුණ පාවිච්චි කරන්න පුළුවන් රැස්වීමක පමණක්ය කියා, ඒ නීතිය කඩ කළාම පොලිසිය ක්‍රියා කරන්නෙ නැත්තෙ ඇයි? එවැනි තත්ත්වයකින් පෙනෙන්නෙ ආණ්ඩු බලය තිබෙන පක්ෂයට පොලිසිය සෑහෙන ලැදියාවක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

දක්වන බවයි. ඒ අය බයයි. ඒ හේතුව නිසාම, මේ රටේ මැතිවරණ මේ මොහොත වන තුරුම සාධාරණව කෙරුණාය කියා අපට නම් විශ්වාස කරන්න බැහැ.

මැතිවරණ කාලයේදී ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න ඕනෑය කියා රජයේ වැඩ පිළිබඳ ගරු ඇමතිතුමා විශාල ප්‍රකාශයක් කළා. නමුත් එතුමාගේ ආණ්ඩුවෙන් ඒ ප්‍රදේශයට ගොස් වැඩ කළ අය මැතිවරණ කාලයේදී කුරුපනාවල පාලම මනින්න පටන් ගත්තා, එක්සත් ජාතික පක්ෂයට ඡන්දය ලැබුනොත් පාලම හදනවය කියා පෙන්වීමට. ගරු මැතිනියත් දන්නව ඇති, මේ කාරණය. විදුලි බල ඇමතිතුමා කල්තොට රැස්වීමක් පවත්වා කිව්වා, ඒ ගමට විදුලි බලය දෙනවය කියා. මැතිවරණයට දවස් දෙකකට පෙර බොහොම ලොකු වයර් රෝලක් ලොරියක දමාගෙන ගෙනිච්ච, විදුලි බලය දෙනවය කියා පෙන්වීමට. 26 වැනිදා ඒ වයර් රෝල ආපසු ගෙනිච්ච.

මම එක ඉල්ලීමක් කරන්න කැමතියි. බලන්ගොඩ සාමාන්‍ය ජනතාව සමග සති තුනක් පමණ එකට ආශ්‍රය කරල, ඒ අයගෙන් බත් වේලක් කාපු නිසා, තේ කෝප්පයක් බීපු නිසා මම එක ඉල්ලීමක් කරනව. අතුරු මැතිවරණ කාලයේදී පොරොන්දු වූ රක්ෂාවල් ටික කරුණාකර ඒ අයට දෙන්න.

**මෛත්‍රීපාල සේනානායක මයා.** (මැදවච්චිය)

*(திரு. மைத்திரிபால சேனநாயக்க—மதவாச்சி)*

(Mr. Maithripala Senanayake—Medawachchiya)

බැරි නම් 65 දී පොරොන්දු වූ ඒවා දෙන්න.

**ජයකොඩි මයා.**

*(திரு. ஜயக்கொடி)*

(Mr. Jayakody)

බැරි නම් 65 දී පොරොන්දු වූ ඒවා දෙන්නය කියා මැදවච්චියෙ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මයා.) කියනව. වැගම්පිටිය ගමේ එක්සත් ජාතික පක්ෂ ශාඛාව වෙනුවෙන් ය කියා ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා ඉල්ලුම් පත්‍රයක් සකස් කර බෙදා හැර අත්සන් ලබා ගත්තා. නම, ගම, බලාපොරොත්තු වන රක්ෂාව, දනට තත්ත්වය ආදී සෑම කරුණක්ම ඒ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරන්න සූදනම් කර තිබුන, හරියට මඟුල් කපුකමක් කරන්න වගේ. අබුසාලි මහත්මයාට ඡන්දය දෙන්නට, ඒ මහත්මයාට පක්ෂපාතිත්වයෙන් කටයුතු කරන්නට පොරොන්දු වෙනවාය කියා ඒ ලියවිලිවලට අත්සන් කරවා ගත්තා. මේ විධියට මැතිවරණ කාලවලට දෙන බොරු පොරොන්දු නිසා කරන නීති විරෝධි පෙළඹීම් නිසා මැරවර බලය යෙදවීම නිසා ඡන්දය දීමට යාම වැළැක්වීමට කටයුතු කිරීම නිසා අපට විශ්වාස කරන්න පුළුවන්ද, මේ රටේ මෙතෙක් සාධාරණ මැතිවරණයක් පැවැත්වුනාය කියා ? එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කළ පසුගිය මැතිවරණය සාධාරණ මැතිවරණයක් වුනාය කියා අපට විශ්වාස කරන්න පුළුවන්ද ? එම නිසා පත්වන්ට යන කමිටුවට ලොකු වගකීමක් තිබෙනව. මැතිවරණ නීතිරීති සාධාරණ තත්ත්වයට ගෙන ඒමට නීතිරීති ගණනාවක්ම ඉදිරිපත් කරන්ට සිදු වී තිබෙනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් ප්‍රකාශ කරන්ට යෙදුණ, මේ අතුරු මැතිවරණ අපි පැවැත්තුවෙ 1964 පිළියෙළ කරන ලද ඡන්ද ලැයිස්තු අනුවය කියා. ඒක වැරදියි. එහි සත්‍යතාව මා අද උදේ සොයා බැලුව 1965. ජූලි මාසයේ සහතික කරන ලද ඡන්ද ලැයිස්තු අනුවයි, මේ ඡන්ද විමසීම පැවැත්තුවෙ. සමහරවිට ඇතැම් මන්ත්‍රීවරු කියයි, මේව සකස් කළේ 1964 යි කියා. එහෙත්, සහතික කරන ලද දිනයයි නීත්‍යානුකූල දිනය හැටියට සලකන්නෙ. 1965 මහ මැතිවරණය පවත්වන්ට යෙදුණෙ, 1963 දී සකස් කරන ලද ඡන්ද ලැයිස්තු අනුවයි. 1965 මැතිවරණය පවත්වන ලද ඡන්ද ලැයිස්තු සංශෝධනය කර සකස් කරන ලද අළුත් මැතිවරණ ලැයිස්තුවල සමහර අයගෙ නම් ඇතුළත් වී නැති බව පෙනී ගියා. බලන්ගොඩ 2,000 කගේ විතර නම් කපා හැර තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වෙලගෙදර මයා.**
*(திரு. வெலகெதர)*
(Mr. Welagedera)
**යූ. එන්. පී. කාරයින්ගෙ.**

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

තමුන්නාන්සේ කොහොමද දන්නෙ යූ. එන්. පී. කාරයන්ගෙ කියල? [බාධා කිරීමක්] කොළපාට තොප්පියක් දමාගෙන සිටි පුද්ගලයෙකුගෙන් මා ඇහුව, මොකද අයිසෙ තමුසෙ කොළපාට තොප්පියක් දමාගෙන ඉන්නෙ කියා. ඔහු, නැහැ සර්, කිව්ව. බලන කොට එහි ඇතුළ නිල්පාටයි. ඇඟට ගෑවෙන පැත්ත නිල්පාටයි. පිටින් කොලපාටයි. ඒක හොඳට හිතේ තියා ගන්න. අපි ඡන්ද දවසෙ පැරදිල නිල් පාට කියන නාමයක් නැහැ. ප්‍රසිද්ධියෙ පාට ඇන්දෙ අපි වගේ එළියට පෙනෙන් නට පුළුවන් කට්ටිය විතරයි. අනික් හැම දෙනාම කොලපාටයි. උඩින් දිනුව.

**එකල්හි වේලාව අ. භා. 7 වූයෙන් කටයුතු අත්සිටුවා විවාදය කල් තබන ලදි.**

**එතැන් සිට විවාදය 1966 නොවැම්බර් 9 වන බදාදා පවත්වනු ලැබේ.**

அப்போது பி. ப. 7 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்தி வைக்கப்பெற்றது.

1966, நவம்பர் 9 புதன்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.

*It being 7 P.M., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Wednesday 9th. November 1966.*

## කල් තැබීම

### ஒத்திவைப்பு

### ADJOURNMENT

**යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි:**

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය",—[ගරු ජේ. ආර්. ජයවර්ධන].

"சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக"—[கௌரவ ஜே. ஆர். ஜயவர்தன] என்னும் பிரேரணை பிரேரிக்கப்பட்டு வினா எடுத்தியம்பப்பெற்றது.

*Motion made, and Question proposed, "That the House do now adjourn"—[The Hon. J. R. Jayewardene]*

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

අගමැතිතුමාට ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්ට තිබෙනව. එතුමාගෙ ආණ්ඩුවත් ඊට පෙර තිබුණු ආණ්ඩුවත් වශයෙන් අපි එක්තරා ප්‍රතිපත්තියක් මෙතෙක් අනුගමනය කර තිබෙනව. පිටරටවල ඇතිවන යුද්ධ සම්බන්ධයෙන් කොයිම පැත්තකටවත් උදව් නොකර අපක්ෂපාතව ක්‍රියා කිරීමේ ප්‍රතිපත්තිය මෙතෙක් අපි අනුගමනය කරගෙන ආව. ඒ ප්‍රතිපත්තිය අනුව ඉන්දුනීසියානු යුද්ධය පැවති අවස්ථා වෙදි ඕලන්දක්කාරයන්ට අවි ආයුධ ගෙන යන්ට අපේ ගුවන් තොටුපොළ වල් හෝ වරායවල් පාවිච්චි කරන්ට අපි ඉඩ නුදුන් බව මට මතකයි. ඉන්දු-චීන අරගලයෙදි ප්‍රංශ අධිරාජ්‍යවාදීන් විසින් මේ රටේ වරායවල් පාවිච්චි කරන්ට වැයම් කළ ඇතැම් අවස්ථාවලදි අප ඊට ඉඩ දුන්නෙ නැහැ.

මා කියන්නෙ නැහැ, මේ සඳහන් කරන්ට යන කාරණය අගමැතිතුමා දන්නවා කියා. සමහරවිට නොදැනුවත්වම මේ වැඩේ සිදුවී තිබෙනව කියන එකයි, මට ලැබී තිබෙන ආරංචිය. මේ ළඟදී ගිය සතියේ ලංකා වරායකට නැවක් ඇවිත් තිබෙනව. ඒ නැවේ සෑහෙන ප්‍රමාණයකට යුද අවි ආයුධ තිබුණු බව අපට ආරංචියි. එහි සයිගොන් නුවරට ගෙන යන බඩු එළියේ පෙනෙන්ට පටවා තිබුණු නමුත් ඒ තුළ යුද අවි ආයුධ තිබුණු බව එහි වැඩ කළ කම්කරුවන් අපට දැනුම් දුන්න. එය කණගාටුදායක කාරණයක්. අගමැතිතුමා සමහර විට දන්නෙ නැතුව ඇති. එහෙත් මා හිතනව, එතුමා මේ සම්බන්ධයෙන් සෑහෙන ක්‍රියාමාර්ගයක් ගත යුතුයි කියා. මේ විදියෙ වැඩකට ඉඩ දෙන්ට එපා කියා මා ඉල්ලා සිටිනව. ඒ නැව කීප දවසක් වරායෙ නැවතුම් ගෙන යම් යම් පහසුකම් ලබාගෙන තිබෙනව. එය කනගාටුදායක වැඩක්. යම් ප්‍රතිපත්තියක් තිබෙනව නම් ඒ ප්‍රතිපත්තිය රැකීම අපේ සිරිතක්. වරායෙ නිලධාරීන් අතින් ඒ සම්බන්ධයෙන් යම්කිසි අතපසුවීමක් වුණා නම් නැවතත් ඒ විදියෙ දෙයක් වෙන්ට ඉඩ නොතබන අන්දමට වැඩ කරන හැටි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

යට මම ඉල්ලා සිටිනව. මම කල්පනා කරන්නෙ නැහැ, අගමැතිතුමාගෙ අනුදැනුම ඇතිව එම වැඩේ සිදු වුණාය කියා. මට මතක හැටියට අගමැතිතුමා මේ ස්ථානයෙ ප්‍රකාශ කර තිබෙනව, අපක්ෂපාතව කටයුතු කිරීමේ ප්‍රතිපත්තියට සෑම අවස්ථාවකදිම ගරු කරනවාය කියා.

අ. භා. 7.3

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

පසුගිය ගංවතුරෙන් මාතර ප්‍රදේශයේ—මාතර නගරය තුළත්, නගරයෙන් බැහැර හිත්තැටිය, ගොඩගම, තුඩාව යන ප්‍රදේශවලත්—මහජනයා විශාල හිරිහැරයකට මුහුණ පෑව. නිතර නිතර සිදු වන ජල ගැලීම් නිසා ගෙවල් කැඩී යාමෙන් අලාභහානි සිදු වුණු උදවියට සහනාධාර වශයෙන් විශාල මුදලක් වැය කරන්ට සමාජ සේවා දෙපාර්තමේන්තුවට සිදු වී තිබෙනව. කුමන ආණ්ඩුවක් තිබුණත්, මේ ප්‍රශ්නය සමාජ සේවා දෙපාර්තමේන්තුවට ලොකු හිසරදයක්. ජල ගැලීම්වලින් පීඩා විඳින මහජනයා ඉල්ලීමක් කර තිබෙනව, ජල ගැලීම්වලට ලක් වන ප්‍රදේශ අත්හැර යෑමට, ගංවතුරෙන් ආරක්ෂිත ප්‍රදේශවල ඉඩම් ලබා දෙන හැටියට. මේ වගෙ අවස්ථාවක ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිතුමාගෙ අවධානය යොමු කරන්ට කැමතියි, මෙන්න මේ කරුණ ගැන: මාතර නගරයට ආසන්න වෙලේගොඩ ප්‍රදේශයෙ හාමුගෙවත්ත කියන අක්කර 29 ක පමණ ඉඩම නව ආරෝග්‍යශාලාවක් ගොඩනැඟීම සඳහා පසුගිය ආණ්ඩුව තිබුණු කාලෙ රජයට ගත්ත. ආරෝග්‍යශාලාව දැනට පවතින භූමියේම ගොඩනැඟීමට වර්තමාන ආණ්ඩුව තීරණය කළ නිසා, අක්කර 29 ක් පමණ වූ මේ ඉඩම ආපසු ඉඩම් හිමියාට දී තිබෙන බව කියන්නේ කණගාටුවෙන්. මේ ඉඩම අයිතිකරු, එක්සත් ජාතික පක්ෂයෙ නායකයෙක් වන ඩොනල්ඩ් ජේ. රණවීර මහතායි. මේ ඉඩම ආපසු ඉඩම් හිමියාට දීමට හේතුවුණු කරුණු මොනවාද, නැවත එම ඉඩම රජයට ගෙන ගංවතුරෙන් පීඩා විඳින මහජනයාට එය බෙදා දීමට ක්‍රියා කිරීමට එතුමා එකඟ වෙනවාද, කියා මා මේ අවස්ථාවේ ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිතුමාගෙන් දැනගන්ට කැමතියි.

ඒ සමඟම රාජ්‍ය කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙනුත් ඉල්ලීමක් කරන්ට ඉඩ දෙන හැටියට මා ඉල්ලා සිටිනව. දැන් කොළඹ නගරයෙ හේලි සමාගමේ වැඩ වර්ජනයක් පවතිනව. මේ වැඩ වර්ජනය තිබෙන අවස්ථාවේදි කොන්ත්‍රාත්කරුවන් විසින් මේ සමාගමේ සිට වරාය දක්වා කොහු ලණු ගෙන යන බව දැනගන්ට ලැබී තිබෙනව. මේ කොන්ත්‍රාත්කරුවන්ට පොලිස් ආරක්ෂාව දීමට එතුමා නියම කර තිබෙනවද කියා මා දැනගන්ට සතුටුයි. වැඩ වර්ජනයක් තිබෙන අවස්ථාවක පොලිසිය සාමය ආරක්ෂා කිරීම ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. නමුත් වැඩ වර්ජනයට විරුද්ධව වැඩ කරන කොන්ත්‍රාත්කරුවන් ආරක්ෂා කරන්ට පොලිසිය යොදවා තිබෙන්නෙ මන්ද කියා රාජ්‍ය කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙන් මා ප්‍රශ්න කරනව.

අ. භා. 7.6

**වෛද්‍යාචාර්ය එම්. එච්. සද්ධාසේන (අම්බලංගොඩ)**

*(வைத்திய கலாநிதி எம். எச். சத்தாசேன —அம்பலாங்கொடை)*

(Dr. M. H. Saddhasena—Ambalangoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන අමාත්‍යාංශයේ සේවයට බඳවා ගන්නා ලිපිකරුවන්, ලඝු ලේඛකයන් ආදීන් තෝරා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍ර තනිකර දෙමළෙන් හා ඉංග්‍රීසියෙන් පමණක් මුද්‍රණය කර තිබෙන බව දැක්වෙන ප්‍රවෘත්තියක් ඊයේ "දවස" සහ "සන්" පත්‍රවල පින්තූර සමඟ පළ කර තිබුණා. ඒ ප්‍රවෘත්තියෙ යම්කිසි සත්‍යතාවක් තිබෙනවද, එහෙම නැත්නම් එය මහජනයා මුළා කිරීම සඳහා කළ ප්‍රයෝගයක්ද, එම ඉල්ලුම් පත්‍ර සිංහලෙනුත් මුද්‍රණය කර තිබෙනවාද, කියා මා පළාත් පාලන ඇමතිතුමාගෙ පාර්ලිමේන්තු ලේකම් තුමාගෙන් දැනගන්ට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 7.7

**විජයසුන්දර මයා.**
*(திரு. விஜேசுந்தர)*
(Mr. Wijesundara)

මම මේ අවස්ථාවේදී සමාජ සේවා ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහන්ට කැමතියි. නමුත් ඊට ප්‍රථමයෙන් මා එතුමාට ස්තුතිවන්ත වෙනව, ගංවතුර සහනාධාර සම්බන්ධයෙන් විරුද්ධ පක්ෂය වෙනුවෙන් එතුමා හමුවීම සඳහා පැමිණි බද්දේගම ගරු මන්ත්‍රීතුමත්, කඹුරුපිටියෙ ගරු මන්ත්‍රීතුමත් ප්‍රමුඛ නියෝජිත පිරිසට සැලකූ ආකාරය ගැන. ඒ සමගම කාරණා කීපයක් හදිසියෙන් මතු කරන්ට සිදු වී තිබෙනව.

විශෙෂයෙන්ම ගංවතුර සහනාධාර බෙදීම සම්බන්ධයෙන් බලන විට, ආණ්ඩුවෙන් ඒ සඳහා මොනයම් වැඩ පිළිවෙලක් තිබුණත්, මොනයම් වැඩ පිළිවෙළක් අනුව බෙදුවත්, පත්‍ර මාර්ගයෙන් දකින්නට ලැබෙන ප්‍රචාරයේ හැටියට යම් යම් පෞද්ගලික ආයතන මේ සම්බන්ධයෙන් මූලිකත්වය දරණ විත්තියක් ප්‍රකාශයට පත් වී තිබෙනව. මේ අනුව වැරදි හැඟීමක් ඇති වන බව අමුතුවෙන් කිය යුත්තක් නොවෙයි. රත්නපුර දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් රත්නපුර දිසාපතිවරයා හොඳින් ක්‍රියා කළා. නමුත් යම් යම් අඩු පාඩු නිසා, නීති රීතිවල වැරදි නිසා එසේ සැලසූ සහනාධාර හරියාකාර ලබා දීමට අපහසු තත්ත්වයක් ඇති වී තිබෙනව. මෙහි පළමුවෙනි අඩුපාඩුකම හැටියට මම පෙන්වා දෙන්නෙ පෝරම ක්‍රමයයි. යම් කිසි පෝරමයක් පුරවා දීමට සෑම වැසියකුටම සිද්ධ වී තිබෙනව. ගංවතුරෙන් නිවාස අබලන් වී ගිය, නිවාස කැඩී ගිය, ඒ දුප්පත් සෑම කෙනකුටම මම හිතන්නෙ නැහැ මෙම පෝරම පිරවීම පිණිස පහසු වෙන් ලිපිකරුවන් සොයා ගැනීමට පුළුවන්ය කියා. එම නිසා පෝරම පිරවීමේ ක්‍රමය වහාම අස් කර දැමිය යුතු බව මම පළමුවෙනි කාරණාව හැටියට පෙන්වා දෙනව.

ඒ වාගේම මෙසේ ගංවතුරෙන් අබලන් වී කැඩී විනාශ වී ගිය නිවාස වැඩි වශයෙන්ම කුලියට සහ බද්දට පදිංචිවූ වැසියන් සිටි නිවාසයි. එසේ කුලියට හෝ බද්දට සිටි වැසියන්ට ඒ ගෙවල් සම්බන්ධයෙන් යම් ලියවිල්ලක් දෙන්න අයිතිකරුවන් සූදානම් නැහැ. ඒ ලියවිලි ආදිය ඉදිරිපත් කර ආධාර ලබා ගැනීමට අනාථ වූ වැසියන් පුළුවන් තරම් උත්සාහ කරනව. එහෙත් මුදල් ආධාර ලබා ගැනීමට කිසිම පුළුවන්කමක් තවමත් ඔවුන්ට දැන් සැලසී නැහැ. ඒ නිසා ඔවුන් විශාල කරදරයකට අද මුහුණ පා සිටිනව. මේ කරුණු සලකා බලා ඔවුන්ගේ කැඩී බිඳී විනාශ වී ගිය ඒ ගෙවල් රජය මගින්වත් අලුත්වැඩියා කර දීමට වැඩ පිළිවෙළක් සැලැස්විය යුතුය කියා මම කල්පනා කරනව.

අනික් අතින් රජයේ ඉඩම්වල පදිංචි අයටත් ඒ සහනාධාර ලැබෙන්නෙ නැහැ. බලහත්කාරයෙන් පදිංචිව සිටියේ වී නමුත්, රජය විසින් ඔවුන්ගේ ඒ පදිංචිය ස්ථිර කිරීමට බලාපොරොත්තුව සිටි පුද්ගලයන්ගේ නිවාසවලටවත් තවම සහනය සැලසී නැහැ. ඒ වාගේම ගංවතුරෙන් නොවූවත්, අධික වර්ෂාව නිසා සමහර ප්‍රදේශවල ගෙවල් විශාල සංඛ්‍යාවක් සේදී විනාශ වී ගොස් තිබෙනව. ඒ සඳහාත් තවම හරියාකාර සහනාධාර ක්‍රමයක් සැලසී නැහැ.

ඒ එක්කම කියන්න කැමතියි, පළාත් පාලන ආයතනය මගින් පාලනය කරනු ලබන, පළාත් පාලන අමාත්‍යාංශය යටතේ තිබෙන බොහෝ පාලම් සහ බෝක්කු සේදී ගොස් තිබෙනව. ඒවා අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් තවමත් කිසි පියවරක් ගෙන නැහැ. ඒ නිසා මෙහි ඇති හදිසි තත්ත්වය ගැන සලකා නීති රීති වෙනස් කර හෝ, අනාථ වී සිටින වැසියන්ට හැකි පමණ ඉක්මණින් සහනය සලසා දෙන ලෙසත්, කැඩී බිඳී ගොස් තිබෙන පාලම් බෝක්කු යනාදිය ප්‍රතිසංස්කරණය කරන ලෙසත්, සමාජ සේවා ඇමතිතුමාගෙන් හා පළාත් පාලන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

අ. භා. 7.10

**සෝමවීර චන්ද්‍රසිරි මයා. (කැස්බෑව)**
*(திரு. சோமவீர சந்திரசிறி—கெஸ்பாவ)*
(Mr. Somaweera Chandrasiri—Kesbewa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මතු කරන මෙම ප්‍රශ්නය මම යොමු කරන්නෙ ගරු අගමැතිතුමාගෙ අවධාන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෝමවීර චන්ද්‍රසිරි මයා.]

යටයි, සිංහල භාෂා පෙරමුණ මගින් භාෂා පෙරහැරක් අනුරාධපුර ශුද්ධ භූමිය කරා සංස්කෘතික ලක්ෂණයන්ගෙන් යුතුව ගෙන යාමට යෙදූ වැඩ පිළිවෙළක් කඩාකප්පල් කොට ඒ පෙරහැර යාමට දුන් අවසර පත්‍රය අවලංගු කර දමා තිබෙන නිසා එසේ අවලංගු කිරීමට හේතුව කුමක්ද කියා දැනගැනීම පිණිසයි මේ කාරණය ඉදිරිපත් කරන්නෙ.

සිංහල භාෂා පෙරමුණ මීට අවුරුදු 10කට පමණ පෙර ආරම්භ කරන ලද පෙරමුණක්. සිංහල ජනතාවගේත්, සිංහල ජාතියේත් සිංහල භාෂාවේත් දියුණුව පිණිස සිංහල භාෂා සටන මෙහෙයවීම පිණිස ආරම්භ කළ ඒ පෙරමුණ මොන අවස්ථාවකදීවත් ප්‍රචණ්ඩ ක්‍රියාවක යෙදුණ පෙරමුණක් නොවෙයි. එකී සිංහල භාෂා පෙරමුණ පටන්ගත් යුගයේ එහි සභාපති වුණේ මමයි. එහි ලේකම් වශයෙන් පත් වුණේ අද ආණ්ඩුවේ ඇමතිවරයකු වූ ගාල්ලේ මන්ත්‍රීතුමා නොහොත් ඩබ්ලිව්. දහනායක මහතායි. සිංහල භාෂා පෙරමුණ පටන් ගත් අවදියේදී රටේ බලයේ සිටියේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවයි; සර් ජෝන් කොතලාවල මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවයි. සිංහල භාෂාවට ලැදිව, භාෂාව පිළිබඳව ක්‍රියා කරන උදවිය සටන් බිමට පැමිණ, එක්තරා පෙරමුණක් සෑදී පෙරමුණට පැමිණ, සිංහල ජාතියත්, භාෂාවත්, සාහිත්‍යයත් ආරක්ෂා කර ගත යුතුය කියන හැඟීම උඩ පෙරමුණක් පිහිටුවා ගත්ත. ඒ හැඟීම උඩ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, සිංහල භාෂා පෙරමුණත්, ඒ වාගේම දැනට කම්කරු හෝ ධීවර ඇමති පදවිය දරණ ඇමතිතුමාගෙ විප්ලවකාරී සම සමාජ පක්ෂයත් යන පක්ෂ තුන එකතු වී මහජන එක්සත් පෙරමුණ පිහිටුවා ගත්ත. අපේ අධ්‍යාපන ඇමතිතුමත් ඒ අවස්ථාවේදී ඊට සම්බන්ධ වුණා.

**ගරු මන්ත්‍රීවරයෙක්**

*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*

(An hon. Member)

ප්‍රශ්නයක් තිබෙනවා නම් අහනවා මිස කථාවක් පවත්වන්න වුවමනාවක් තිබෙනවද මේ වෙලාවෙ?



**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

There is nothing to prevent him from speaking.

**සෝමවීර චන්ද්‍රසිරි මයා.**

*(திரு. சோமவீர சந்திரசிறி)*

(Mr. Somaweera Chandrasiri)

ඒ අවස්ථාවේදී අප ඇති කර ගත් ඒ භාෂා පෙරමුණ කිසිම ප්‍රචණ්ඩ ක්‍රියාවක යෙදුණේ නැහැ. ඊට පසු කාලයකදී සම්පූර්ණයෙන්ම වාගේ නිශ්ශබ්දව සිට, දැන් සිංහල භාෂාවට පහර වැදීගෙන එන නිසාත් සිංහල ජාතියට පහර වැදීගෙන එන නිසාත් සිංහල සාහිත්‍යයට පහර වැදීගෙන එන නිසාත් නැවත වරක් ඒ සිංහල භාෂා පෙරමුණ අප ප්‍රාණවත් කර අපේ සිංහල ජාතියේ, අපේ සිංහල භාෂාවේ, අපේ සිංහල සාහිත්‍යයේ ආරක්ෂාව පිණිස ක්‍රියා කිරීම සඳහා රට පුරා විසිරී සිටින මහජනයාට අපගේ දුක්ගැනවිල්ල ප්‍රකාශ කිරීමක් සමග සිංහල ජාතියට සේවය කළ, සිංහල භාෂාවට සේවය කළ, සිංහල සාහිත්‍යයට සේවය කළ විද්වතුන්ගේත්, පඬිවරුන්ගේත් ප්‍රතිමා අරගෙන ඒවා ප්‍රදර්ශනය කරමින් අනුරාධපුරයේ ශුද්ධ භූමිය කරා පෙරහැරකින් ගමන් කිරීමට අප වැඩ කටයුතු පිළියෙල කළා. ඒ පෙරහැරට අවසරය පතා අප ලීවේ මෙසේයි:

" පොලිස්පතිතුමා,

පොලිස්පති කාර්යාලයය,

කොළඹ.

ගරු පොලිස්පතිතුමනි,

**සංස්කෘතික පෙරහැරක් සඳහා අවසර ඉල්ලීමයි**

සිංහල භාෂාව, සාහිත්‍යය හා කලාව වෙනුවෙන් දිවි කැප කළ සිංහල පඬිවරුන්ගේ, සාහිත්‍යධරයන්ගේ හා සිංහල කවීන්ගේ ගුණ සිහි කරන සංස්කෘතික පෙරහැරක් පැවැත්වීමට සිංහල භාෂා පෙරමුණ දැන් කටයුතු යොදා ඇති හෙයින් එය පැවැත්වීමට මෙයින් ඔබගේ අවසරය පතමි.

මෙම මෝටෝරිය පෙරහැර ලබන නොවැම්බර් මස 4 වැනි දින උදේ 6ට කොළඹ ගාලු මුවදොර පිටියෙන් පිටත් වී සවස 5 ට අනුරාධපුර ශුද්ධ නගරයට වන්දනාමාන සඳහා ළඟා වේ.

භාෂාව සහ සාහිත්‍යය වෙනුවෙන් සේවය කළ හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි, වැලිවිටියේ සෝරත නාහිමි, ශ්‍රීමත් ඩී. බී. ජයතිලක, කුමාරතුංග මුනිදාස,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පියදස සිරිසේන ආදී පඬිවරුන්ගේ ඡායාරූප සටහන්ද රැගෙන යන මේ පෙරහැරේ ප්‍රයෝජනය සඳහා ශබ්ද විකාශන (ලවුඩ් ස්පීකර්) යන්ත්‍රයක් 4 ශ්‍රී 1049 දරණ රථයේ සවිකොට පාවිච්චි කිරීම වද මෙයින් අවසරය දෙනු මැනැවි.

ගාලු මුවදොරින් පිටත් වන මෙම පෙරහැර නුවර පාර දිගේ ගොස් අඹේපුස්සෙන් හැරී, කුරුණෑගල හරහා අනුරාධපුරයට ළඟා වේ."

මේ අවසර පත්‍රය ඉල්ලීම උඩ පොලීසිය විසින් සිරිත් ප්‍රකාර පරීක්ෂණ ආදිය පැවැත්වීමෙන් පසු පොලිස්පතිතුමා විසින් අපට අප ඉල්ලූ ඒ අවසර පත්‍රය දෙන්නට යෙදුණා. ඒ අවසර පත්‍රය ඔක්තෝබර් මාසයේ 31 වැනිදා අපට මේ විධියේ ලිය විල්ලකින් දෙන්නට යෙදුණා :

"මෙහි පහත අත්සන් කරන මා විසින් පොලිස් ආඥාපණතේ 53 වැනි පරිච්ඡේදය 80 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් අවසර දෙනු ලැබේ.

අත්සන : ..............................

පොලිස් අධිකාරි

1966 ඔක්තෝබර් 31 දා,
පොලිස් මූලස්ථානයේදිය "

ඔය කොටසට ඉහලින් තිබෙන්නේ ශබ්ද විකාශන යන්ත්‍ර ආදිය සඳහා දෙන බලපත්‍රය වලංගු වන පාරතොට, කාල වේලාව, රථවාහන ආදිය පිළිබඳ විස්තර යයි.

ඊළඟට නොවැම්බර් මාසයේ 1 වැනිදා අපට තවත් ලියුමක් ලැබුණා. ඒ ලියම නත් දන් මම කියවන්නම් :

"සෝමවීර චන්ද්‍රසිරි මයා.,
ගරු සභාපති,
සිංහල භාෂා පෙරමුණ,
29, දේවානම්පියතිස්ස මාවත,
කොළඹ.

මහත්මයාණෙනි,

**සංස්කෘතික පෙරහැරක් සඳහා අවසර ඉල්ලීම**

1966 නොවැම්බර් මස 4 වැනි දින ගාලු මුවදොර පිටියේ සිට අනුරාධපුරය දක්වා මොටෝරිය පෙරහැරක් පැවැත්වීම සඳහා වූ ඔබගේ 66.10.16 වැනි දින දරණ ඉල්ලුම් පත්‍රය සම්බන්ධවයි.

2. නියෝජ්‍ය පොලිස්පති, ඊ. එල්. අබේගුණවර්ධන වන මම, පොලිස් ආඥාපනතේ 77 (3) වගන්තිය යටතේ ක්‍රියා කරමින්, යෝජිත පෙරහැර පවත්වා ගෙන යෑම තහනම් කරමි.

3. පිළිවෙළින්, අංක 4 ශ්‍රී 1049 සහ ඊ. ඇන්. 992 දරණ කාර් රථ වෙනුවෙන් නිකුත් කරන ලද අංක 460/67 සහ 461/67 දරණ ශබ්දවාහිනී බලපත්‍ර ඉවත් කර ගන්නා ලද බවද සලකනු මැනවි.

මේ වගට,

කීකරු සේවක,

ඊ. ඇල්. අබේගුණවර්ධන,

නියෝජ්‍ය පොලිස්පති (උ.දි.) "

මේ නිසා අපට ඉතාමත්ම බලවත් කර දරයකට මුහුණ දෙන්නට සිදු වුණා. ඒ නිසා මේ කාරණය ගැන සඳහන් කරන්නේ කනගාටුවෙනුයි. ඔක්තෝබර් 31 වැනිදා අපට අවසර පත්‍රය දී ඊළඟට නොවැම්බර් මස 1 වැනිදා නැවත එම අවසර පත්‍රය අවලංගු කිරීමට යෙදූ වැඩ පිළිවෙළ ගැන අපට කියන්නට තිබෙන්නේ එය එක්සත් ජාතික පක්ෂයේ නින්දිත බල වේගයක උපක්‍රමශීලී වැඩ පිළිවෙළක් කරණකොටගෙන කරන ලද්දක් බවයි. එය අප මේ මොහොතේ පැහැදිලි ලෙස කියා සිටිනව.

අප පෙරහැරක් යනවට භීතියක් තමන්ගේ සිත් තුළ ඇති වුණා නම්, ඒ අය අපේ පෙරහැරක් යාම ගැන භීතියක් ඇති කර ගත්තා නම්, ඒ උදවිය භීතියට පත් වුණා නම්, කොන්ද පණ නැත්නම් මිස මේ රටේ අගමැතිවරයා වශයෙන් අපේ අගමැතිවරයා විසින් මීට වඩා වෙනස් පියවරක් ගෙන ඒ පෙරහැර මුළුමනින්ම අපට යන්න නොදී කල් තබාම නැවැත්විය යුතුව තිබුණා. එහෙත් අප ඉල්ලූ අවසරය අපට දීමෙන් පසු යම් යම් උපක්‍රම යොදා මෙසේ කිරීම ගැන අප කනගාටු වෙනව. ෆෙඩරල් පක්ෂයට අයිති එක්තරා පත්‍රයක ප්‍රකාශයක් කර තිබුණා. "ද බ්ලූ ප්‍රින්ට් ෆෝ මර්ඩර්"—"The Blue Print for Murder"—යනුවෙන්. මේ විධියට අපට චෝදනා කර තිබෙනව. මේ භාෂා පෙරමුණ මිනීමරුවන්ය කියන එකයි කියැවෙන්නෙ. එක්සත් ජාතික පක්ෂයේ පත්තර මාගීයෙන් හා ෆෙඩරල්කාරයින්ගේ පත්තර මාගීයෙන් මේ විධියේ ප්‍රකාශ ප්‍රසිද්ධ කර අන්තිමට උපක්‍රමශීලිව ක්‍රියා කෙරෙව්වා. නොවැම්බර් 1 වැනි දා එක්සත් ජාතික පක්ෂයේ අය ප්‍රවෘත්ති පත්‍රවලට නිවේදනයක් කළා නොවැම්බර් 4 වැනිදා උදේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෝමවීර චන්ද්‍රසිරි මයා.]

9 ට විහාරමහාදේවී උද්‍යානයෙන් පිටත් වී ඔවුනුත් භාෂා පෙරහැරක් යනවාය කියා. එයත් කළේ එක්සත් ජාතික පක්ෂයේ පෙන්දන් ටික දෙනෙක් එක් වී ඔවුන්ට ඕනෑ විධියට අවසර පත්‍රය අවලංගු කර වීමට අගමැතිතුමාගේ අවධානය වැරදි පැත්තට යොමු කරවීම පිණිසයි. ඒ අනුව ඔවුන්ගේ ඒ බලතල උඩ, ඔවුන්ගේ ඒ නින්දිත ප්‍රයත්නය උඩ, අගමැතිතුමා විසින් අපේ බලපත්‍රය අවලංගු කිරීමෙන් කළේ මේ රටේ සිංහල ජනතාවට බලවත් අපරාධයක්ය කියා ප්‍රකාශ කරන්නට අපට සිදුවී තිබෙනව. සිංහල ජාතියට, සිංහල භාෂාවට, මෙවැනි භයානක යුගයක් උදාවූ අවස්ථාවක අපේ රටේ ජාතික කවීන්ගේ, ජාතික සාහිත්‍යධරයන්ගේ හා පඬිවරුන් ගේ ඡායාරූපත් අරගෙන අනුරාධපුරයට යෑම සඳහා පොලිස්පතිතුමා විසින් දී තිබුණු බලපත්‍රය අවලංගු කිරීමට කැබිනට් මණ්ඩලය රැස් කර තීරණයක් ගත්තේ මොන හේතුවක් නිසාද කියා මා අගමැති තුමාගෙන් ප්‍රශ්න කරනව.

අද අපි ජීවත් වන්නේ භයානක තැන කයි. එදා සිටි පියදාස සිරිසේන, අනගාරික ධර්මපාල, එෆ්. ආර්. සේනානායක ආදීන් අද සිටියා නම් ඔවුන්ව අත් අඩංගුවට ගන් නයි සිදු වන්නෙ. සිංහල ජාතිය ගැන, සිංහල භාෂාව ගැන, සිංහල මනුෂ්‍යයින් ගැන කථා කිරීම මහා භයානක අපරාධ යක් හැටියට සලකා ඔවුන් දුටු තැන අල්ලා හිරබාරයට ගැනීමට බලතල පොලිසි යට පවරා තිබෙන බව අද "දිනමිණ" පත්‍ර යේ පළ වී තිබුණා. ඒ ප්‍රශ්නයත් මා ගරු අගමැතිතුමා ඉදිරියේ තබනව. මේ අන්ද මට අපේ සිංහල ජාතියට විනා කිරීමට එතුමා මොන විධියේ වරමකින් බලය ලබා ගෙන තිබෙනවාද කියා මා මේ අවස්ථාවේ දී ප්‍රශ්න කරන්න කැමතියි.

අ. භා. 7.20

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය සහ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence and External Affairs, and Minister of Planning and Economic Affairs) :

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ගෙනයන අපක්ෂපාත ප්‍රතිපත්තියට විරුඩ ව යුද්ධායුධ රැගත් නැවක් ලංකාවේ වරා යක සිට දකුණු වියට්නාමයට ගියා දැයි යටි යන්තොට ගරු මන්ත්‍රීතුමා මගෙන් ප්‍රශ්න කළා. ඒ කරුණ ගැන මා සෝදිසි කර බැලුව. දැනට ලැබී තිබෙන කරුණුවල හැටි යට නම් එවැන්නක් සිදු වී නැහැ. එහෙත් තව දුරටත් හෙටත් මේ ගැන සෝදිසි කර බැලීමට මා බලාපොරොත්තු වෙනව. එමෙන්ම එවැනි පහසුකමක් ලබා දීමට අපේ කිසිම අදහසක් නැහැ.

කැස්බෑවේ ගරු මන්ත්‍රීතුමා ලොකු කථා වක් පවත්වා මගෙන් ලොකු ප්‍රශ්නයක් අසන්නට යෙදුණා. කොන්ද පණ නැති අගමැතිතුමෙක් යයි කිව්ව. මගේ කොන්ද පණ නැත්නම් නැගිටින්ටත් අමාරුයි; පිළිතුරු දෙන්නත් අමාරුයි. මගේ කොන්ද කෙසේ වෙතත්, මා එකක් කියන්න කැමතියි. එතුමා සඳහන් කළ ඉල්ලීම නම් සම්පූර්ණ සත්‍යයක්, භාෂා පෙරමුණක් වෙනුවෙන් කැස්බෑවේ මන්ත්‍රී තුමා විසින් සංස්කෘතික රිය පෙරහැරක් අනුරාධපුරයට ගමන් කිරීම සඳහා පොලිසි යෙන් අවසර පත්‍රයක් ඉල්ලා තිබුණා.—Cultural motorcade—කිසිම බාධාවක් නැතිව එයට අවසරයක් දී තිබුණ. ඉන් පසු මේ මාසයේ 1 වන දින වැඩ වර්ජන යක් ඇතිවුණු බව තමුන්නාන්සෙ දන් නව ඇති. [බාධා කිරීමක්] වෘත්තීය සංගම් වැඩ වර්ජනය. ඒ නිසා පොලීසියෙ විශාල පිරිසක් කොළඹ නගර යේ සාමය ආරක්ෂා කිරීම පිණිස යොද වන්න අපට සිදුවුණා. ඒ හේතුවෙන් මේ කියන භාෂා පෙරමුණ ආරක්ෂා කිරීම සඳහා—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සෝමවීර චන්ද්‍රසිරි මයා.**
*(திரு. சோமவீர சந்திரசிறி)*
(Mr. Somaweera Chandrasiri)

අපි ආරක්ෂාවක් ඉල්ලුවෙ නැහැ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

භාෂා පෙරමුණ මගින් අනිකුත් උදවියට සිදු විය හැකි හිරිහැරවලින් ඒ උදවිය ආරක්ෂා කිරීම සඳහාත් කොළඹ සිට අනුරාධපුරය දක්වා පොලිස් හමුදාව යොදවන්න අමාරු නිසා එම අවසරය දීම අවලංගු කරන්න සිදු වුණා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ගරු අගමැතිතුමා දඹුල්ල හරහා යන විට විශාල පොලිස් හමුදාවක් හිටිය.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

මොකක්ද ?

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

නුවර සිට කැකිරාව දක්වා යන විට.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

මම නුවර සිට කැකිරාවට යන විට ඒ කියන අන්දමට පොලිසිය සිටියෙ නැහැ. ඒ මන්ත්‍රීතුමාට කොයි විදියට පෙනෙනවද කියන්න මම දන්නෙ නැහැ. සමහරවිට එතුමාට එක දෙක වෙලා පෙනෙනවද දන්නෙ නැහැ. මම දඹුල්ලෙදී දුටුව, පොලීසියෙ එක්කෙනෙක්. ඒවගෙම කැකිරාවෙදිත් එක්කෙනෙක් දෙන්නෙක් දුටුව. ඒ පොලිස් හමුදුව නොවෙයි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ඔබ යනකොට සිය ගණනක් හිටිය.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

මම හිතනව තමුන්නාන්සෙගෙ කණ්නාඩියෙ සුළු වරදක් තිබෙනවය කියා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

මිනිසුන් දහස් ගණනක් වුවත් එක්ක ඇවිත් මට පුළුවනි, ඒ බව ඔප්පු කරන්ට.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

මගෙ කණ්නාඩිය හදන මිනිහ බොහොම හොඳයි. වුවමනානම් එයාගෙ නම දෙන්නම්. [බාධා කිරීම්] කරුණාකර වාඩි වෙන්න. මමයි කතා කරන්නෙ. තමුන්නාන්සෙ ලොකු කතාවක් කරල දැන් අවසාන වෙලයි තිබෙන්නෙ. මේ අවස්ථාවෙදී කතා දෙකක් පවත්වන සිරිතක් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

ඒකයි, සංස්කෘතිය !

**සෝමවීර චන්ද්‍රසිරි මයා.**
*(திரு. சோமவீர சந்திரசிறி)*
(Mr. Somaweera Chandrasiri)

දෙකම එකසැරේ කරන්නෙ. [බාධා කිරීම්]

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்ளி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

තමුන්නාන්සෙ කිප සැරයක් කරන බව මම හොඳින් දන්නව. [බාධා කිරීම්] ඒවට විශේෂ ස්ථානත් තියාගෙන සිටින බව මම දන්නව. ඔක තමයි සංස්කෘතිය ! [බාධා කිරීම්] එම හේතු නිසා ඒ සංස්කෘතික රිය පෙරහැර—cultural motorcade—තහනම් කරන්ට සිදු වුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I wish to have notice of the question that was asked of me.—[බාධා කිරීම්]

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න (සමාජ සේවා ඇමති)**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன— சமூக சேவை அமைச்சர்)*
(The Hon. N. H. A. M. Karunaratne—Minister of Social Services)

ගංවතුර ආධාර සම්බන්ධව ප්‍රශ්න කළා. ගංවතුරින් අනාථ වූවන්ට අපි බොහොම ඉක්මණින් සෑම ආධාරයක්ම දුන්න. ඒ පිළිබඳව පැමිණිලි හුඟක් අඩුයි. රත්නපුර දිස්ත්‍රික්කයෙ පවුල් 3,000ක් පමණ අනාථ වුණා. 1966.9.26 වන දින සිට 1966.10.2 වන දින දක්වා ඒ අයට කෑම පාර්සල් 33,671 ක් බෙදා දී තිබෙනව, ඒජන්තතුමා මාර්ගයෙන්. අමු ද්‍රව්‍ය 42,088 දෙනෙකුට බෙදා දී තිබෙනව. විශෙෂයෙන් කුලී ගෙවල සිටින අයට අපි ආධාර දුන්නෙ ඒ ඒ අවස්ථාවට අනුවයි. නමුත් ගෙවල් සෑදීම සම්බන්ධව මා තමුන්නාන්සේට කරුණක් මතක් කරන්න කැමතියි. ගෙයක් කුලියට අරන් සිටින කෙනකුගෙ ගෙය හදා දුන්නහම එයින් ප්‍රයෝජනය ලැබෙන්නෙ ගේ අයිතිකාරයටයි. ආණ්ඩුවෙ මුදලින් ගේ හදා දුන්නහම කුලිය කැපීමක් කෙරෙන්නෙ නෑ. ගෙවල් අයිතිකාරය නියම කුලිය ගන්නව. මේකෙ නීතියක් තියෙනව. මුදල කුලියෙන් කපා ගන්න කුලී කාරය කැමැත්ත දුන්නොත් අපි ඕනෑම වෙලාවක එය කරනව. එසේ නොකර තිබෙන අවස්ථාවක් තියෙනව නම් කරුණා කර ඉදිරිපත් කරන්න.

බලහත්කාරයෙන් ඉඩම්වල පදිංචි වී සිටින අයට ගෙවල් හදා ගන්න දෙන සිරිතක් නෑ. නමුත් ඒ අයටත් තාවකාලික සහන සෑම එකක්ම අපි දී තිබෙනව. යම් අතපසුවක් වී තිබෙනව නම් ඒ පිළිබඳ ලැයිස්තුවක් ඉදිරිපත් කරන ලෙස විරුද්ධ පක්ෂයෙන් ආණ්ඩු පක්ෂයෙන් ගරු මන්ත්‍රී වරුන් සියලු දෙනාටම මතක් කරනව. තවම කාල සීමාව තිබෙනව. එසේ ඉදිරිපත් කරන ඕනෑම අවස්ථාවක ඒ ගැන විශෙෂ පරීක්ෂාවක් කර සහනාධාර සලසන්න කැමතියි.

ඊළඟට පෝර්ම කොළ පිරවීම ගැන ප්‍රශ්නයක් ඉදිරිපත් වුණා. එය කරන්නෙ සමාජ සේවා දෙපාර්තමේන්තුවෙ අයයි. සමහර විට, ඉගෙනගත් ළමයින් හේම සිටින තැන්වල අය ඔවුන් ලවාත් එය කරවනව ඇති. නමුත් ප්‍රතිපත්තියක් වශයෙන් සමාජ සේවා දෙපාර්තමේන්තුවෙ නිලධාරීනුයි සෑම දෙයක්ම කරන්නෙ.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 7.27 ට 1966 නොවැම්බර් 9 වන බදාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.

அதன்படி சபை பி.ப. 7.27 க்கு, 1966 நவம்பர் 9, புதன்கிழமை மு. ப. 10 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.

*Adjourned accordingly at 7.27 P.M. until 10 A.M. on Wednesday, 9th November, 1966.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6 කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500, Colombo 1.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org